**සංක්ෂේපය**

ජනසංඛ්‍යාවේ වයස්ගත වීමේ ක්‍රියාවලිය ජනසංඛ්‍යා වර්ධනයේ අභ්‍යන්තර ප්‍රතිඵලයකි. එනම් ජනසංඛ්‍යාව වයස්ගත වීම සාඵල්‍යතාව පහළයාම සහ පහළ මර්ත්‍යතා මට්ටම හේතුවෙන් ඇතිවන ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්තියේ අත්‍යන්තයයි. මෙම තත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව සංවර්ධිත රටවල් හා සම මට්ටමකට ළඟා වී ඇත. එහෙත් ශ්‍රී ලංකාව ප්‍රජා විද්‍යාත්මක වශයෙන් වර්තමානය වන විට ජනසංඛ්‍යාව වයස්ගත වීම හා සම්බන්ධ ගැටළු රාශියකට මැදි වී සිටී. මෙම අධ්‍යනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ වයස්ගත ජන සංඛ්‍යාව හේතුවෙන් ඔවුන් රැකබලා ගන්නා අයටත් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ක්‍රියාවලියටත් මෙම පිරිස බලපානා ආකාරය හැඳින ගැනීමය. ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් ග්‍රාම නිළධාරී කොට්ඨාශ පහක් ඇසුරින් කරන ලද මෙම අධ්‍යයනය තුළින් ජනසංඛ්‍යාව වයස්ගත වීම නිසා ඔවුන් රැක ගන්නා පවුල් සාමාජිකයින්, ආයතනික රැකවරණය සපයන්නන් සේම සමස්ත සමාජ, ආර්ථිකයම විවිධාකාර ගැටළුවලට මුහුණ දෙන බව අනාවරණය විය. විස්තෘත පවුල් බිඳවැටීම, න්‍යෂ්ටික පවුල් ඇති වීම, පවුලක සිටින දරුවන් ගණන අඩු වීම, ස්ත්‍රීන් හා පුරුෂයින් යන දෙපාර්ශවයේම ශ්‍රම හමුදා සහභාගීත්වය ඉහළ යාම හා සංක්‍රමණය, අඩු ආදායම් වැනි විසංවිධිත බලපෑම් නිසා කුටුම්භයකට වයස්ගත වූවන් රැකබලා ගැනීම ගැටළුවක්ව පවතී. ඒ අනුව වර්තමානය වන විට ආයතනික රැකවරණය එනම් මහලු නිවාස පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් සිටී. ජන සංඛ්‍යාව වියපත් වීම ආශ්‍රිතව විශේෂයෙන් දිළිඳු කුටුම්භවලට ඔවුන් රැකබලා ගැනීම අපහසු වී ඇත. තවද සමාජීය වශයෙන් බැලූකළ කුටුම්භ තුළ විවිධ ප්‍රශ්න ඇත. ආර්ථිකමය වශයෙන් ගත්කළ රජයකට විශ්‍රාම වැටුප් අර්ථසාදක අරමුදල් වැඩි වශයෙන් ගෙවීමට සිදුවී ඇත.

***මුඛ්‍ය පදඃ*** *කුටුම්භ, ජනසංඛ්‍යාව, රැකබලා ගැනීම, වයස්ගතවීම*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, lakshikadulanjali995@gmail.com

# ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය ආර්ථිකයට ඇති කරන බලපෑම

එච්. එල්. ඒ. එම්. සෙව්වන්දි[1]

**සංක්ෂේපය**

ජනගහන වර්ධනය ලෝක ප්‍රජාව හමුවේ පවතින ප්‍රධාන ගැටලුවකි. මේ සඳහා සාක්ෂරතාවය අඩු මට්ටමක පැවතීම, දුප්පත්කම ඉහල යාම, ආගමික බලපෑම, උපත් පාලන ක්‍රම භාවිත නොකිරීම ආදිය හේතු වී තිබේ. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය 1881-1963 කාලය දක්වා ක්‍රමිකව සිදු වී තිබේ. නමුත් 1963න් පසුව ජනගහන වර්ධන අනුපාතය ක්‍රමයෙන් අඩු වී වර්ථමානය වන විට 1.1% දක්වා වැඩි වී තිබේ. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක ජනගහන වර්ධනය ආර්ථිකයට ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යනය මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මෙම අධ්‍යනයට අදාළ 2000-2017 දක්වා දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා හා මහ බැංකු වාර්තා ඇසුරින් ද්විතික දත්ත ලෙස ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සිදු කිරීමට වගු, ප්‍රස්තාර, සහසම්බන්ධතාවය ආදිය භාවිතා කර ඇත. දත්ත විශ්ලේෂණයට අනුව එලඹිය හැකි නිගමනය වන්නේ ජනගහන වර්ධනය රටේ ආර්ථික වර්ධනය කෙරෙහි ඍණාත්මක බලපෑමක් එල්ල කරන බවයි.

***මුඛ්‍ය පදඃ*** *ආර්ථිකය, ජනගහන වර්ධනය, බලපෑම, ශ්‍රී ලංකාව*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sewwandimahesha123@gmail.com

# දෙමාපියන්ගේ විදේශගතවීම ළමා අපයෝජනය කෙරෙහි සිදු කරන බලපෑම

ඩී. එම්. සි. දිසානායක[1]

## සංක්ෂේපය

ළමා අපහරණය නැතහොත් ළමා අපයෝජනය වූ කලී ලාංකික ජන සමාජය විෂයෙහි උද්ගත වී ඇති සංකීර්ණ සමාජ ගැටළුවකි. දෙමාපියන් විදේශගත වූ පවුල් ආශ්‍රිතව ළමා අපයෝජන සිද්ධීන් ක්‍රමිකව වාර්තා වීමේ ප්‍රගතියත් සමඟ මෙම පර්යේෂණය කාලෝචිත මෙන්ම ප්‍රායෝගික වූවක් ලෙස හැඳින්විය හැකිය. මේ අනුව දෙමාපියන්ගේ විදේශගතවීම ළමා අපයෝජනය කෙරෙහි බලපෑම් කරන්නේ ද? යන්න පර්යේෂණයේ ගැටළුව වේ. මෙහි මුඛ්‍ය පරමාර්ථය වශයෙන් උපයුක්ත කරගනු ලැබුවේ දෙමාපියන්ගේ විදේශගතවීම හා ළමා අපයෝජනය අතර ඇති සම්බන්ධය කෙබඳුදැයි අවබෝධ කරගැනීමයි. ළමයින් කෙරෙහි ඇති කරන බලපෑම්වල ස්වරූපය හඳුනා ගැනීම, දෙමාපියන්ගේ විදේශගතවීම සඳහා බලපාන සමාජ ආර්ථික පසුබිම හඳුනා ගැනීම හා ළමයින් ඇතිකර ගන්නා ඍණාත්මක ප්‍රතිවිපාක අවම කරගැනීම සඳහා උචිත ක්‍රමෝපායන් හඳුන්වාදීම මෙම පර්යේෂණයේ අරමුණු විය. පර්යේෂණ ක්‍රමවේදය ලෙස සිද්ධි අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරන ලදී. මෙම ක්‍රමවේදය ඔස්සේ ළමා අපයෝජනය කෙරෙහි බලපාන සමාජ සාධක හඳුනාගෙන එම සාධක වෙත දෙමාපියන්ගේ විදේශගතවීම කොතරම් බලපෑමක් කර ඇතිද යන්න තහවුරු කරමින් පොදු සාමාන්‍යකරණයක් කර ඇත. පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත යන ද්විත්යම යොදා ගැණුනු අතර ප්‍රශ්නාවලී හා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා යන ශිල්ප ක්‍රමයන් මඟින් ප්‍රාථමික දත්ත රැස් කිරීම සිදුකර ඇත. නියැදිය වශයෙන් අසම්භාවී හෙවත් නිස්සසම්භාවී ක්‍රමයේ සාරත නියැදිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාළව මව හෝ පියා විදේශගත වූ පවුල් ආශ්‍රිතව අපයෝජනයට ලක් වූ ළමයින් 50 ක නියැදියක් තෝරා ගන්නා ලදී. නියැදියෙන් 78% කගේ අපයෝජන තත්වයන් සඳහා දෙමාපියන් දරුවන්ගෙන් දුරස් වීම හේතු වී ඇත. එනම් මව හෝ පියාගේ විදේශගතවීම ළමා අපයෝජනය කෙරෙහි ඍජු හේතු සාධකයක් වී ඇති බව නිගමනය කරගත හැකි විය. එමෙන්ම පවුලේ සමාජිකයන් හා ඥාතීන්ගෙන් ළමා අපයෝජන සිදුවීමේ ඉහළ ප්‍රවණතාවයක් පැවතීම, ළමා ආරක්ෂාව සඳහා පවතින ආයතනික ව්‍යුහයේ විධිමත්භාවයක් නොපැවතීම හා සිදුවන ළමා අපයෝජනවලින් බහුතරයක් නීතිය ඉදිරියේ වාර්තා නොවීම ආදිය ද අනාවරණය කරගත හැකි විය. මෙම සමාජ ගැටළුවට පිළියම් ලෙස ළමයින්ගේ අපයෝජන සම්බන්ධයෙන් ක්‍රියාත්මකවන නෛතික රාමුව යාවත්කාලීන කරමින් විධිමත් ලෙස පවත්වාගෙන යා යුතුය. ළමා අපයෝජනයන් සම්බන්ධව ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම හා මේ සඳහා ජාතික ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් ක්‍රියාකල යුතුය. එනම් දෙමාපියන්ගේ විදේශගතවීම හා ළමා අපයෝජනය යන විචල්‍යයන් හි ප්‍රතිජානාත්මක සම්බන්ධතාවයක් පවතින අතර එමඟින් සමාජ ප්‍රගමනය පසුගාමී කරයි.

***මුඛ්‍ය පද:*** *දෙමාපියන්ගේ විදේශගතවීම, ළමා අපයෝජනය, ළමයින්*

---

[1] සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, disanayaka9483@gmail.com

# ශ්‍රී ලාංකීය ජනසමාජය තුළ විවාහ වන වයස ඉහළ යාම කෙරෙහි පවතින සමාජ ආර්ථික බලපෑම්

එස්. ටී. ආර්. එල්. සිල්වා[1]

## සංක්ෂේපය

විවාහය යනු වර්තමානය වන විට පමණක් නොව අනාදිමත් කාලයක පටන් මිනිසාට අතිශය වැදගත් වූ ක්‍රියාවලියකි. එහෙත් අද වන විට මෙරට ජනගහනය හා විවාහ සංස්ථාව තුළ දක්නට ලැබෙන අභියෝගයක් ලෙස විවාහ වන වයස ඉහළ යාම දැක්විය හැකිය. වර්තමානය වන විට බොහෝ යුරෝපිය රටවල මෙන්ම ශ්‍රී ලංකාව වැනි ආසියාතික රටවලද විවාහ වන සාමාන්‍ය වයස ඉහළ ගොස් ඇත. වර්තමානය වන විට පුරුෂයෙකුගේ විවාහ වන සාමාන්‍ය වයස අවුරුදු 28.3 දක්වාත් ස්ත්‍රියකගේ විවාහ වන සාමාන්‍ය වයස 24.7 දක්වාත් ඉහළ ගොස් ඇත. මෙය සංවර්ධිත රටක් වන ඇමෙරිකා එක්සත් ජනපදයේ පුද්ගලයන් විවාහ වන මධ්‍යන වයස් මට්ටමට ළඟා වීමකි. එමගින් ආර්ථික, සමාජීය, දේශපාලන වශයෙන් හිතකර මෙන්ම අහිතකර ප්‍රතිඵලද අත් වී ඇත. මේ හරහා ප්‍රධාන ගැටළුව බවට පත් වී ඇත්තේ ලාංකීය සමාජය තුළ විවාහ වන වයස ඉහල යාමට පවතින හේතු මොනවද යන්න සොයා බැලීමයි. අරමුණුද ඒ ඔස්සේ ගලායයි. එනම් විවාහ වන වයස ඉහළ යාම කෙරෙහි පවතින සමාජ ප්‍රවනතා හදුනා ගැනිම , විවාහ වන වයස ඉහළ යාමට සඳහා බටහිර රටවල බලපෑමක් පවතීදැයි හඳුනා ගැනිම, විවාහ වන වයස ඉහළ යාම සඳහා පවතින ආර්ථික බලපෑම් මෙන්ම විවාහ වන වයස ඉහළ යාම නිසා ඇතිවන වෙනත් ගැටලු සොයා බැලිමයි. මේ සඳහා තොරතුරු රැස් කිරීමට බස්නාහිර පළාත නියෝජනය කරමින් පුද්ගලයින් 250ක නියැදියක් භාවිතා කළ අතර, ක්‍රමවේදය වශයෙන් සම්මුඛ සාකච්චා ක්‍රමය හා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදී. මෙම පරීක්ෂණය හරහා අනාවරණය කර ගැනීමට හැකි වූයේ විවාහ වන වයස ඉහළ යාම කෙරෙහි පවතින ආසන්නතම හේතුව වන්නේ සාක්ෂරතාව ඉහළ යාම බවයි. එමෙන්ම සාර්ක් කලාපයේ රටවල් අතරින් අඩුම ප්‍රතිශතයක් සහිතව පුරුෂයන්ගේ විවාහ වීමේ ප්‍රවනතාවක් පවතින්නේ ශ්‍රී ලංකාවේ බවට සොයා ගැනීමට හැකි විය. විවාහ වන වයස ඉහළ යාම තවදුරටත් බලපෑම් කර ඇත්තේ ස්ත්‍රී පාර්ශවය කෙරෙහිය. විවාහ නොවී සිටීම මගින් තනි පුද්ගලයන්ට පමණක් නොව මුළු මහත් සමාජයටම බලපෑම් රැසක් සිදුවන බව සොයා ගැනීමට හැකිවිය. මෙම ප්‍රත්‍යක්ෂ කරගත්තා වූ නිගමන මත පිහිටා යෝජනා කළ හැක්කේ ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය දරුවන්ගේ වයස් මට්ටම මත ක්‍රමවත්ව සැකසිය යුතු බවයි. එමෙන්ම දරුවන්ව තවදුරටත් සමාජශීලි කිරීම, විවාහය පිළිබඳ සාවද්‍ය ආකල්ප තුරන් කිරීම මඟින් මෙම තත්වය මගහරවා ගැනීමට හැකිවන බව පෙන්වා දිය හැකිය.

***මුඛ්‍ය පදඃ*** *විවාහය, වයස ඉහළ යාම, සාක්ෂරතාව, බටහිර රටවල්, අධ්‍යාපනය*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ranushaisilva@gmail.com

# *ECONOMIC*

# *AND*

# *ECONOMIC DEVELOPMENT*

# The Determinants of the Balance of Payments Imbalance of Sri Lanka

K. K. T. Udayanga[1]

## ABSTRACT

Balance of Payment imbalance negatively affects to the external economic stability of Sri Lanka. Although the government has employed several strategies to manage the imbalance, those intentions have not been enough to sustain the Balance of Payment properly. This study is designed to focus on macroeconomic determinants influencing balance of payment imbalance (BOP) in comparison to Reserve Assets (RA) and Money Supply (MS). There are several types of theoretical approaches to be based on when doing academic studies on balance of payments. Theoretically, this research is based on the monetary approach for balance of payments. Searching the applicability of basic concepts of the monetary approach of BOP on Sri Lankan context was another objective of this research. This study covers the period from 1990 to 2017 and uses secondary time series data from the Central Bank of Sri Lanka. This study has adopted the Augmented Dickey Fuller (ADF) unit root method to test the order of integration of variables. Akaike Information Criterion has been used to determine the optimal lag length of each series. The Johansen Cointegration method is adopted to investigate the relationship between the variables and the effect of macroeconomic determinants on BOP imbalance. Vector Error Correction Model (VECM) has been adopted to determine the short run dynamics and long run adjustment of variables. These tests were conducted using STATA econometric software. Findings of the study reveal the long run causality running from Reserve Assets and Money Supply to BOP imbalance. Further, Reserve Assets affects positively when determining the BOP imbalance in short run as well. Research recommends policy makers and monetary authorities to maintain reserve assets effectively and to implement efficient reserve management framework for Sri Lanka. Further, this research suggests future researchers to analyse the impact of qualitative variables like political stability on BOP imbalance.

**Key words:** *Balance of Payments, Imbalance, Reserve Assets*

[1] Department of Economoics, University of Kelaniya, kktudayanga@gmail.com

# Tea Production in Sri Lanka

K. M. G. M. Dias[1]


## ABSTRACT

Tea production of Sri Lanka is one of the main income sources of the country. It is the fourth largest producer of tea in the world, and the second largest exporter. This industry is one of the country's main sources of foreign exchange for Sri Lanka and accounts for 2% of GDP, contributing over US $ 1.5 billion in 2013to the economy of Sri Lanka. The tea sector employs, directly or indirectly over one million people in Sri Lanka and 1995 directly employed 215,338 on tea plantation and estates. The central highlands of the country, low temperature climate throughout the year, annual rainfall and the level of humidity are more favorable geographical factors for production in high quality tea. The industry was introduced to the country in 1867 by James Taylor, the British planter who arrived in 1852. This study examines how current situation of Sri Lanka's tea industry. The main objectives of this study are to find out what are the current trends in tea industry prevailing at Sri Lanka, to find out how does tea affect to maximize the Gross Domestic Production and find out what the criteria that will deteriorate the trend of the tea market. Secondary data was used only for data acquisition in the study method. Secondary data will be collected mainly from tea institute, journals, text books, prior research reports. Also, it will be used Central Bank Reports. The data obtained were analyzed using descriptive analysis techniques. Furthermore, regression analysis will be used to see the relationship between tea exports earnings and Gross Domestic Production. This study confirms that Sri Lanka tea production for the period January-December 2018 reached 303,843 MT showing a decrease of 3,237 MT against the volume of 307,080 MT registered during the same period of 2017, Sri Lanka tea exports for the period January-December 2018 reached 282,363 MT against the volume of 288,984 MT registered for 2017 showing a decrease of 6,621 MT and decline in tea exports is a result of some external and internal factors.


***Key words:*** *Tea industry, tea production, exports, Gross Domestic Productin*

[1] Department of Social Statistics, University of Kelaniya, diasmanuri@gmail.com

# A Study of persons who deal with the banking system in Sri Lanka

K. D. Liyanage[1], K. M. G. M. Dias

## ABSTRACT

There are three major categories of institutions that are subject to licensing, regulation and supervision by the Central Bank in the public interest because they accept deposits from the general public. They are licensed commercial banks, licensed specialized banks and registered finance companies. There are 23 licensed commercial banks, of which, 11 are locally incorporated banks while the other 12 are local branches of foreign banks. They all have a total of 1,711 branches and other service outlets spread throughout the country. According to this study examined the find out whether there are more people in Sri Lanka looking at State Banks and Commercial Banks. The main objective of this study is to investigate the reasons for doing business with more Commercial Banks in Sri Lanka. The core objectives are Investigate whether there is a difference in the use of banks by the level of Education and Investigate whether there is a difference in the use of banks by the level of Income and Investigate whether there is a difference in the use of banks by the According to the nature of employment. The study was analysis sample size of 50 participants 25 who transactions with State Banks and 25 who transactions with Commercial Banks in Colombo District. According to the findings are there seems to be no difference between the state bank and commercial bank when it comes to in the level's investment and education. And people in Sri Lanka make extra savings with commercial banks. Finally, our conclusion is that in Sri Lanka people in excess deal with commercial banks in relation to the state banks.

***Key words:*** *Banks, Income, Education, Savings, Investments*

[1] Department of Social Statistics, University of Kelaniya, diasmanuri@gmail.com

# A study on the Impact of Micro credit on Rural Poverty in Sri Lanka (Special Reference to Galle District)

K. D. Liyanage[1]

## ABSTRACT

One of the most compelling challenges facing Sri Lanka is the problem of poverty. In the fight against poverty, micro credit has become and increasingly popular tool among other poverty alleviating program. Therefore, this study examined the Why do people borrow from micro finance institutions? In Sri Lanka. The sample study was conducted in accordance with the borrowers from Micro Finance Institutions in Nagoda Divisional Secretariat of Galle District. The specific objective was to access the what are the factors that make people borrow more from Micro Finance Institutions. The primary objective was to assess the impact of micro credit in rural poverty in Sri Lanka. Further, the economic and social impact of micro credit on rural poverty in Sri Lanka were assessed while, identifying the constraints that borrowers from Micro Finance Institutions in Nagoda Divisional Secretariat meet in accessing to micro credit facilities in Sri Lanka. The study was designed on income of the household, Assets, Housing condition, Human capital, Social capital and Empowerment. Structured questionnaires were used to collect information from the households. In addition, key informant discussions were held with Micro Finance Institutions Managers. The collected data were analyzed using descriptive statistics. In order to examine the relationship between poverty and related variables Linear Probability Model was tested. In the findings; the borrowers had utilized the loans for housing repairing and consumption instead of income generating activities; As well, Loss of enterprises, not having a market for products and law entrepreneur skills were the constraints for improving the enterprises. The study concludes that the micro credit plays a role in alleviating rural poverty marginally. Therefore, the study recommends enhancing the effectiveness of Micro Finance Institutions program with an in-depth consideration.

***Key words:*** *Micro credit, Micro Finance institutions, Economic and Social impact, Micro credit borrowers, poverty Alleviation*

[1] Department of Social Statistics, University of Kelaniya, hdilharaliyanage9651@gmail.com

# A study on Sri Lankan political and economic changes due to Bilateral relationships between Sri Lanka and China

R. M. D. H. Abeyrathne[1]

## ABSTRACT

Open economic reforms implemented after 1977 marks the first remarkable liberalisation effort in Sri Lanka. Consequently, Sri Lanka has signed bilateral agreements with 22 countries including China. However, a formal relationship between People's Republic of China and Sri Lanka started only after the rice- rubber pact in 1952. Diplomatic relationship between two countries started in 1957 and the first agreement was on Economic and Technical Cooperation signed in 1962 The major Chinese economic assistance was offered during the time period spanning from 2005 to 2015 under the United People's Freedom Alliance regime. At present, Hambantota port, Colombo Financial City project and infrastructure development projects covering the entire country are being constructed and maintained by Chinese financial aids and loans. However, this particular diplomatic relationship is doubted and criticised by many individuals in fear of probable upcoming political threats and economic challenges. This study focuses on examining the behaviour and trends of Chinese loan inflows for the time period of 2005 to 2018. Further, the incentives given to attract Chinese investments and the nature of China-Sri Lanka economic relationships will be thoroughly described in the study. Descriptive analysis method will be used depending on secondary data collected via central bank reports and World Bank reports. In 2017, China was the second highest exporter of Sri Lanka and sixth highest importer of Sri Lanka. China Sri Lanka relationships dating back to ancient times related to Buddhist cultural affairs and later developed into commercial and financial ties are expected to be grown into higher levels of political relationships which may result in strategic foreign plans.

***Key words:*** *Bilateral relationship, China, Open economic reforms*

[1] Department of Economics, University of Kelaniya, hasintha1995@gmail.com

# The Effects of Foreign Grants and Foreign Debt on the Economic Growth in Sri Lanka: An Ardl Bounds Test Approach

I. A. J. I. Arachchi[1]

## ABSTRACT

Foreign grants (FG) and foreign debt (FD) are important sources to finance the development program in developing countries. The relative impact of FD and FG on economic growth has not been examined in Asia including Sri Lankan context. The aim of the study is to examine the impact of FD and FG on economic growth in Sri Lanka. The analysis was carried out for the period 1977 to 2017 using the variables, Gross domestic product (GDP), economic openness (MX), FG and FD. The data were collected from the annual report of Central Bank and all these variables are in constant prices. The Phillips-Perron unit root test results show that some variables are stationary at level and some variables are stationary their first difference. The GDP was used as proxy for economic growth. The Autoregressive Distributed Lag (ARDL) Bounds test is employed to find out the long run equilibrium relationships between variables in the study. The ARDL bound test shows that there is a significant long run relationship between GDP and explanatory variables. FG affects GDP positively while FD does not affect statistically significantly in the long run. The results of error correction model estimation shows that the error correction term is significant and had negative sign which theoretically expected. The coefficient of the error correction term indicates that 23 percent of the disequilibrium error is corrected each year. This indicates that the response variable GDP moves towards long-run equilibrium path along with time. In the short run, FD and FG do not influence GDP significantly while LMX affects GDP significantly. Diagnostic tests attest that the results are robust. The CUSUM test confirms that the parameters are stable in the study period. In the Sri Lankan context, FG is favorable source compared to FD. FD has become a sensitive issue now in Sri Lanka as we need to large amount of repayment. Therefore, the government, policy makers need to design the policy regarding FD and FG considering the relative impacts of each variable.

***Keywords:*** *ARDL bound test, Foreign Grants, Foreign debts, Economic Growth, Sri Lanka*

[1]Department of Economics, University of Kelaniya, janakiimbulana6@gmail.com

# The Evolution of Export in Sri Lanka

H. A. T. Lakshika[1]

## ABSTRACT

An Export is a function of International trade. Exports are the goods and services produced in one country and purchased by residents of another country. Exports are a crucial component of a country's economy, as the sale of such goods adds to the producing nation's gross output. When considering about the Sri Lankan economy, Export is playing a major role with international trade. Since 1977, Sri Lankan closed economy had move to the open economy and to deals with the international trade. Sri Lanka's main export industries are Knit or crochet clothing, accessories, Clothing ,accessories (not knit or crochet), Coffee, tea, spices, Rubber, rubber articles, Ships, boats, Gems, precious metals, Machinery including computers, Electrical machinery, equipments, Fish, Other chemical goods. Considering about Export of Sri Lanka in last years, according to annual report of central bank, the country's export performance during the last four decades that have ensued has been disappointing. But in September of 2016, the exports in Sri Lanka increased 5.7 percent year-on-year to USD million. The object and research question of this explanation identify and discuss the evolution of export and how exports effect for the Sri Lankan economy. I referred secondary data such as Central bank reports, Magazines and Internet for this analysis.

***Key words:*** *Exports, Evolution, International Trade*

[1] Department of Economics, University of Kelaniya, tlakshika79@gmail.com

# Current Issues and Policies to Address Inefficiencies of Coconut Industry

R. M. D. H. Rathnayake[1]

## ABSTRACT

Coconut is one of the major plantation crops in Sri Lanka which accounts for approximately 12% of all agricultural produce in Sri Lanka. Total land area under cultivation is 395,000 hectares and about 2,500 million nuts are produced per year. According to the CRI forecast, the annual coconut yield for the year 2019 is 2828 million nuts (Sri Lanka Coconut Statistics 2017 Coconut Development Authority) and it is 10.% increase compared to the Annual National Coconut Production (ANCP) in year 2016 (2736 Mn. nuts). The coconut industry is an important source of foreign exchange, and an essential component of Sri Lankan cuisine, nutrition and rural livelihood. Coconut based products are from the Kernel, Shell, Husk, and fibber based. The main research problem of the study is although coconut production has increased significantly, the coconut processing industry has failed to absorb excess nuts. There is a rapid decline in price of coconut with this harvest and due to that coconut growers and coconut oil producers have experienced problems. Farm gate price of nuts has decreased significantly while reaching to a level where the price is less than the cost of production. This study is use both Primary and secondary data .The main tool that was used for data collection was questionnaire, and the data gathered from the Coconut Research Institute, Coconut Development Authority and Coconut Cultivation Board. Finally, Coconut Industry is hailed as the third largest net foreign exchange earner and one of the largest contributors towards the Gross Domestic Product of Our Nation. Coconut harvest is high this year so that the farm gate prices of a coconut has fallen. As there is no restriction on the export of coconuts, can be proposes to promote exports and Formulate a policy framework for the coconut industry of Sri Lanka to meet new challenges.

***Key Words:*** *Coconut Industry, Inefficiencies, Farm- Gate Price, Export Promotion*

[1] Ministry of Economic Reforms and Public Distribution, hansirathnayakermd@gmail.com

# The Dynamic Sectoral Growth Linkages: Evidence from Sri Lanka.

T. Sukirtha.T[1], Sivarajasingham. S, Balamurali. N

## ABSTRACT

An understanding of sectoral growth dynamics becomes more important for policy formulation in designing a balanced growth in the economy. This study attempts to examine the dynamic growth linkages among three major sectors; agriculture, industry and services of the Sri Lankan economy for the period 1960-2017. The variables used in this study are Agricultural GDP, Industrial GDP, Service GDP and Overall GDP. The data for the study are collected from the Central Bank Annual Report 2017. Graphical analysis including scatter plot, line graph, Confidence Ellipse and Nearest Neighbor fit are used to identify the basic features and the relationship between sectoral GDP series. Inter temporal correlation results show that there exists a high positive statistically significant correlation between all sectors GDP at 5 percent level. Unit root test results show that all GDP series are nonstationary. First difference of all log ($GDP_i$) series are stationary. Engle-Granger (EG) co-integration test using fully modified OLS estimation provides evidence of long run equilibrium relationship between sectors. The results from ECM shows that the coefficient of error correction terms are statistically significant and had expected sign (negative) for all models, all sectors are positively related significantly even in the Short run. The diagnostic test results indicate that the results are robust. Granger causality tests indicate that Agriculture and Industrial Sector Granger cause economic growth significantly. It is also noted that overall economic growth Granger cause agriculture sector GDP. The investigation of causality analysis among sectors show that service and agriculture sectors are having two-way Granger causal relationship in the short run. In addition, Service sector Granger cause Industrial sector while Industrial Sector Granger cause Agricultural sector significantly. In contrast, Error correction term coefficient Granger causality indicator (ECT) shows that there is a significant causal relationship among sectors in the long run. Results indicate that agriculture sector Granger cause other sectors significantly and is base for livelihood for more people. Therefore, government needs to support agriculture sector to have stable overall economic growth. Empirical results indicate that all sectors are interlinked. However, study need to promote all sectors in effective and stable ways.

***Keywords:*** *Causality, Cointegration, Growth linkages, Sectoral GDP dynamics*

[1] Department of Economics, University of Kelaniya, theivendraamsuki8@gmail.com

# ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය සඳහා කාන්තා කෘෂිකර්ම වැඩසටහන්වල දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්.

කේ. එම්. ජී. එම්. ඩයස්[1]

## සංක්ෂේපය

සමාජයේ කුඩාම ඒකකය ලෙස පවුල හඳුන්වන අතර එය ආර්ථික සහ සමාජීය වශයෙන් සවිබල ගැන්වීම මගින් රටේ සමස්ත ආර්ථික සහ මානව සංවර්ධනය ඉහළ නැංවිය හැකි ය. අතීතයේ සිටම ශ්‍රී ලාංකීය කාන්තාව ගෘහස්ථ පරිපාලනය සහ ආදායම් ඉපැයීමේ කාර්යය සමබරව පවත්වා ගනිමින් පවුල තුළ ආර්ථික සහ සමාජීය සහජීවනය පවත්වා ගැනීමට ප්‍රබල දායකත්වයක් සපයන අතර කෘෂිකාර්මික කාර්යන් වලද ඉදිරියෙන් සිටී. මෙම අධ්‍යනයේ ගැටළුව වන්නේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය සඳහා කාන්තා කෘෂිකර්ම වැඩසටහන්වල දායකත්වය කෙබඳු ආකාරයක් ගනීද යන්නයි. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ කාන්තා කෘෂිකර්ම ව්‍යාපෘති වැඩසටහනෙහි වර්තමාන ක්‍රියාකාරීත්වය, එහි බලපෑම් ඇගයීමට ලක් කිරීමත් එම වැඩසටහන් තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා එහි සාමාජිකාවන් මෙන්ම අදාළ නිලධාරීන් මුහුණ දෙන ගැටළු හා දුෂ්කරතාවන් හඳුනා ගැනීමත් ය. කාන්තා කෘෂිකර්ම ව්‍යාපෘති වැඩසටහනට අයත් සාමාජිකාවන්ගේ සමාජ ආර්ථික ලක්ෂණ අධ්‍යනය කිරීම, කාන්තා කෘෂිකර්ම ව්‍යාපෘති වැඩසටහනට හරහා සාමාජිකාවන්ට ලැබෙන පුහුණුවීම් හා වෙනත් ප්‍රතිලාභ හඳුනා ගැනීම, සමිති සාමාජිකාවන් විසින් පවත්වා ගෙන යනු ලබන ආදායම් උත්පාදන ක්‍රියාවන් හඳුනා ගැනීම හා ඒවා ගෘහස්ථ ජීවිතය කෙරෙහි බලපා ඇති ආකාරය අධ්‍යනය කිරීම, කාන්තා කෘෂිකර්ම වැඩසටහනට අයත් කාන්තාවන් හා නිලධාරීන් විසින් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සහ ඔවුන්ගේ යෝජනා විමසා බැලීම මෙහි උප අරමුණු වේ. මෙහි අධ්‍යන ප්‍රදේශය ලෙස ගාල්ල දිස්ත්‍රික්කය තෝරා ගත් අතර එහි කාන්තා ගොවි සමිති 10කින් අහඹු ලෙස ගොවි කාන්තාවන් 50 දෙනෙකු සමීක්ෂණයට ලක් කරන ලදී. එසේම අදාළ කෘෂිකාර්මික නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් දත්ත සහ තොරතුරු රැස් කර ගන්නා ලදී. එසේ රැස් කරන ලද දත්ත SPSS සංඛ්‍යාන ක්‍රමවේදයට අයත් සරල සංඛ්‍යාන ක්‍රම එනම් වගු හා ප්‍රස්තාර භාවිත කළ අතර ගුණාත්මක දත්ත විස්තරාත්මක ක්‍රමවේදයන් මගින් විශ්ලේෂණය කරන ලදී. වර්තමානයේ විශේෂ පුහුණුවක් සහිත නිලධාරීන්ගේ අඩුවක් පවතින බවත්, ස්වයං රැකියාවන්ට අවශ්‍ය පුහුණුව හා මූල්‍යමය සහයෝගීතාව නිසි පරිදි ලබා දීම ඵලදායක බව මෙම අධ්‍යනය තුළින් සොයා ගෙන ඇත.

***මූඛ්‍ය පද:*** *ගොවි කාන්තාවන්, ව්‍යවසායකයින්, කෘෂිකර්ම ව්‍යාප්ති, ගොවි කාන්තා සමිති*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, diasmanuri@gmail.com

# බෞද්ධ ආර්ථික දර්ශනයෙන් හෙළිවන නූතන ආර්ථික සංකල්ප සහ හැසිරීම් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යනයක්

ආර්. එම්. ඩී. එච්. අබේරත්න[1]

## සංක්ෂේපය

බෞද්ධාගම ප්‍රචලිත වූ ආසියාතික රටවල් වන ශ්‍රී ලංකාව, බුරුමය සහ ඉන්දුනීසියාව වැනි රටවල් තවමත් සංවර්ධනය වෙමින් පවතින රටවල් කාණ්ඩයෙහිලා සැලකේ. ඇතැම් විද්වතුන් ප්‍රකාශ කර සිටින්නේ බෞද්ධ ආගමික දර්ශනය අත්හැරීම පිළිබඳව සාකච්ඡා කරන බැවින් ආර්ථිකයේ ඇති ලාභය නම් සංකල්පය සමග ගැටුමක් ඇති කර ගන්නා බවයි. මේ නිසා බෞද්ධ දර්ශනයෙන් ආර්ථික දියුණුවට පිටුවහලක් නොලැබෙන්නේය යන්න බහුතර මතයයි. නමුත් බුදුරජාණන් වහන්සේ පුද්ගලයන්ගේ ආදායම කොටස් හතරකට බෙදා එය පරිහරණය කළ යුතු ආකාරය අනුශාසනා කොට තිබේ. වර්තමාන ආර්ථික වර්ධන ඉලක්ක සපුරා ගැනීමේදීත් වැඩි වැදගත්කමක් ගන්නේ ආයෝජනයි. ආයෝජන බිහිවීමට ඉතුරුම් ඉහල නැංවිය යුතුය යන්න බෞද්ධ දේශනාවෙන් සනාථ වේ. තවද ගිහි ජීවිතයේ දියුණුවට බලපාන කරුණු මෙන්ම පරිහානියට හේතුවන කරුණු කරණීය මෙත්ත, පරාභව, මහාසුදස්සන, මහා මංගල, චක්කවත්ති සිහනාද ආදී මූලාශ්‍රවල සඳහන් කොට ඇත්තේය. ආර්ථිකය හා සම්බන්ධයෙන් ගත්කළ උන්වහන්සේ දේශනා කළ මධ්‍යම ප්‍රතිපදාව තුළ අන්තර්ගත සම්මා ආජීව (යහපත් දිවි පැවැත්ම) යන කරුණ ඉතා වැදගත් වේ. එමගින් යහපත් ජීවන වෘත්තීන් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය. තවද වර්තමානයේ විධිමත් නෛතික අණපනත් හා සම්මුතීන් ඔස්සේ ක්‍රියාත්මක වන ආදායම කළමනාකරණය, බදු පැනවීම්, සේව්‍ය-සේවක සම්බන්ධතා කිනම් ආකාරයේ විය යුතුද සහ තිරසර සංවර්ධනය සඳහා වන මඟ පෙන්වීම් බුදුරජාණන් වහන්සේ විසින් වසර 2600ට පෙරදී පවා අනුශාසනා කොට ඇත්තේය. සංවර්ධනය යන්න රටින් රටට වෙනස්වන සංකල්පයක් වන්නේ සංවර්ධනය ඒ ඒ රටවල භූගෝලීය, දේශපාලනික සහ සමාජ සංස්කෘතික ලක්ෂණ හේතුවෙන් වෙනස්වීමට භාජනය වන බැවිනි. ඒ අනුව මේ වන විට සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය අත්පත් කර ගැනීමේදී භාවිත කරන ලද සංවර්ධන උපායමාර්ග ඊනියා රටවල් වලට ඵලදායි වූ තරමින්ම සංවර්ධනය වෙමින් පවතින බෞද්ධ ආගමික රටවල්වලට ඵලදායි නොවන්නට පුළුවන. මෙම අධ්‍යයනයේදී නූතන ආර්ථික සංකල්ප සහ බෞද්ධ ආර්ථික දර්ශනය අතර ඇති සමාන අසමානකම් පිළිබදව සංසන්දනාත්මක අධ්‍යයනයක් සඳහා බෞද්ධ ආර්ථික දර්ශනය පිළිබඳව ලියැවුණු පොත්පත්, සඟරා ආදී ද්විතීක මූලාශ්‍රයන් විමර්ශනය කර කරුණු ගොනු කරනු ලැබේ. මෑත කාලයේ දී බිහි වූ හරිත සංකල්පය පවා එකල පටන්ම බුදුරජාණන් වහන්සේගේ අවධානයට ලක් වී තිබුණු බවට සාධක පවතී. තිරසාර සංවර්ධනය කරා යන ගමනේදී බෞද්ධ ආර්ථික දර්ශනය තුළින් පිළියම් සෙවීම වඩාත් ඵලදායී වනු ඇත්තේ එබැවිනි.

***මුඛ්‍ය පදඃ*** *බෞද්ධ ආර්ථික දර්ශනය, තිරසාර සංවර්ධනය*

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනඅංශය, කැලණිය විශ්වවිද්‍යාලය, hasintha1995@gmail.com

# ශ්‍රී ලංකාවේ විදේශීය සෘජු ආයෝජන ගලා ඒමේ මෑතකාලීන උපනතීන් හා අභියෝග

එම්. පී. ඒ. මධුවන්ති[1], කේ. ඒ. එස්. පී. කුරුප්පුආරච්චි, එම්. ජී. ඒ. අපොන්සු, ආර්. එම්. ඩී. එච්. අබේරත්න

## සංක්ෂේපය

කිසියම් රටක ආයතනයක් හෝ පුද්ගලයෙකු ව්‍යාපාරික අරමුණු අපේක්ෂාවෙන් වෙනත් විදේශීය රටක මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීමට හෝ ව්‍යාපාරයක කොටස් මිලදී ගැනීමට හෝ ව්‍යාපාරයන් බිහි කිරීම සඳහා කරනු ලබන මූල්‍ය හෝ මූර්ත ප්‍රවාහ විදේශීය සෘජු ආයෝජන ලෙස හඳුන්වයි. විදේශ සෘජු ආයෝජනය කෙරෙහි බලපාන සාධක ලෙස වැටුප් අනුපාතය, ශ්‍රම කුසලතා, බදු අනුපාතය, ප්‍රවාහන සහ යටිතල පහසුකම්, ආර්ථිකයේ විශාලත්වය, රජයේ ස්ථාවරභාවය, රාජ්‍ය ප්‍රතිපත්තිවල නම්‍යශීලීභාවය යනාදිය දැක්විය හැකිය. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ඉතුරුම් ආයෝජන පරතරය, ආනයන අපනයන පරතරය පියවා ගැනීමට විදේශ සෘජු ආයෝජන වැදගත් වේ. මෑතකාලීනව ශ්‍රී ලංකාවේ විදේශ සෘජු ආයෝජන ගලා ඒමේ උපනතී හා අභියෝග සොයා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. මෙම අධ්‍යයනයට අදාල කාලශ්‍රේණි දත්ත රැස් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තා උපයෝගී කර ගන්නා ලදී. වගු, ප්‍රස්ථාර, රූප සටහන් මගින් දත්ත ඉදිරිපත් කරන ලදී. යුධමය තත්ත්වය නිමා වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ පැවති සාමකාමී ආර්ථික පරිසරය විදේශීය සෘජු ආයෝජන ගලා ඒම අභිප්‍රේරණයට ප්‍රබල සාධකයක් විය. ඒ අනුව 2012 වසරේ ජූලි මස ඇමරිකානු ඩොලර් මිලියන 201 වූ විදේශීය සෘජු ආයෝජන 2014 වර්ෂය වන විට ඇමරිකානු ඩොලර් මිලියන 386 දක්වා වර්ධනය විය. නමුත් 2015 වර්ෂයේ දී විදේශ සෘජු ආයෝජන ඇමරිකානු ඩොලර් මිලියන 105 දක්වා අඩු විය. 2016 වර්ෂයේ දී එය තවදුරටත් ඇමරිකානු ඩොලර් මිලියන 103 දක්වා අඩු විය. මීට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික ප්‍රතිපත්ති වෙනස්වීම හා චීනය සමග පැවති ආයෝජන ව්‍යාපෘතී රැසක් අඩපණ වීමයි. 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විදේශ සෘජු ආයෝජන ඇමරිකානු ඩොලර් බිලියන 1.63 දක්වා වර්ධනය විය. මෙසේ ඉහළ වර්ධනයක් අත්කර ගෙන ඇති ක්ෂේත්‍ර වන්නේ අපනයන ඉලක්ක කරගත් නිෂ්පාදන, සංචාරක හා තොරතුරු තාක්ෂණ, යටිතල පහසුකම් යන ක්ෂේත්‍රයි. ලංකාවට වැඩිම විදේශ සෘජු ආයෝජන පැමිණ ඇත්තේ චීනය, හොංකොං, ඉන්දියාව, සිංගප්පූරුව යන රටවලිනි. මෑතකාලීනව ලංකාවේ විදේශ සෘජු ආයෝජන සඳහා ඇති අභියෝග ජය ගැනීමට යටිතල පහසුකම් දියුණු කිරීම, ආයෝජකයන්ට හිතකර වාතාවරණයක් සැකසීමට කටයුතු කිරීම යෝජනා කළ හැකි ය. එමෙන්ම විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කරගත හැකි සංචාරක, ගුවන්, කෘෂිකාර්මික, අධ්‍යාපන වැනි ක්ෂේත්‍රයන්ට ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට පිළියම් සකස් කළ යුතු ය.

***මුඛ්‍ය පද:*** *විදේශ සෘජු ආයෝජන, ශ්‍රී ලංකාව, අභියෝග, උපනතීන්*

[1]ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, madusaragalle@gmail.com

# 1977 න් පසු ඇති කරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ දිළිඳු ජනතාවට කරනු ලබන බලපෑම

කේ. එච්. ටී. ධනංජලී[1]

## සංක්ෂේපය

1948 ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක් බවට පත් වීමත් සමග 1948-1956 දක්වා ලංකාවේ ක්‍රියාත්මක වූයේ යටත්විජිත විවෘත ආර්ථික ප්‍රතිපත්තියකි. 1977 වන විට ලිහිල් ආර්ථිකයක අවශ්‍යතාවය තදින් දැනෙන්නට විය. ඊට හේතුව දුගී බව ඉතාමත් ඉහළ මට්ටමක පැවතීමයි. මේ නිසා 1978 දී බලයට පත් වූ රජය 1978 දී ශ්‍රී ලංකාවට විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුණි. ලංකා ආර්ථික ඉතිහාසයේ කැපීපෙනෙන වෙනස්කම් රාශියක් ඇති වූ යුගයක් ලෙස 1977 න් ඇරඹෙන යුගය සඳහන් කළ හැක. මේ නව ආර්ථික හා කාර්මික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට "මහ කොළඹ ආර්ථික කොමිසම" පිහිටුවනු ලැබීය. මේ තුළින් දේශීය ජනතාවට හා දිළිඳු ජනතාවට ප්‍රතිලාභ ඇති කරන ලද අතරම දේශීය ජනතාවගේ ආදායම් අසමානතාවයට, අඩු ආර්ථික වර්ධනයට මෙන් ම දරිද්‍රතාවය වර්ධනයට හේතු වූවාදැයි සැක සහිත වේ. ඒ අනුව අධ්‍යනයේ ගැටළුව වන්නේ 1977 න් පසු ඇති කරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ දිළිඳු ජනතාවට කෙසේ බලපායි ද යන්නයි. අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ එම විවෘත ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් දිළිඳු ජනතාවට කරනු ලබන බලපෑම පිළිබඳ අධ්‍යනය කිරීමයි. උප අරමුණු ලෙස 1977 න් පසුව දිළිඳු ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුනා ගැනීම, ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකයේ හැසිරීම පිළිබඳ අධ්‍යනයක යෙදීම හඳුන්වා දිය හැක. ඒ සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයටම අදාළ තොරතුරු පදනම් කරගෙන ද්විතියික මූලාශ්‍ර යොදා ගනිමින් මේ අධ්‍යනය සිදු කර ඇත. දත්ත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රතිශතක වගු සටහන් හා ප්‍රස්තාර සටහන් යොදා ගනු ලැබීය. වගු, ප්‍රස්තාර යොදා ගනිමින් විස්තරාත්මක විශ්ලේෂණය මගින් දත්ත විශ්ලේෂණය කරනු ලැබීය. 1977 න් පසු ඇති කරන ලද විවෘත ආර්ථික ප්‍රතිසංස්කරණවල ප්‍රතිලාභ ජනතාව වෙත ගලා ගොස් ඇති බව නිගමනය කළ හැකි නමුත් එය දරිද්‍රතාවය අවම කිරීමට ප්‍රමාණවත් නොවන බව නිගමනය කළ හැක. ජනතාවගේ ජීවන තත්ත්වය නන්වාලීමට අවශ්‍ය ආර්ථික හා සමාජයීය සාධකයන්ගේ ගුණාත්මක භාවය වර්ධනය කර දිළිඳු ජනයාට වඩාත් කාර්යක්ෂමව සේවය කිරීම පිණිස අය වැය ප්‍රතිපාදන වෙන් කර මනා රාජ්‍ය කළමණාකරණයක් ඇති කිරීමට යෝජනා ඉදිරිපත් කළ හැකි අතර ඉන් දරිද්‍රතාව අවම කිරීමට හැකි බවට යෝජනා ඉදිරිපත් කළ හැක.

***මුඛ්‍ය පද:*** *විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, දිළිඳු ජනතාව, ආර්ථික වර්ධනය, දරිද්‍රතාවය*

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, khtdhananjali123@gmail.com

# සංවර්ධනය තාක්ෂණය සමඟ නවීකරණය වූ බැංකු සේවාව ගනුදෙනුකරුවාට බලපා ඇති ආකාරය

එම්. පී. අයි. එම්. කුලතුංග[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව තුළ විධිමත් බැංකු ක්‍රමයක් ගැන මුලින්ම දැකගත හැකි වන්නේ යටත් විජිත යුගයේදීය. මූලාරම්භය සනිටුහන් කරමින් ඔවුන් විසින් බිහිකළ මුල්ම බැංකුව 1828 ආරම්භ කළ මහනුවර බැංකුවයි. ලංකාවේ දේශීය බැංකු ක්‍රමයක සංධිස්ථානයක් වූයේ 1938 අංක 53 දරණ ලංකා බැංකු පනතින් ලංකා බැංකුව පිහිටුවීමයි. තාක්ෂණික පෙරළිකාරිත්වය අන් සෑම ක්ෂේත්‍රයකටම මෙන්ම බැංකු ක්ෂේත්‍රයටද ආගමනය වුයේ පෝළිම් බැංකු ක්‍රමයට තිත තබමිනි. එසේ බැංකු කටයුතුවල පහසුකම් වැඩිදියුණු කරමින් දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීමේ දී ස්වයංක්‍රිය දුරකථන බැංකු සේවය, අන්තර්ජාල බැංකු සේවා භාවිතය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතය, ජංගම දුරකථන බැංකු සේවය වැනි සේවා හඳුන්වා දෙනු ලැබීය. බැංකු ක්ෂේත්‍රයට ගලා ආ තාක්ෂණික පෙරළිය ගනුදෙනුකරුවන්ට බලපා ඇති ආකාරය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එකී අරමුණ මුල්කොට ගෙන කළ මෙම අධ්‍යයනයට අදාලව මධ්‍යම පළාතේ තෝරාගත් බැංකු 05 ක ගනුදෙනුකරුවන් 50 කට ප්‍රශ්නාවලියක් ලබා දී ප්‍රාථමික දත්ත රැස් කළ අතර ද්වීතියික දත්ත ද භාවිතා කර විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය හා ප්‍රචාරාත්මක විශ්ලේෂණ ක්‍රමය පදනම් කරගෙන විශ්ලේෂණය කරන ලදී. දත්ත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රස්ථාර වගු ආදිය භාවිතා කරන ලදී. දත්ත විශ්ලේෂණයෙන් එළඹිය හැකි නිගමන සලකා බැලීමේ දී පෙනී යන්නේ නවීකරණය වු බැංකු සේවා භාවිතයට ගනුදෙනුකරුවන් වැඩි වශයෙන් යොමු වී ඇති අතර වැඩි වශයෙන් එසේ යොමුව ඇත්තේ උගත් නාගරික පිරිස් වන අතර ග්‍රාමීය දිළිඳු ජනයා තාක්ෂණය භාවිතයට මැලිකමක් දක්වන බවත්ය. එමෙන්ම තාක්ෂණයත් සමඟ වෙනස් වූ බැංකු සේවාවන් මගින් ගනුදෙනුකරුවාගේ කාලය ශ්‍රමය ඉතිරි කරමින් වාසි රැසක් ලබා දෙන අතර සෑම බැංකු කටයුත්තක්ම නිවසේ සිටම ක්ෂණිකව සිදු කර ගැනිමට හැකියාව ලැබී ඇති අතර බැංකු අංශයේ රැකියා අවස්ථා අඩුවෙමින් පවතී. අන්තර්ජාලය ඔස්සේ ඔවුන්ගේ පෞද්ගලික තොරතුරු සැපයීමට සිදුවීමේදි පවතින අනාරක්ෂිත බව, තාක්ෂණික බැංකු ශිල්පක්‍රම භාවිතයට යොමු වීමට ඒ පිළිබඳ මනා දැනුමක් තිබීම අවශ්‍ය වීම වැනි අවාසිදායක තත්ව ඇති වේ. එම අවාසි අවම කර ගැනීමට නවීකරණය වන බැංකු කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, ආරක්ෂක පියවර දැඩි කිරිම, ගනුදෙනුකරුවන්ගේ උදව්වට බැංකු සේවකයින් යෙදවීම ආදිය සිදු කළ හැක. ඒ අනුව බැංකු ක්ෂේත්‍රයේ ඇතිවන තාක්ෂණික වෙනස මඟින් වන අවාසි අවම කරගෙන වාසි උපරිම කරමින් සෑම ගනුදෙනුකරුවෙකුටම උපරිම තෘප්තියක් ලැබෙන ආකාරයට කටයුතු කිරීම සෑම බැංකුවකම වගකීම වේ.

**මූඛ්‍ය පදඃ** සංවර්ධනය, තාක්ෂණය, නවීකරණය, බැංකු සේවාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, imadukulathunga@gmail.com

# උමාඔය සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට බලපෑම් කරන ආකාරය පිළිබඳ විමසුමක්

ආර්. ඩී. එස්. යූ. රාජපක්ෂ[1], ආර්. ඩබ්. එම්. එස්. පී. රාජපක්ෂ[2]

## සංක්ෂේපය

ආර්ථික සංවර්ධනය අරමුණු කරගත් උමාඔය සංවර්ධන ව්‍යාපෘතිය 2008 වසරේ සිට මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා රජය සහ ඉරාන රජය අතර සිදුවූ ද්වීපාර්ශවික ගිවිසුම් සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක විය. "අහසින් වැටෙන එකදු ජල බිඳුවක්වත් මිනිසාගේ ප්‍රයෝජනයට ගෙන මිස මුහුදට නොයවනු" යන පරාක්‍රමබාහු රජුගේ ශ්‍රේෂ්ඨ පාඨය ප්‍රමුඛ කර ගනිමින් ඇරඹුණු මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයට ප්‍රබල ලෙස බලපෑම් ඇති කරන්නට විය. ඒ අනුව මෙම පර්යේෂණයේ  අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට උමාඔය ව්‍යාපෘතියෙන් සිදු වූ හා සිදු වන මෙහෙවර අධ්‍යයනය කිරීමයි. උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන්නේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටළුව වේ. උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියේ  අරමුණු වන්නේ ඇළ මාර්ග හා ඉඩම් සංවර්ධනය කිරීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, පානීය ජල අවශ්‍යතා සපුරාලීම, කුඩා වැව් ප්‍රතිසංස්කරණය මගින් ගොවිතැන් සඳහා ජල සැපයුම් ලබා දීම, කර්මාන්තශාලා සඳහා ජල සැපයුම් ලබා දීම, ඉරානය වැනි රටවල් සඳහා බීමට සුදුසු ජල බෝතල් අපනයනය කිරීම වැනි දේය. මෙම අරමුණු වලට අනුව උමාඔය ව්‍යාපෘතිය මෙරට ආර්ථික ක්ෂේත්‍රයේ ප්‍රබල හැරවුම් ලක්ෂ්‍යයකි. මෙම ව්‍යාපෘතිය තුළින් මොණරාගල දිස්ත්‍රික්කයේ අවම සංවර්ධන ප්‍රදේශයන් සඳහා වාරි ජල සැපයීම සිදු වන අතර එමගින් ඉඩම් අක්කර 15000ක වගාබිම් සශ්‍රීක කිරීමට බලාපොරොත්තු වේ. එසේම කිලෝමීටර 20 ක් දිග උමං පද්ධතිය සහ ජල විදුලි බලාගාරයක් ඉදි කිරීමද සිදු කිරීමට අපේක්ෂිතය. මෙහි ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය දෙස බැලීමේදී මෙම ව්‍යාපෘතියේ අවසානයක් තවමත් සිදු නොවුනත් මෙම ව්‍යාපෘතිය දැනටමත් මෙරට ආර්ථික සංවර්ධනයට දායක වෙමින් තිබේ. ඒ අනුව 2008 වසරේ ඇරඹී උමාඔය සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට එනම් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, ජාතික හා අපනයන ආර්ථික ක්ෂේත්‍රයන්ට ප්‍රබල ලෙස දායක වන බව කල්පිතයක් ලෙස ගෙන පරීක්ෂා කළ හැකිය. උක්ත කල්පිතය පරීක්ෂා කිරීමේදී ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන දෙවර්ගයම යොදාගෙන ඇත. එහිදී පොත්පත්, පුවත්පත්, හඬපට, මුහුණු පොතේ සටහන්, රාජ්‍ය අංශයේ සහ රාජ්‍ය නොවන අංශ වලින් ලබාගන්නා සංඛ්‍යාලේඛන වාර්තා ආදී විවිධ ද්වීතියික මූලාශ්‍ර ආදිය ද්වීතියික දත්ත ලෙස ද අහඹු ලෙස තොරා ගන්නා නියදියකට ලබා දෙන ප්‍රශ්නාවලි මගින් ලබාගන්නා දත්ත ප්‍රාථමික දත්ත ලෙසද භාවිත කරන ලදී. උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට බලපෑම් කරන ආකාරය පිළිබඳව සිදු කරන මෙම පරීක්ෂණය කරඳගොල්ල ප්‍රදේශය ආශ්‍රිත කර ගනිමින් සිදු කර ඇත.

***මුඛ්‍ය පදඃ*** *ආර්ථික සංවර්ධනය, උමාඔය, ශ්‍රී ලංකාව, සංවර්ධනය*

[1] දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sriparamirajapaksha@gmail.com

# කුටුම්භ දරිද්‍රතාව කෙරෙහි විදේශ ප්‍රේෂණවල බලපෑම

ඩී. ඩී. වයි. එන්. ගුණරත්න[1]


**සංක්ෂේපය**

දරිද්‍රතාවය යනු එක් රටකට පමණක් සීමා වූවක් නොව වත්මන් ලොව බොහෝ රටවල් මුහුණ දී ඇති සමාජ ආර්ථික ගැටළුවකි. ශ්‍රී ලංකාවේ පවත්නා ප්‍රධාන ගැටළුවක් ලෙස දරිද්‍රතාවය හඳුනා ගත හැකි අතර 2016 වර්ෂය වන විට ලංකාවේ දරිද්‍රතා ශිර්ෂ දර්ශකය 4.1%කි. ඒ අනුව පුද්ගලයන් 843,913ක් දරිද්‍රතාවය හේතුවෙන් පීඩා විඳින බව අනාවරණය වී තිබේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය ඉපැයුම් මාර්ගය වශයෙන් විදේශ ප්‍රේෂණ හඳුනා ගත හැකි අතර 2015 වර්ෂයේ දී ශ්‍රී ලංකාව හිමි කර ගත් ප්‍රේෂණ ප්‍රවාහයේ වටිනාකම ඇ.ඩො.බි. 6,980 ක් විය. මෙලෙස මෙරටට එවනු ලබන ප්‍රේෂණ ප්‍රවාහයන් සූක්ෂම මට්ටමේදී මෙන් ම සාර්ව මට්ටමෙන් ද රටේ සංවර්ධනය සඳහා දායක වෙයි. ඉහතින් අර්ථ දක්වන ලද දරිද්‍රතාවය සහ විදේශ ප්‍රේෂණ එකිනෙකට සම්බන්ධ කරමින් සිදු කරන මෙම අධ්‍යනයේ මූලික අරමුණ වී ඇත්තේ කුටුම්භ සූක්ෂම මට්ටමේ දී මුහුණ දෙනු ලබන දිළිඳුකම යන ගැටළුවෙන් මුදවා දිළිඳුකමට යළි ඇද නොවැටීමට හැකි වන පරිදි ප්‍රේෂණ ආදයම් දායක වී ඇත්දැයි හඳුනා ගැනීමයි. පර්යේෂණය සඳහා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ශ්‍රී ලංකාවේ වැඩි විදේශ ගත වීමක් හඳුනා ගත හැකි ප්‍රදේශයක් වන ගම්පහ දිස්ත්‍රික්කයේ ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සේවා නියුක්තිය සඳහා විදෙස් ගත වී නැවතත් මෙරටට පැමිණි පුද්ගලයින්ට අයත් කුටුම්භ 25ක් නියැදිය වශයෙන් ගැනිණි. මෙහි දී නියැදුම් ක්‍රමය වශයෙන් සසම්භාවී නොවන නියැදුම් ක්‍රමයක් වන හිමබෝල නියැදීම උපයෝගී කර ගත් අතර දත්ත ලබා ගැනීමේදී ප්‍රාථමික දත්ත ප්‍රශ්නාවලි මඟින් ද , ද්විතීයික දත්ත මහ බැංකු වාර්තා මඟින් සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා මඟින් ලබා ගන්නා ලදී. එසේම දත්ත විශ්ලේෂණය ඔස්සේ විස්තරාත්මක විශ්ලේෂණයන් මෙන්ම කල්පිත පරීක්ෂාවන් ද සිඳු කරන ලදී. ඒ අනුව නියැදියේ ඇතුළත් කුටුම්භ වල විදේශ ගත වීමට පෙර සහ විදේශ ගත වීමට පසු ආදයම් තත්වය සමාන වේද යන්න අධ්‍යනය කිරීමට සිදු කළ ඒ පරික්ෂාවේදී ගණනය කරන ලද ඒ අගය (t cal = 0.000) ∝=95% මට්ටමින් වෙසෙසි විය. තවද විදේශ ගත වීමට පසු අදායමත් විදේශ ගත වීමට පසු මූලික අත්‍යවශ්‍යතා සඳහා වැය කළ වියදමත් අතර සහසම්බන්ධතා සංගුණකය 0.719ක් විය. නමුත් විදේශ ගත වීමට පෙර අදායමත් විදේශ ගත වීමට පෙර මූලික අත්‍යවශ්‍යතා සඳහා වැය කළ වියදමත් අතර සහසම්බන්ධතා සංගුණකය ඊට වඩා ඉතාමත් අඩු අගයක් ගනු ලැබීය. එම කුටුම්භවල පෙර සිටි තත්වයට වඩා පැහැදිලි වර්ධනයක් හඳුනා ගත හැකි විය. පවුලේ සාමාජික සංඛ්‍යාව දිළිඳු බව වැඩි වීමට ඇතැම් පවුල් වලට හේතුවක් වී තිබූ අතර විදේශ ප්‍රේෂණ මත එවැනි කුටුම්භ වල ආර්ථිකමය වශයෙන් පැහැදිලි වර්ධනයක් දැක ගත හැකි විණි. ඒ අනුව අධ්‍යනයය මඟින් තහවුරු වූයේ සංක්‍රමණික කුටුම්භ සාමාජිකයින් විසින් එවනු ලැබූ ප්‍රේෂණ මුදල් කුටුම්භ වැඩි ප්‍රමාණයක් දිළිඳු කමින් මුදවාලීමට දායක වී ඇති බවයි.


***මුඛ්‍ය පදඃ** විදේශ ප්‍රේෂණ, දරිද්‍රතාව, ශ්‍රම සංක්‍රමණ*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yashodanayomi12@gmail.com

# ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි සමුපකාර අංශයේ බලපෑම

ඩබ්ලිව්. ඩබ්ලිව්. එල්. සී. ජනන්ජනා[1]

**සංක්ෂේපය**

ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථික තත්වය ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වී ඇතිවා සේම වර්තමානය වනවිට ක්‍රියාත්මක වෙමින් පවති. එම සංවර්ධන වැඩසටහන් අතරින් ග්‍රාමීය අංශය අලලා දියත් කෙරෙන සමුපකාර අංශ පිහිටුවීම ප්‍රධාන තැනක් ගනී. එම සමුපකාර අංශ හරහා සහන මිලට භාණ්ඩ ලබාදීම, අඩු පොලී ක්‍රම යටතේ ණය ලබාදීම වැනි වැඩසටහන් ග්‍රාමීය ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නංවාලීමට ඉහළ දායකත්වයක් ලබාදේ. මෙම සමුපකාර ඔස්සේ ලබාදෙන මූල්‍ය ණය, සහන මිලට භාණ්ඩ ලබාදීම හරහා එම ජනතාවගේ එදිනෙදා ආර්ථික තත්වය ඉහළ නැංවීමට කොතරම් බලපෑමක් කරන්නේද යන ගැටළුව පාදක කරගෙන මෙම අධ්‍යයනය සිදුකරන ලද අතර ඒ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රදේශයේ පවුල් 105ක අහඹු නියැදියක් යටතේ ප්‍රාථමික දත්ත රැස් කරගන්නා ලද අතර එම දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලියක් ආධාර කරගන්නා ලදී. මෙම මූල්‍ය ණය හා සහන මිලට භාණ්ඩ ලබාදීමෙන් එම ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ යාමේ දුර්වල බව පෙර තත්වයට වඩා (23.8%) පසු තත්ත්වයේදී (3.88%) පහළ මට්ටමක් ගත් බව වෘත්ත ප්‍රස්ථාර හරහා නිගමනය කිරීමට හැකියාවක් ලැබුණි. එසේම නිවසේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්වය පෙර පැවැති (0%) තත්වයේ සිට 11.42% දක්වා ඉහළ ගොස් තිබූ බව ප්‍රස්ථාර සටහන් මගින් නිගමනය කිරීමට හැකිවිය. එමෙන්ම ජිනි සංගුණකයේ අගය 0.50ක මට්ටමේ පැවතිණි. මෙම ජිනි සංගුණකයේ අගය මගින් ආදායම් බෙදී යාමේ විෂමතාවය පෙන්නුම් කරනු ලබන අතර එහි අගය 0.50 වීමෙන් අනාවරණය වූයේ ආදායම් බෙදී යාමේ විෂමතාවය පෙර පැවැති මට්ටමට වඩා අවම වී ඇති බවයි. මෙමගින් නිගමනය කළ හැකි වූයේ ග්‍රාමීය වශයෙන් පිහිටුවා ඇති සමුපකාර අංශය විසින් දියත් කරනු ලබන මූල්‍ය ණය හා සහන මිලට භාණ්ඩ ලබාදීම වැනි වැඩසටහන් ඔස්සේ දිළිඳු පවුල්වලට පෙර පැවැති තත්ත්වයට වඩා ඉහළ ආර්ථික තත්ත්වයක් අත්පත් කර ගැනීමට හැකිවූ බවයි.

***මූඛ්‍ය පද :*** *දිළිඳු ප්‍රජාව, ආර්ථික තත්ත්වය, සමුපකාර අංශය, ණය වැඩසටහන්, සහන මිල*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chamudijananjana@gmail.com

# ශ්‍රී ලංකාවේ උද්ධමනය ආර්ථික වර්ධනයට සිදු කර ඇති බලපෑම 2007-2017 වර්ෂ ඇසුරින්

එච්. එස්. සේරම්[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකා ආර්ථිකයේ ඉහළ ආර්ථික වර්ධන ප්‍රවණතාවය, ශ්‍රී ලංකාව ලෝකයේ මැදි ආදායම්ලාභී ආර්ථිකයක් බවට පත් කරමින් ඉහළ ආර්ථික මාවතකට ප්‍රවිශ්ට වීමට හේතු සාධක වී ඇත. රටක ආර්ථික වෘද්ධිය තීරණය කරන එමෙන් ම ආර්ථික වෘද්ධිය වේගවත් කරන සාර්ව ආර්ථික විචල්‍යන් රැසක් පවතියි. එම විචල්‍යය අතර උද්ධමනය වැදගත් වේ. උද්ධමනය යනුවෙන් අදහස් වන්නේ මිල මට්ටමේ සිදු වන අඛණ්ඩ ඉහළ යාමයි. ශ්‍රී ලංකාව තුල ඉහළ උද්ධමන අනුපාතිකයක් දක්නට ඇති අතර එම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සැළකිල්ලට ගත් කාල සීමාව තුළ සිදු කර ඇති බලපෑමත් එහි ආර්ථික ප්‍රතිවිපාකත් හඳුනාගැනීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගයට උද්ධමනය තුළින් සිදු කර ඇති බලපෑමත් එහි ආර්ථික ප්‍රතිවිපාකත් හඳුනාගැනීමත් පර්යේෂණය සාධනය කර ගැනීමට අපේක්ෂිත අරමුණයි. දත්ත ලබා ගැනීමේ දී ද්විතීයික දත්ත භාවිතා කරන ලදි. ද්විතීයික දත්ත මහ බැංකුව, මහ බැංකුවේ නිල වෙබ් අඩවිය, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ එහි නිල වෙබ් අඩවිය මඟින් ලබා ගන්නා ලදී. මූලික සංඛ්‍යාන විධි ක්‍රම භාවිතා කරමින් වගු සහ ප්‍රස්තාර මඟින් උද්ධමනය සහ ආර්ථික වර්ධනය අතර ඇති සම්බන්ධතාවය ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය ඉහළ මට්ටමක පවතින අතර ආර්ථික වර්ධන වේගය තුල ද විවිධ උච්චාවචන පවතින බව අවබෝධ වේ. එසේම ශ්‍රී ලංකාව තුළ උද්ධමනය සහ ආර්ථික වර්ධනය අතර ප්‍රතිලෝම සහ වැදගත් සම්බන්ධයක් දිගුකාලීන වශයෙන් පවතින බව නිගමනය කළ හැකිය.

***මූඛ්‍ය පදඃ*** *උද්ධමනය, ආර්ථික වර්ධනය, ශ්‍රී ලංකාව*

[1] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sanjeewani.seram@gmail.com

# ශ්‍රී ලංකාවේ සංවර්ධනයට පළාත් ආර්ථික සංවර්ධනය කරනු ලබන බලපෑම

එන්. බී. පී. උපේක්ෂානී[1]


## සංක්ෂේපය

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස වර්තමානය වන විට තරඟකාරී සංවර්ධන ක්‍රමවේදයන් අනුගමනය කිරීමට පෙළඹී ඇත. වර්තමානයේ පළාත් මට්ටමින් කරනු ලබන ආර්ථික සංවර්ධනය හරහා සමස්ත රට ම ආර්ථික වශයෙන් සංවර්ධනය වීමක් දක්නට ලැබේ. “සෑම පළාතක් ම එකම ආකාරයට ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට බලපායි ද” යන්න මෙහි දී ගැටලුව වේ. පළාත් ආර්ථිකය සංවර්ධනය සමස්ත ශ්‍රී ලංකාවේ සංවර්ධනයට කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ. පර්යේෂණය සඳහා මුදල් කොමිෂන් සභා වාර්ෂික වාර්තාව 2017, ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා හා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්තා මඟින් තොරතුරු ලබාගෙන ඇත. ද්විතීයික දත්ත භාවිත කරමින් කේන්ද්‍රික ප්‍රවණතා මිනුම්, අපකිරණ මිනුම්, ප්‍රතිපායනය, සහ සබඳතාවය යන සංඛ්‍යානමය මිනුම් ක්‍රම භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කර ඇත. ශ්‍රී ලංකාවේ විරැකියා අනුපාත මට්ටම් හා දළ දේශීය නිෂ්පාදිත අනුපාත මට්ටම් අතර ඇති සබඳතාවය මැනීමට SPSS මෘදුකාංගය හරහා ‘සහ සබඳතා සංගුණකය’ ගණනය කර ඇත. දත්ත විශ්ලේෂණයට MS Excel 2016, SPSS මෘදුකාංග යොදාගෙන ඇත. දත්ත ඉදිරිපත් කිරීමට වගු, ප්‍රස්තාර යොදාගෙන ඇත. රැස්කරගත් දත්ත මඟින් පෙනීයන්නේ 2015 සිට 2017 කාලය තුළ වැඩි දළ දේශීය නිෂ්පාදිත අනුපාතයකට හිමිකම් කියනුයේ සේවා අංශය වන බවයි. මුදල් කොමිෂන් සභා වාර්ෂික වාර්තා මඟින් හා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා මඟින් ලබාගත් දත්ත අනුව පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතා අනුපාත මට්ටම 2009/10 සිට 2016 වන විට ක්‍රමයෙන් අඩුවන බවයි. අවම දරිද්‍රතා අනුපාත මට්ටමක් පවතින්නේ බස්නාහිර පළාත තුල වන අතර එය 2016 දී 1.7% කි. 7.7% ක වැඩිම දරිද්‍රතා අනුපාත මට්ටමක් උතුරු පළාත පෙන්වයි. ශ්‍රී ලාංකීය විරැකියා අනුපාත මට්මටම 2015 සිට 2017 වන විට අවම වී ඇති අතර 2017 දී 4.2% කි. අවම අනුපාතයක් දක්වා ඇත්තේ බස්නාහිර පළාත වන අතර එය 2017 දී 3.2% වේ. උතුර, නැගෙනහිර හා උතුරු මැද පළාත් ක්‍රමයෙන් වැඩිවන විරැකියා අනුපාත මට්ටම් පෙන්වයි. 45.5% ක පිරිසක් රැකියාවේ නියුක්ත වන්නේ සේවා අංශයේය. උතුරු මැද හා ඌව පළාත් කෘෂිකර්මාන්තයෙන් වැඩි දායකත්වයක් සැපයුව ද සෙසු සෑම පළාතක් ම වැඩි ම දායකත්වයක් සේවා අංශයෙන් සපයයි. පර්යේෂණය අවසානයේ දී තහවුරු වූ නිගමනය වන්නේ සෑම පළාතක් ම එකම ආකාරයට සමස්ත ආර්ථික සංවර්ධනයට බල නොපෑවද කාලයක් පුරාවට රට තුල පළාත් වශයෙන් ආර්ථික සංවර්ධනයක් පැහැදිලිව පෙන්නුම් කර තිබෙන බවයි.


***මූඛය පදඃ*** *සංවර්ධනය, පළාත් ආර්ථිකය, ශ්‍රී ලංකාව*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, prathiba.upeksha825@gmail.com

# ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය හා මෑත කාලීනව සිදුව පවතින වෙනස්කම්

ආර්. පී. එස්. එස්. දිසානායක[1]

**සංක්ෂේපය**

ඕනෑම රටක ආර්ථික වර්ධනය රදා පවතින්නේ එම රටේ ශ්‍රම බලකාය මතය. රටක ශ්‍රම බලකාය පූර්ණ උපයෝජනයක් නොමැති විට ආර්ථික වර්ධනය හීන වන අතරම සේවා වියුක්තියක් නිර්මාණය වේ. ඒ අනුව මෙම පරීක්ෂණයේ ගැටළුව බවට පත් කර ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය යන්න, 2014-2018 අතර කාලය තුළ වෙනස්ව පවතින්නේ කෙසේද යන්න අධ්‍යනය කිරීමයි. එම ගැටළුව මත පදනම්ව 2014-2018 අතර කාලය තුළ සේවා වියුක්තිය වෙනස්ව පවතින ආකාරය හඳුනා ගැනීම මෙම පරීක්ෂණයේ අරමුණ වශයෙන් යොදා ගන්නා ලදී. මෙහිදී පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය දත්ත රැස් කර ගන්නා ලද්දේ ද්විතික දත්ත මූලාශ්‍ර මතය. එමෙන්ම දත්ත විශ්ලේෂණ කාර්යය සඳහා යොදා ගනු ලැබුවේ SPSS හා MS-EXCEL යන මෘතෘතුකාංගයන් වන අතර එවා මත පදනම්ව වගු සටහන්, ප්‍රස්ථාර සටහන්, මූලික සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්ප හා පරාමිතික හා අපරාමිතික පරික්ෂා මත පදනම්ව දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. මෙම විශ්ලේෂණය කරන ලද දත්ත මත පදනම්ව නිගමන හා සොයා ගැනීම කිහිපයකට එළඹීමට හැකි විය. එනම් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ 2014-2018 අතර කාලය තුළ ස්ත්‍රී හා පුරුෂ වශයෙන් ගත්විට සේවා වියුක්තියේ දැවැන්ත වෙනසක් පවතින බව නිගමනය කළ හැකි විය. එමෙන්ම 2014-2018 අතර කාලය තුළ වයස් මට්ටම් අනුව ගත් කළ ද ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියේ වෙනසක් පවතින බව නිගමනය කල හැකි වූ අතරම ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති අනුපාතිකයන් ගත් කල මෑත කාලීනව සුළු උච්චාවචනයන් පමණක් සිදුව පවතින බව හඳුනා ගැනීමට හැකි විය. එමෙන්ම අධ්‍යාපන මට්ටම් අනුව ගත් කළ ද 2014-2018 අතර කාලය අතර තුර සේවා වියුක්තියේ වෙනස්කම් පවතින බවද නිගමනය කළ හැකි විය. මෙම අධ්‍යනය තුළින් විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය සඳහා සාධක ගණනාවක් බලපාන බව හඳුනා ගන්නා ලද අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගනු ලැබුවේ ද්විතීයික මූලාශ්‍රවන මෑත කාලීන ලිපි ,පුවත්පත් වර්තා, ආර්ථික විද්‍යාව හා සම්බන්ධ මෑත කාලින ග්‍රන්ථ ආදිය උපයෝගී කරගෙනය. ඒවාට යොදා ගත හැකි විසඳුම් ගණනාවක් පවතින බවද අදාළ මූලාශ්‍ර හා සාහිත්‍ය විමර්ශන මත සොයා ගැනීමට හැකි විය.

***මුඛ්‍ය පද:*** *සේවා වියුක්තිය, වෙනස්කම්, අධ්‍යාපන මට්ටම, වයස් මට්ටම*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, shanakasandaruwan40@gmail.com

# ශ්‍රී ලංකාවේ ශ්‍රමික සංක්‍රමණ පිළිබඳ මෑත කාලීන ප්‍රවණතා

පී. ඒ. ඩී. ටී. ඩී. රත්නසිරි[1]

## සංක්ෂේපය

විදේශ සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලාංකිකයින් විගමනය පිළිබඳ පැරණි ඉතිහාසයක් ඉදිරිපත් කළ නොහැකි ය. මෙරට ශ්‍රමිකයින් රැකියා සඳහා රටින් පිටවීමේ ආරම්භය ලෙස වාර්තා වන්නේ 20 වන සියවසේ මුල් භාගයේදී ය. වර්තමානයේ දී ජාතික ආදායම සඳහා දායකත්වය ලබාදෙන අංශ අතරට විදේශ රැකියා මඟින් ආදායම් ඉපයීම වැදගත් ස්ථානයක් හිමිකරගෙන තිබේ. ශ්‍රී ලංකාවේ පසුගිය වසර 10 තුළ විදේශ සේවා නියුත්තියේ ප්‍රවණතා හඳුනාගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ.මේ සඳහා ද්විතියික දත්ත යොදා ගන්නා ලද අතර ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ පවතින ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් නිකුත් කළ දත්ත මේ සඳහා ලබා ගෙන ඇත. සංඛ්‍යානමය විශ්ලේෂණ ශිල්පක්‍රම යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදුකරන ලද අතර ප්‍රස්තාර වගු භාවිතයෙන් දත්ත ඉදිරිපත් කර ඇත. මේ අනුව විදේශ රැකියා සඳහා පිටත්වීම් වල කැපී පෙනෙන වර්ධනයක් 1987 වසරේ සිට 2014 වර්ෂය දක්වා පෙන්නුම් කරයි. 1987 වසරේදි 14,157 වූ විදේශ රැකියා සඳහා පිටත්වීම් 2014 වසර වන විට 300,703 දක්වා වර්ධනය වී ඇත.එමෙන්ම කාන්තා සහභාගීත්වය 1988 වර්ෂයේදී ප්‍රථම වරට පිරිමින්ගේ සංඛ්‍යාව අභිබවා ගිය අතර මෙම ප්‍රවණතාවය 2007 දක්වා පවත්වා ගෙන ඇති බව පෙනී යයි. ගෘහ අංශයේ රැකියා හා ඇඟලුම් කර්මාන්තශාලාවල රැකියා සඳහා විගමනය වූ වැඩි සංඛ්‍යාවක් කාන්තාවන් වීම, එම ප්‍රවණතාවට හේතුවිය. කෙසේ වෙතත් වසර 20 කට පසුව 2008 දී ඉතා පටු ආන්තිකයක් වන කාන්තාවන් 48.81 % කට පිරිමින් 51.19 % වශයෙන් පිරිමි ශ්‍රමිකයින් සංඛ්‍යාව කාන්තා ශ්‍රමිකයින් සංඛ්‍යාව අභිබවා ගොස් ඇත. 2010 වන විට පිරිමි විගමනය 51.16 % සහ කාන්තා විගමනය 48.84% වශයෙන් දැක්විය හැක.2014 වර්ෂයේදී විදේශ රැකියා සඳහා ඉතා ඉහළම ශ්‍රමික සංඛ්‍යාවක් 300,703 පිටත්වූ බවට වාර්තා වන අතර, ඒ අතුරින් 110,486 (36.74%) ක් කාන්තාවන්ද ,190,217 (63.26%) ක් පිරිමින්ද විය. නමුත් 2014 පසුව 2015 වර්ෂයේ සිට රැකියා සඳහා විගමනය විම කාන්තා හා පිරිමි යන අංශ දෙකෙන්ම පසුබෑමකට ලක්වි ඇත. පසුගිය වසර කිහිපය තුළ සියලු සාම්ප්‍රදායික විදේශ විනිමය ප්‍රභවයන් අභිබවමින් විදේශ රැකියාවල නිරත වූවන් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන විදේශ විනිමය ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය උපයන මාර්ගය බවට පත් වී ඇත.

***මුඛ්‍ය පදඃ*** *විදේශ සේවා නියුක්තිය, විදේශරැකියා, ශ්‍රම සංක්‍රමණ, ශ්‍රී ලංකාව*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, thamalidananjani22@gmail.com

# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව, ආදායම් විෂමතාව, ළමා පෝෂණ ඌණතාව සම්බන්ධයෙන් වන මෑත කාලීන සමාජ ආර්ථික අභියෝග

ඒ. පී. ඩී. චන්ද්‍රකාන්ති[1]

**සංක්ෂේපය**

නිදහස ලැබී ගෙවීගිය දශක 40 කාලය තුළ ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමන් මඟ තුළ විවිධ වූ අභියෝග රැසකට මුහුණ දෙමින් සංවර්ධනය වෙමින් පවතින අඩු ආදායම් ලබන මට්ටමක සිට මධ්‍ය ආදායම් ලබන රටක් බවට එනම් කෘෂිකර්මාන්තය මූලික කරගත් අඩු ආදායම් ලබන ආර්ථිකයක සිට වඩා විවිධාංගීකරණය වූ සේවා මූලික කරගත් මැදි ආදායම් ලබන ආර්ථිකයක් බවට පත් වී ඇත. මේ සඳහා මූලික වශයෙන් අධ්‍යාපනය සහ සෞඛ්‍ය වැනි සමාජ සංවර්ධන අංශ තුළ ඇති වූ කැපී පෙනෙන සංවර්ධනය උපකාරී වී ඇත. ශ්‍රී ලංකාව සංවර්ධන ප්‍රතිපත්ති චක්‍රය තුළ ජයග්‍රහණ අත් කරගෙන තිබුණද විශේෂයෙන් ම දරිද්‍රතාව , ආදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌණතා වැනි අංශවල පවත්නා ගැටළු හේතුවෙන් එම වර්ධනය පවත්වාගෙන යෑමේදී සමාජ ආර්ථික පරිවර්තන කෙරෙහි අවධානය යොමු කිරීමට සිදු වේ. ආර්ථිකයේ සෑම අංශයකම විවිධ අභියෝග පවතින අතර දරිද්‍රතාව අදායම් විෂමතාව සහ ළමා පෝෂණ ඌනතා යන ගැටළු මගින් ආර්ථික වර්ධනය දැඩි ලෙස දුර්වල කිරීමට සහ සමාජ ගැටළු වර්ධනය වීමට හේතු වනවාද යන්න අධ්‍යනය මඟින් සළකා බලනු ලැබේ. ඒ අනුව ජනතාව තුළ ජීවන තත්වය උසස් කිරීමට සහ තිරසාර වර්ධනය හා සංවර්ධනය ළඟා කර ගැනීමට මෙම විශේෂිත අංශ තුනෙහි අභියෝග සළකා බැලීම අත්‍යවශ්‍ය තත්වයකි. වර්තමානය වන තෙක් දරිද්‍රතා මට්ටම සහ ආදායම් ව්‍යාප්ති විෂමතා මට්ටම් වසරින් වසර ඇති වූ වෙනස්කම් මෙන්ම එම සාධනීය තත්වයන්ට ළඟා වීමේදී බලපෑ අභියෝග සහ ළඟා වීමට අපේක්ෂා කරනු ලබන තත්වයන් පිළබඳව අධ්‍යයනය කිරීම උප අරමුණක් සේ සළකා බලනු ලැබේ. මෙහි දී පොත්පත්, සඟරා, අන්තර්ජාල මගින් ද්විතියික දත්ත භාවිත කර ඒවා වගු ප්‍රස්තාර මගින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අපේක්ෂාවෙන් ක්‍රියත්ත්මක කරනු ලබන විවිධ වූ සංවර්ධන ඉලක්ක වෙත ළඟා වුවද දරිද්‍රතාවය සහ ආදායම් ව්‍යාප්ති විෂමතාව මෙන්ම ළමා පෝෂණ ඌනතාව මුලින් උපුටා දැමීමට නොහැකි වී ඇති බව අධ්‍යනය මගින් නිගමනම කළ හැකිය. එමෙන් ම එම තත්වයන් අවම කිරීමට කටයුතු කිරීමේදී විවිධ වූ සමාජ ආර්ථික අභියෝග රැසකට මුහුණ දීමට සිදු වේ.

***මුඛ්‍ය පද:*** *දරිද්‍රතාවය, ආදායම් ව්‍යාප්ති විෂමතාවය, ළමා පෝෂණ ඌනතාවය*

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, deepikadutuwewa@gmail.com

# ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ තේ වගාකරුවන් මුහුණපාන ගැටළු

එස්. එච්. එම්. පි. පියරත්න[1]

## සංක්ෂේපය

ලෝකයේ තේ වලින් වැඩි ප්‍රමාණයක් වගා කරනු ලබන්නේ කර්කටක නිවර්තන රේඛාව හා මකර නිවර්තනය අතර පිහිටි ඛණිජ බහුල පසින් යුතු මුහුදු මට්ටමින් 900-1200 අතර උසින් යුතු කඳුකර ප්‍රදේශවලය. ඕලන්ද ජාතික වෙළඳුන් විසින් 1610 දී තේ වගාව යුරෝපයට හඳුන්වා දෙන ලදී. ඒ සමඟම තේ යුරෝපයේ හා ඇමරිකාවේ ජනපද පුරා බෙහෙවින් ජනප්‍රියත්වයට පත් විය.වර්තමානයේ දී තේ නිෂ්පාදනය අතින් ප්‍රමුඛ රටවල් අතරට ආජන්ටිනාව, චීනය, ඉන්දියාව, මලාවි, ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව සහ තායිවානය අයත්ය. ලංකාවේ තේ කර්මාන්තය දෙස බැලීමේදී එහි ඉතිහාසය බ්‍රිතාන්‍ය පාලන යුගය දක්වා දිවෙයි. එවකට තේ වගාව ව්‍යාප්තව පැවතියේ මධ්‍යම කඳුකරයේ ප්‍රදේශ කිහිපයක පමණි. නමුත් අද වන විට උඩරට, පහතරට හා මැදිරට වශයෙන් ලංකාවේ සියළු ප්‍රදේශයන්හි තේ වගාව ව්‍යාප්තව පවතී. මෙම මුළු තේ නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් සපයන්නේ කුඩා පරිමාණ තේ වගාකරුවන් විසිනි. කුඩා පරිමාණ තේ වගාකරුවන් යනුවෙන් හැඳින්වෙන්නේ ඉඩම් හෙක්ටයාර 1 1/2 වැඩි වූද, හෙක්ටයාර 5ට අඩු වූද, භූමි ප්‍රමාණයක තේ වගාකර ඇති තේ නිෂ්පාදකයන්ය. 1972 සහ 1976 ඉඩම් ප්‍රතිසංස්කරණවලට අනුව කුඩා පරිමාණ තේ වගාකරුවන් යනු හෙක්ටයාර 20.2ට අඩු භූමි ප්‍රමාණයක තේ වගාකර තිබෙන තේ සැකසුම් ක්‍රියාවලිය ඔවුන්ටම කර ගැනීමට ඉඩපහසුකම් නොමැති තේ වගාකරුවන්ය. මෙහිදී කුඩා පරිමාණ තේ වගාකරුවන් මුහුණපාන ගැටළු පිළිබඳව පුළුල් ලෙස විශ්ලේෂණයට ලක්කරනු ලබයි. එනම් ඔවුන් තේ වගාව සදහා බිම් සැකසීමේ සිට තේ දළු නෙලීමෙන් අනතුරුව ඒවා නිෂ්පාදනාගාර වෙත යවන තෙක් දැරීමට සිදුවන පිරිවැය, සපයන තේ දළු ප්‍රමාණය, ඔවුන් සිය නිෂ්පාදනය වෙනුවෙන් ලබන ආදායම ආදිය පිළිබදව අධ්‍යනය කිරීමේ දී එහි පවතින ගැටළු හදුනා ගැනීමේ හැකියාවක් පවතී. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය ඉහළ මට්ටමක ඇත. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයට කුඩා පරිමාණ තේ වගාකරුවන්ගෙන් වන දායකත්වය ඉහළ මට්ටමක පවතී. මෙහිදී අධ්‍යනයට භාජනය කරන ගැටළුව වන්නේ කුඩා පරිමාණ තේ වගාකරුවන් මුහුණපාන ගැටළු මොනවාද යන්නය. මෙහිදී කුඩා පරිමාණ තේ වගාකරුවන් මුහුණපාන ගැටළු අධ්‍යනය කිරීම පොදු අරමුණක් වන අතර මොවුන්ගේ නිෂ්පාදන ප්‍රමාණය යෙදවුම් පිරිවැය අධ්‍යනය කිරීම ආදිය සුවිශේෂි අරමුණු ලෙසත් සැළකිය හැකිය. දත්ත රැස් කිරීම සදහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතික දත්ත ද භාවිත කරනු ලබයි. මේ සඳහා සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමයක් ලෙස විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමය මඟින් දත්ත විශ්ලේෂණය සිදු කරනු ලබයි.

***මුඛ්‍ය පදඃ*** *කුඩා පරිමාණ තේ, තේ වගාකරුවන්, ගැටළු, ශ්‍රී ලංකාවේ අරමුණු*

[1]ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, manjulaprabodani95@gmail.com

***MANAGEMENT***

***AND***

***BUSINESS STUDIES***

# The Impact of Physical Work Environment on Job Satisfaction: The Perceptions of the Clerical Staff at the University of Kelaniya

H. K. D. W. M. S. K. Hapuhinna[1], Dr. S. Kumar

## ABSTRACT

The workforce within the service sector is rapidly increasing. Service sector employees spend much of their time in indoor office environments, which affect employee performance and employee wellbeing. Nonetheless, little empirical evidence is available from Sri Lanka to demonstrate the link between the physical work environments and job satisfaction. The present study is conducted to identify the different elements of the workspace and their association with job satisfaction. The environment comfort model postulates that environmental comfort can be conceptualised to include the three aspects, physical, functional and psychological comfort. Physical comfort is the minimal level of comfort required, followed by functional and psychological comfort in affecting employee satisfaction. Thus, the model is hierarchical in nature. Demographic characteristics of employees are expected to affect perceptions of comfort. The investigation was carried out through two studies, using qualitative and quantitative approaches. University of Kelaniya was selected as the study site and clerical and allied grade employees were selected as the population for both studies. Focus group discussions were used for data collection and relative levels of comfort for the three aspects were assessed. The highest satisfaction was with physical comfort, followed by functional and psychological comfort, which is consistent with the hierarchical nature of the environmental comfort model. The study used stratified random sampling. Demographic characteristics affected experiences of comfort; specifically, results showed male respondents reported higher environmental satisfaction than female employees. The results indicated a significant relationship between physical work environment and job satisfaction, but not with functional and psychological comfort. The findings were generally supportive of the environmental comfort model. The results support the hierarchical nature of environmental comfort and the significance of physical comfort in the job satisfaction of employees. The study highlights through qualitative data that all three levels of comfort are nevertheless important. The implications of the findings to managerial applications are also discussed.

***Key words:*** *Job Satisfaction, Physical Work Environment, Comfort Factors, Sustainable Buildings, Environment Comfort*

[1] Research & Publications, University of Kelaniya, shyamikah@kln.ac.lk

# The effect of quality of e-Banking on consumer satisfaction (A Special reference of Kiribathgoda Town)

K. M. D. M. Thilakarathne[1], K.K.S.U.I Ubesekara, K.G.L udayanganee, W.M.W.M Wijeesingha, R.D.S.K Weerasinghe

## ABSTRACT

Sri Lankan banking industry has taken a new step forward in providing more services to its customers with the help at the world's leading technology, which is commonly known as e-banking. The important thing is the qualitative E-banking is how long affect to the customer satisfaction. This research based on the problem that whether the e-banking provides a quality service. The main objective of this report is to study above problem on five factors. These are reliability, tangible, assurance, responsiveness and empathy. The study area is Kiribathgoda town which is one of semi-urban area. The research has chosen four banks including two state banks and two private banks. The researcher has selected 100 customers for the sample by the stratified random sampling technology. Primary data collected by using questionnaires and interweaves. Secondary data collected by using Annual reports articles and Journals. In this report researcher used regression analysis, Chai square test, Run test, Descriptive statistics method, Charts and table for data analysis. In conclusion this research convinces that Tangible, Assurance, Responsiveness, and Empathy factors are affect to the customer's satisfaction and reliability is not. Updating latest information of E-banking service and taking actions to develop the reliability on E-banking services are suggestions of our research.

***Key words:*** *Bank, Customer satisfaction, E-banking, Service*

[1] Department of Social Statistics, University of Kelaniya, dineshmadusankat@gamail.com

# Impact of Earning Quality on Firm's Performance: An Empirical Study of Aitken Spence Travels Pvt Ltd

A.K.D.T. Yohani[1]

## ABSTRACT

The firm's performance is a magnitude process that determines the future investment decisions and that firms' persistence in the industry. This study undertaken to identify the significant impact of earning quality on firm's performance of Aitken Spence Travels in Colombo Stock Exchange. Properly managed discretionary accruals always lead to high quality of earnings. Therefore it is essential to identify, what kind of impact that arises on earning quality will leads to the higher performance of the firm. The present study undertaken with the objective of find out the relationship between earning quality and firm's performance of Aitken Spence Travels. This study used the secondary data for the period of 2008-2016, the sample consist a leading travel agency in Colombo stock exchange. The travel agency is Aitken Spence Travels Pvt Ltd. This study used correlation analysis and multiple regression analysis to measure the relationship between variables, individual and overall impact on firm's performance and to test the operationally developed hypotheses. Earning quality determined according to the effect of accruals quality. In this research, discretionary accruals by developing it as an independent variable. And the Firms performance measured by return on asset and return on equality as a depent variable. The findings of this study reveals, there is a significant positive relationship with earning quality and return on quality and also there is a significant positive relationship with earning quality and return on assets. However, the above results provide information to understand the earning quality and how it impact on firms performance level in travel industry in Sri Lanka.

***Keywords:*** *Earning Quality, Return on Asset, Return on Equity, Discretionary accruals, Firm's Performance*

[1]Department of Archaeology, University of Kelaniya, thashilayohani@gmail.com

# විකුණුම් කාර්ය සාධනයට අනුව පාරිභෝගිකයා මත පදනම් වූ සන්නාම කොටස් වල බලපෑම

ඩබ්. එච්. ඩී. එස්. චන්ද්‍රසේන[1]

## සංක්ෂේපය

ව්‍යාපාර කටයුතු වලදී මෙන්ම අධ්‍යයන සමීක්ෂණයන්හිදී ද සමාගමක් සතුව පවතින පාරිභෝගිකයින්ට අමතරව දෙවනුවට වඩාත්ම වැදගත් වත්කම ලෙස සළකනු ලබන්නේ සන්නාම කොටස් වන අතර ඒ මන්ද යත් සාර්ථක සන්නාම මඟින් ව්‍යාපාරිකයන්ට තරඟකාරීව වාසි අත්කර ගැනීමට හැකියාවක් පවතින බැවිනි. විකුණුම් කාර්ය තුළ දී සන්නාම කොටස්, පාරිභෝගිකයින් හට කෙතරම් බලපෑමක් කරන්නේද යන්න පිළිබදව සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. මෙම අධ්‍යයනය සිදුකර ඇත්තේ විකුණුම් කාර්යයට අනුව කොළඹ ප්‍රදේශයේ පාරිභෝගිකයන් මත පදනම් වූ සන්නාම කොටස් වල බලපෑම මිනුම් කිරීම සඳහා වේ. මෙහිදී ලකී ලංකා ආයතනයේ පාරිභෝගිකයින් 50 දෙනෙකු හට ප්‍රශ්නාවලීන් බෙදා දුන් අතර අහඹු නියැදි ක්‍රමය මේ සඳහා වූ අපේක්ෂිත නියදිය තෝරා ගැනීමට භාවිතා කර ඇත. එමෙන්ම අධ්‍යනය සඳහා ද්විතියික දත්ත මූලාශ්‍රයන්ගෙන් දත්ත රැස් කරගන්නා ලදී. එහිදී පාරිභෝගිකයා මත පදනම් වූ සන්නාම කොටස් හා විකුණුම් කාර්ය ඇසුරු කරගත් ප්‍රකාශිත වාර්තා, සාහිත්‍යය විමර්ශන, පොත් සඟරා, සහ අන්තර්ජාලය තුළින් දත්ත එක්රැස් කරගන්නා ලදී. එසේම ලකී ලංකා කිරි නිශ්පාදන ආයතනය විසින් පළකරන සඟරා, අන්තර් වාර්තා සහ පරිගණක දත්ත පදනම් කරගත් තොරතුරු තුළින්ද දත්ත එක්රැස් කරගන්නා ලදී. එසේ රැස් කරගත් දත්ත SPSS සහ Excel පරිගණක මෘදුකාංගය හරහා විශ්ලේෂණයට භාජනය කෙරිණි. මෙම දත්ත විශ්ලේෂණ ක්‍රම භාවිතා කරමින් ඒවායේ ප්‍රතිඵල ගණනය කරන ලද අතර විචල්‍යයන් අතර පවතින වෙනස ගණනය කිරීමටද මෙම විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදී. මෙහිදී ස්වායක්ත විචල්‍යයන් වන්නේ අලෙවිය සන්නාම පිළිබඳ දැනුවත් භාවය, සන්නාම ඇසුරු කිරීම, ගුණාත්මක බව වන අතර සන්නාම වල විශ්වසනීයත්වය පරායක්ත විචල්‍යය වේ. මෙම අධ්‍යයනයෙන් ලබාගත් ප්‍රතිඵලයට අනුව සන්නාම වල විශ්වසනීයත්වය හා සන්නාම පිළිබඳ දැනුවත්භාවය අතර ඉහළ ධන අගයක් ඇති අතර සන්නාම ඇසුරු කිරීම හා ගුණාත්මක බව යන සාධක අතර අඩු අගයක් පවතී. අධ්‍යයනය අවසානයේ දී කරුණු අතර ආයතනය සාපේක්ෂව, සන්නාම ඇසුරු කිරීම සහ ගුණාත්මකභාවයට වඩා වැඩි අවධානයක් සන්නාම වල විශ්වසනීයත්වය සහ සන්නාම පිළිබඳ දැනුවත්භාවය යන සාධක කෙරෙහි යොමු කිරීමෙන් සන්නාම නාමය දියුණු කිරීමට හැකි වෙන බව පෙන්වයි.

***මුඛ්‍ය පදඃ*** *පාරිභෝගිකයා, සන්නාම කොටස්, විකුණුම් කාර්යය සාධනය*

[1]සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, whdschandrasena@gmail.com

# පුස්තකාල සේවකයින්ගේ සේවා තෘප්තිමත්භාවය (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. එම්. විජේසිංහ[1]

**සංක්ෂේපය**

ජාතික හා ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොලට සුදුසු උපාධිධාරීන් බිහි කිරීමට සමත් විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් මෙරට තවමත් ස්ථාපිතව නොමැත යන චෝදනාව පසුගිය දශක කිහිපය තුළ මෙරට විශ්වවිද්‍යාල අධ්‍යාපනයට එල්ල වෙමින් පවතී. මේ සඳහා බලපාන සාධක හා වගකිව යුතු අංශ රාශියක් පවතී. මෙම ගැටළුකාරී පරිසරය නිර්මාණය වීමට මුල් වූ තවත් අංශයක් ලෙස පුස්තකාල සේවකයින් පෙන්වාදිය හැකිය. කැලණිය විශ්වවිද්‍යාලය තුළ පුස්තකාල සේවකයින් තම රැකියාව පිළිබද තෘප්තිමත්ද යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ ගැටළුව වේ. කැලණිය විශ්වවිද්‍යාලය තුළ පුස්තකාල සේවකයින්ගේ රැකියා තෘප්තිමත්භාවය සාධක කිහිපයක් ඔස්සේ විමසා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. කැලණිය විශ්වවිද්‍යාලය තුළ පුස්තකාල සේවකයින්ගේ රැකියා තෘප්තිමත්භාවයට බලපාන ගැටළුකාරී තත්ත්වයන් සඳහා බලපාන සාධක හඳුනාගෙන විකල්ප යෝජනා හා විසඳුම් ඉදිරිපත් කිරීම මෙහි උප අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පුස්තකාල සේවකයින් නියදිය සඳහා යොදා ගන්නා ලදී. දත්ත රැස්කිරීමේ ප්‍රධාන ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. ද්විතීක දත්ත වශයෙන් මෙම ක්ෂේත්‍රයට අදාළ සංඛ්‍යා ලේඛන, වාර්තා යොදා ගන්නා ලදී. ලබා ගන්නා ලද දත්ත කයි වර්ග පරීක්ෂාව, විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, වගු හා ප්‍රස්තාර හරහා දත්ත විශ්ලේෂණය කර නිගමන ලබා ගන්නා ලදී. පුස්තකාල සේවකයින්ගෙන් 75%ක් ස්ත්‍රීන් වන අතර 25%ක් පුරුෂයින් වේ. මෙම අධ්‍යයනය තුළ පුස්තකාල සේවකයින්ගේ රැකියා තෘප්තිමත්භාවය කෙරෙහි ඍැකස්ඉසකසඑහ (පුස්තකාලය පිළිබද විශ්වසනීයත්වය), Assurance (තම සේවාවන් ඉටු කිරීමේදී ඉහළ නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය පිළිබද තෘප්තිමත්භාවය), Responsiveness (නව තාක්ෂණික සේවාවන් පිළිබද දැනුවත් කිරීම,වැටුප පිළිබද තෘප්තිමත්භාවය) යන සාධක බලපාන බවත් Tangible (පුස්තකාලය තුළ කාර්යයන් ඉටුවන අනුපිළිවෙල, රථවාහන ගාල් කිරීම පිළිබද ඉඩපහසුකම් පිළිබද තෘප්තිමත්භාවය), Empathy (නිවැරදි දැනුවත්භාවයක් ලබා දීම, පරිපාලනය තමා සමග මිත්‍රශීලීව කටයුතු කිරීම පිළිබද තෘප්තිමත්භාවය) යන සාධක බලපෑමක් නොමැති බවත් නිගමනය කළ හැක.

***මුඛ්‍ය පද:*** *පුස්තකාල සේවකයින්, සේවක තෘප්තිමත් භාවය, කැලණිය විශ්වවිද්‍යාලය*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, Madhumali93wasana@gmail.com

# රාජ්‍ය හා පෞද්ගලික බැංකු දෙඅංශයෙහි කාර්යක්ෂමතාවය හා විශ්වසනීයත්වය (කිරිබත්ගොඩ නගරය ඇසුරින්)

කේ. යු. එල්. උදයංගනී[1], ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. එම්. විජේසිංහ

## සංක්ෂේපය

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රය තුළ බැංකු විසින් සුවිශේෂී කාර්යය භාරයයක් ඉටු කරයි. ඒ සඳහා රාජ්‍ය බැංකු මෙන්ම පෞද්ගලික බැංකු ද එක ලෙස සක්‍රීයව දායක වේ. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකු මඟින් ගණුදෙනුකරුවන්ට ලබාදෙන සේවාවන්හි කාර්යක්ෂමතාව හා විශ්වසනීයත්වය රාජ්‍ය හා පෞද්ගලික බැංකු යන දෙඅංශය අනුව වෙනසක් පවතී ද යන්න සොයා බැලීම අප අධ්‍යනයේ ගැටළුව වේ. ඒ අනුව මෙහි ප්‍රධාන අරමුණ වන්නේ රාජ්‍ය හා පෞද්ගලික බැංකු මගින් ලබාදෙන සේවාවන්හි විශ්වසනීයත්වය හා කාර්යක්ෂමතාවය අතර වෙනසක් පවතී ද යන්න සොයා බැලීමයි. එමෙන්ම ඒ සඳහා බලපා ඇති සාධක අධ්‍යයනය මෙහි උප අරමුණක් වේ. කිරිබත්ගොඩ නගරයෙහි ලංකා බැංකුව, මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව යන හතරෙහි 25 බැගින් 100 ක් පහසු නියදීම යටතේ තෝරා ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත රැස් කරන ලදී. මහ බැංකු වාර්තාව හා සඟරා මගින් ද්වීතියික දත්ත රැස් කරන ලදී. කයි වර්ග පරීක්ෂාව, විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම, පෙළ පරීක්ෂාව, වගු හා ප්‍රස්තාර මඟින් Excel, SPSS, Mini tab යන මෘදුකාංග භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය සිදු කර අවසන් නිගමනය ලබා ගන්නා ලදී. මෙම අධ්‍යයනය හරහා රාජ්‍ය බැංකු කෙරෙහි පාරිභෝගික විශ්වසනීයත්වය ඉහළ මට්ටමක පවතින බවත් පෞද්ගලික බැංකු කාර්යක්ෂමතාවයෙන් ඉහළ මට්ටමක පවතින බව නිගමනය ලෙස ලබා ගන්නා ලදී. නවීන තාක්ෂණය යොදා ගනිමින් රාජ්‍ය බැංකු තම කාර්යක්මතාවය වැඩි කර ගැනීමට උනන්දු විය යුතු යැයි මෙම අධ්‍යයනය හරහා සොයා ගන්නා ලදී.

***මූඛ්‍ය පද:*** *රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු, විශ්වසනීයත්වය, කාර්යක්ෂමතාව*

[1]සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, Madhumali93wasana@gmail.com

# අලෙවිකරණ උපායමාර්ග පාරිභෝගික මිල දී ගැනිම් කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යනයක් (මාතර නගරයේ ඇඟළුම් වෙළඳසල් ඇසුරින්)

ඒ. දොඩම්ගොඩගේ[1] , අයි. ජී. එස්. කුමාරි


## සංක්ෂේපය

වර්තමානය වන විට ඇහලුම් අලෙවිසැල් තම නිෂ්පාදන අලෙවිය කෙරෙහි දැඩි තරගයක නිරතව සිටියි. ඒ අතර දෘශ්‍ය වෙළඳාම යනු පාරිභෝගිකයා නිෂ්පාදනයන් කෙරෙහි ආකර්ෂණය කරවා ගැනීමට යොදා ගනු ලබන එක් උපක්‍රමයක් සේ දැක්විය හැකිය. "පාරිභෝගික ක්‍ෂණික මිලදී ගැනීම සහ දෘශ්‍ය වෙළඳාම අතර සම්බන්ධතාවය හඳුනා ගැනීම" අධ්‍යයනයේ අරමුණ වේ. ඒ අනුව, අලෙවිසැලේ අභ්‍යන්තර අනුරූ ප්‍රදර්ශනය, ප්‍රවර්ධන සලකුණ, කවුළු මගින් භාණ්ඩ නිරූපණය, සහ අලෙවිසැලේ කලාප සැකසුම වශයෙන් ප්‍රධාන අංශ හතරක් යටතේ දෘශ්‍ය වෙළඳාම හඳුනා ගන්නා ලදී. ප්‍රමාණාත්මක දත්ත යොදා ගනිමින් සිදුකරන ලද පර්යේෂණය සඳහා ලිකර්ට් දර්ශකය සහිත ප්‍රශ්නාවලී ලබාදී, දත්ත රැස්කරගෙන ඇත. පර්යේෂණයේ නියැදිය ලෙස තෝරාගනු ලැබුවේ ඇඳුම් අලෙවිසැල් තුළින් ඇඳුම් මිලට ගැනීමට පුරුදු වී සිටින පිරිස අතුරින්, සසම්භාවී ලෙස තෝරාගත් 10ක් වූ පාරිභෝගිකයනගෙන් සමන්විත නියැදියකි. ලබාගත් දත්ත SPSS මෘදුකාංගය යොදාගෙන විශ්ලේෂණය කර ඇති අතර, එහි දී කයි වර්ග පරීක්ෂාව, හරහා විශ්ලේෂණය කර ඇත. අධ්‍යයනයේ දී අනාවරණය කරගෙන ඇත්තේ, කවුළු මගින් ඇඳුම් ප්‍රදර්ශනය කිරීම, ගබඩා කළාප ගත සැකසුම අභ්‍යන්තර අනුරූ ප්‍රදර්ශනය, ප්‍රවර්ධන සලකුණ යන විචල්‍යයන් හතරම පාරිභෝගික ක්‍ෂණික මිලදීගැනීමේ චර්යාව සමඟ ප්‍රභල සම්බන්ධතාවයක් පවතින බවය. ප්‍රවර්ධන සළකුණ නැමති විචල්‍ය පාරිභෝගික ක්‍ෂණික මිලදීගැනීමේ චර්යාවට ප්‍රබල සම්බන්ධතාවයක් පවතින බව හඳුනාගත හැකි විය. විශේෂයෙන්ම අලෙවිකරුවන්ට අලෙවිසැල තුළ ප්‍රවර්ධන ක්‍රමවේදය භාවිතයෙන් ආයතනික සාර්ථකත්වයට පත්විය හැකිබව මෙම අධ්‍යයනය මගින් යෝජනා කළ හැකිය.


***මුඛ්‍ය පදඃ*** *දෘශ්‍ය අලෙවිකරණය, පාරිභෝගික ක්ෂණික මිලදී ගැනීම, කවුළු භාණ්ඩ ප්‍රදර්ශනය, ප්‍රවර්ධන සළකුණ*

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, රුහුණු විශ්වවිද්‍යාලය, ashanshanaka192@gmail.com

# *MASS COMMUNICATION*

# *AND*

# *INFORMATION TECHNOLOGY*

# Preservation of Films as Cultural Heritage of a Nation (Special Reference to Sri Lankan Film Industry)

I. Ruwanpathirana[1]

## ABSTRACT

Film is a collective art form, the cinema is a highly synthesized art. It is incorporated with music, dancing, drama, poetry, literature, sculpting, interior designing, painting, martial arts and many other different expressions of human totality. And it communicates through visuals and sounds. Visual is dominant and the sound comes next. What are these visuals and what are these sounds? That's nothing else, these are the visuals of what we see in our day today lives and what we here every day or these are something we dream, imagine. Films have documented this world for more than one hundred and twenty years. Filmmakers have captured how generations of people have lived, worked, and dreamed. Then the cinema is seemed to be a modern electronic chronicle which is successfully recorded all the complexities, paradoxes, lineal developments or downfalls of country's human being. Sri Lanka has produced around more than 1310 main stream films & large amount of documentaries and news reels. And Sri Lanka is acclaimed for generating internationally demarcated film makers and their awarded films But Sri Lanka still doesn't have at least one proper film archive. Forming a film archive is still an unsolved problem in Sri Lanka. The objectives of this study are investigating the existing film preservation practice in Sri Lanka and emphasize the importance of film preservation for a country as their nation heritage. This research was conducted as a desk study. This study has articulated number of secondary data. These materials have sufficiently been utilized for the paper. Preliminary data have been gathered by using personal interviews and did one case study in order to study some important areas of the research. It was found by this study that Sri Lanka does not have a state controlled technically organized system for film preservation. Since the country does not have a national film archive, this entity has been recognized as a lucrative commercial zone by the private entrepreneurship. Initially they were film enthusiastic people and film collectors who did not have a sufficient knowledge or the technology for preservation.

***Key Words:*** *Preservation, Film, Film Preservation, Intangible Cultural Heritage, Sri Lankan Film Industry*

[1] Department of Mass Communication, University of Kelaniya, ilekahansanie@gmail.com

# යුධ වාර්තාකරණය සහ ඡායාරූප ජනමාධ්‍යවේදියා (ශ්‍රී ලංකාවේ යුද්ධයට විශේෂිතව)

එච්. ඒ. ජී. මධූශංඛ[1]


## සංක්ෂේපය

දශක තුනක කාලයක් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය, දමිල ඊලාම් විමුක්ති කොටි සංවිධානය සහ ශ්‍රී ලංකාවේ රජය අතර පැවතිණ. ගැටුම් වාර්තාකරණයේදී යුද්ධය විශේෂ ගැටුම්කාරී අවස්ථාවකි. ඊලාම් යුද්ධය වාර්තා කිරීමේදී ඡායාරූප ජනමාධ්‍යවේදීන් යුද වාර්තාකරණයේ විශේෂ නිපුනතා සතු වූවන්ද යන්න මෙම පර්යේෂණයේ ගැටළුව වේ. ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය වාර්තා කිරීමේදී ඡායාරූප ජනමාධ්‍යවේදීන් සතු වූ නිපුනතා අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කර ඇත. ශ්‍රී ලංකාවේ යුද්ධය වාර්තා කිරීමට යුද කලාපයට ගිය ජාතික පුවත්පත්හි සේවය කරන ජනමාධ්‍යවේදීන් 10 දෙනෙකු සහ විදේශීය ප්‍රවෘත්ති නියෝජිත ආයතන වල සේවය කරන ලාංකික මාධ්‍යවේදීන් 5 දෙනෙකු නිපුනතා පරීක්ෂා කිරීම සඳහා ආකෘතිගත සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන ලදී. මෙහි දී සම්මුඛ සාකච්ඡාවට තෝරාගන්නා ලද පුවත්පත්හි ඡායාරූප ජනමාධ්‍යවේදීන් 7 දෙනෙකු ඡායාරූප ජනමාධ්‍යවේදීන් වන අතර 3 දෙනෙක් වෘත්තියෙන් ලේඛනයේ යෙදෙන මාධ්‍යවේදීන් වේ. නමුත් මේ තිදෙනා ඡායාරූප ජනමාධ්‍යවේදියෙකු නොමැතිව යුද කලාපයේ වාර්තාකරණයට ගොස් තමන් විසින් ම ඡායාරූප ලබාගත් ජනමාධ්‍යවේදීන් වේ. ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත සවිස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ශ්‍රී ලංකාවේ ඡායාරූප ජනමාධ්‍යවේදීන් යුද වාර්තාකරණයේ යෙදී ඇත්තේ යුද කලාපයකදී කටයුතු කළයුතු ආකාරය පිළිබඳව මූලික අවබෝධයකින් තොරවය. ඇතැම් මාධ්‍යාවේදීන් ගැටුම් වාර්තාකිරීම සඳහා සිවිල් සමාජයේ අත්දැකීම් යුක්ත වූවන් වුවත් එම අත්දැකීම් යුද කලාපයකට ප්‍රමාණවත් නොවේ. යුද කලාපයකට ඇතුලුවීමේදී තිබිය යුතු අනිවාර්ය මූලික සූදානම් වීම් පිළිබඳවද අවබෝධයක් නොමැති අතර යුද කලාපයක දී ගතයුතු ප්‍රථමාධාර සහ පුද්ගලික ආරක්ෂාව වැනි තත්ත්වයන්හිදී කටයුතු කළයුතු ආකාරය පිළිබඳව දැනුමක් නොමැත. අත්දැකීම් මත ලබාගත් පරිචයෙන් වාර්තාකිරීමේ යෙදුනද මූලික පුහුණුවක් ලැබූවන් නොවේ. එම නිපුනතා මට්ටම යුද වාර්තාකරණයේ යෙදීම සඳහා ඉහළ මට්ටමක් නොවේ. විදෙස් ප්‍රවෘත්ති නියෝජිත ආයතනයන්හි මාධ්‍යාවේදීන්ට එම ආයතනයන්ගෙන් යුද වාර්තාකරණය සඳහා පුහුණුවක් ලැබ තිබීම හේතුවෙන් මාධ්‍යවේදීන් සතු නිපුනතා ඉහළ මට්ටමක ඇත. යුද වාර්තාකිරීම සඳහා මාධ්‍යවේදීන්ට පුහුණුවක් ලබාදිය යුතුය. ජනමාධ්‍ය විෂය උගන්වන විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතනයන්හි විෂය නිර්දේශ සඳහා ගැටුම් වාර්තාකරණය විෂය ඇතුළත් කළ යුතුය. ගැටුම් වාර්තා කිරීම පිළිබඳ න්‍යායික හා ප්‍රායෝගික පුහුණු වැඩමුළු ජනමාධ්‍යවේදීන් සඳහා පැවැත්විය යුතුය.


***මුඛ්‍ය පද:*** *ඡායාරූප ජනමාධ්‍යවේදය, යුද්ධය, යුධ වාර්තාකරණය, නිපුනතා, ගැටුම් වාර්තාකරණය*

[1]ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, gayan123gayan@gmail.com

# මහජන පුස්තකාල තුළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පදනම් පාඨක සේවා පිළිබඳ අධ්‍යයනයක්: බදුල්ල දිස්ත්‍රිකයේ තෝරාගත් මහජන පුස්තකාල ඇසුරින්

ඩබ්ලිව්. ආර්. එන්. ඉන්දචාපා[1]

තොරතුරු පදනම් කර ගත් ලෝකයේ පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන වලට මෙන්ම තොරතුරු සපයනු ලබන සෑම ආයතනයකටම පාහේ වර්තමානය වන විට ස්වයංක්‍රියකරණය හා සංඛ්‍යාකරණය (Digitalization) ආගමනය වී ඇත. පුස්තකාලයන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය බද්ධ වීම නිසා පාඨකයන්ට ලබා දෙන සේවාවන්ද නවීකරණය වී ඇත. මේ හේතුවෙන් වඩා ඵලදායි හා කාර්යක්ෂම ලෙස කාර්‍යයන් සිදුවේ. පුස්තකාල මගින් ලබා දෙන විමර්ශණ සේවය, සංසරණ සේවය, වාර සඟරා සේවය, අන්තර් පුස්තකාල පිරුළු සේවය, වෙනත් සේවා මෙන්ම විශේෂිත සේවාවන් තුළටද තොරතුරු සන්නිවේදන තාක්ෂණය බද්ධ වී කාර්යයන් පහසු කරවා ඇත. මෙලෙස නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමඟ තොරතුරු සන්නිවේදන තාක්ෂණික මෙවලම් පුස්තකාලය තුළ භාවිතයත් සමග එහි පාඨකයින් වෙත වටිනාකමින් ඉහළ තොරතුරු සේවා වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබා දී ඇත. එහි වෙබ් පාදක මාර්ගගත පොදු ගවේෂණ සූචිය (OPAC), ජාලගත සංඛ්‍යාංක තොරතුරු මූලාශ්‍ර ,විද්‍යුත් පාදක අන්තර් පුස්තකාල පිරුළු සේවා සහ ලේඛන සැකසීමේ සේවා මාර්ගගත පාඨක අධ්‍යාපනය පාඨක උපදේශන සහ ඉලෙක්ට්‍රෝනික උපදේශන සේවා ආදිය මගින් තොරතුරු වෙත පහසු ප්‍රවේශ වීමේ හැකියාව ලබා දී ඇත. ඒ අනුව නව තාක්ෂණය මුසු කරමින් පාඨක සේවා ලබා දීමට මහජන පුස්තකාලයන්ද කටයුතු කර තිබෙන අතර ඒ දෙසට යොමු නොවන පුස්තකාලයන්ද තිබෙන බව මෙම අධ්‍යනයෙන් අවබෝධ කර ගැනීමට හැකියාව ලැබී ඇත. එලෙසම අන්තර්ජාලය වැනි නවතම තාක්ෂණයන් හේතුවෙන් මහජන පුස්තකාල වෙතට ඉහළ ඉල්ලුමක් ලැබී ඇති බවද දැකගත හැකිය. තොරතුරු තාක්ෂණය පදනම් පාඨක සේවාවන් කෙතරම් ප්‍රමාණයක් මහජන පුස්තකාල තුළ භාවිතා කරනවාද යන්න පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම හා පාඨක සේවා සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිතා නොකරන මහජන පුස්තකාල පිළිබද අවබෝධයක් ලබා ගැනීම මෙම අධ්‍යනයේ මූලික අරමුණු වේ. මෙම පර්යේෂණය ප්‍රථමික දත්ත හා ද්විතීක දත්ත මත පදනම්ව සිදු කරනු ලැබූ අතර ප්‍රථමික දත්ත නිරීක්ෂණය, ප්‍රශ්නාවලී හා සම්මුඛ සාකච්ජා මගින් තොරතුරු ලබා ගන්නා ලදී.මෙම පර්යේෂණය සඳහා බදුල්ල දිස්ත්‍රිකයට අයත් වැලිමඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මහජන පුස්තකාල කිහිපයක නියැදියක් යොදා ගනු ලැබූ අතර මහජන පුස්තකාල පාඨක සේවා සඳහා තොරතුරු තාක්ෂණය භාවිතා කර ඇත්තේ කෙසේද යන්න පිළිබදව මෙම පර්යේෂණයේදී පර්යේෂණාත්මකව අධ්‍යයනයට බඳුන් කර ඇත.

***මුඛ්‍ය පද:*** *මහජන පුස්තකාල, තොරතුරු මධ්‍යස්ථාන, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, පාඨක සේවා, ස්වයංක්‍රියකරණය*

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය nayanachapa15@gmail.com

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි කාර්යමණ්ඩලය අතර සන්නිවේදන කටයුතු සඳහා නවීන සන්නිවේදන මාධ්‍යයන්හි භාවිතය පිළිබඳ අධ්‍යයනයක්

එම්.ඩී.එස්.එම්. සංජීවනී[1], වයි.ඩබ්.එන්.ඩී. අමරසූරිය

**සංක්ෂේපය**

ආරම්භක අවධියේ පැවති සාම්ප්‍රදායික සන්නිවේදන මාධ්‍යයන් ක්‍රමයෙන් පරිණාමය වී වර්තමානය වන විට නව සන්නිවේදන මාධ්‍යයන් කේන්ද්‍ර කොටගත් තොරතුරු සමාජයක් බිහිව පවතී. එය දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික සහ ආගමික යනාදී සෑම ක්ෂේත්‍රයක් කෙරෙහිම බලපා ඇත. ඒ අනුව පුස්තකාල ක්ෂේත්‍රය තුළද සන්නිවේදනය සහ තොරතුරු තාක්ෂණය යටතේ පෙර නොවූ විරූ පෙරළියක් සිදුව තිබේ. මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි කාර්ය මණ්ඩලය අතර සන්නිවේදන කටයුතු සඳහා භාවිත වන නවීන සන්නිවේදන මාධ්‍යයන් පිළිබඳව අධ්‍යයනයක් සිදු කර තිබේ. මෙහි මූලික අරමුණ වන්නේ විශ්වවිද්‍යාල පුස්තකාල විසින් කාර්යමණ්ඩලය අතර සන්නිවේදන කටයුතු පවත්වා ගැනීම සඳහා භාවිත කරනු ලබන නවීන සන්නිවේදන මාධ්‍යයන් මොනවාද යන්න සහ ඒවා කොතෙක් දුරට භාවිත කරන්නේද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමයි. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස සමීක්ෂණ ක්‍රමය භාවිත කරන ලදි. මේ සඳහා සංගහනය ලෙස ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල 15 යොදා ගනු ලැබූ අතර මේ අතුරින් අහඹු ලෙස තෝරාගත් විශ්වවිද්‍යාල පුස්තකාල 8ක් නියැදිය වශයෙන් තෝරා ගන්නා ලදි. තෝරා ගත් පුස්තකාලවල පුස්තකාලයාධිපතීන් වෙත ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම මගින් දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදි. මෙම අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි කාර්යමණ්ඩලය අතර සන්නිවේදන කටයුතු සඳහා නවීන සන්නිවේදන මාධ්‍යයන් භාවිතය මධ්‍යස්ථ මට්ටමක පවතින බව පෙන්වා දිය හැකිවේ. පුස්තකාල කාර්යමණ්ඩලය සඳහා තවදුරටත් නවීන සන්නිවේදන ක්‍රම පිළිබඳව පවත්නා අඩු අවබෝධය, තොරතුරු තාක්ෂණික මෙවලම් භාවිතය අඩු මට්ටමක පැවතීම, තොරතුරු තාක්ෂණයට අනුගතවීම සඳහා ප්‍රමාණවත් අභිප්‍රේරණයක් නොතිබීම ආදි සාධකයන් ඉහත තත්ත්වය සඳහා බලපා තිබෙන බව හඳුනාගත හැකිවිය.

***මුඛ්‍ය පද:*** *විශ්වවිද්‍යාල පුස්තකාල, පුස්තකාල කාර්යමණ්ඩලය, සන්නිවේදනය, නවීන සන්නිවේදන මාධ්‍යයන්, ශ්‍රී ලංකාව*

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, subashinimadumalika95@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන්ගේ තොරතුරු හා තොරතුරු සාක්ෂරතාවය පිළිබඳ අධ්‍යයනයක් කැලණිය විශ්වවිද්‍යාලයට විශේෂිතව

වී. යු. එම්. ඩී. කුමාරි[1]

**සංක්ෂේපය**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තොරතුරු ගලා ඒම හේතුවෙන් තොරතුරු සුලබතාවයක් දක්නට ලැබේ. විවිධ සන්නිවේදන මාධ්‍යයන් භාවිත කරමින් පාඨකයා තොරතුරු අවශ්‍යතා සපුරා ගනී. තොරතුරු බිහිවීමේ වේගය, තොරතුරු වලට ඇති ඉල්ලුම හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය වැනි කරුණු මත තොරතුරු සාක්ෂරතාවයක අවශ්‍යතාවය පිළිබඳව මෑතක සිට දැඩි අවධානයට යොමුවී තිබේ. තොරතුරු සාක්ෂරතාවය යනු කියවීමේ හා ලිවීමේ හැකියාවට වඩා තොරතුරු ගවේෂණ හැකියාවන්ගෙන් යුත් තත්වයකි. තොරතුරු සාක්ෂරතාවය සහිත පුද්ගලයන් තොරතුරු අවශ්‍යතාවක් ඇති වූ විට එය හඳුනා ගැනීමේ හැකියාව මෙන්ම එය ඉටුකර ගැනීම සඳහා තොරතුරු සොයාගැනීම, ඇගයීම හා ඵලදායි ලෙස භාවිතයට හැකියාව සතු පුද්ගලයකු වේ. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් තුළ මෙම හැකියාව පැවතිය යුතුය. තොරතුරු ග්‍රාහකයා තමන්ට අවශ්‍ය තොරතුරු මොනවාද, නිවරදි තොරතුර කුමක්ද යන්න තීරණය කිරීමේ දී ඔහු සතුව කුසලතාවයන් හා හැකියාවන් තිබිය යුතුය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ තොරතුරුවල වැදගත්කම පිළිබඳවත්, තොරතුරු ග්‍රහණය කරගැනීමට වර්ධනය කරගත යුතු කුසලතා පිළිබඳවත්, විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් තුළ තොරතුරු සාක්ෂරතාවය වර්ධනය කරගන්නා ආකාරය පිළිබඳවත් අධ්‍යයනය කිරීමය. මෙම පර්යේෂණයේ දත්ත ව්‍යුහගත කිරීම සඳහා ප්‍රාථමික දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ආදිය යොදා ගැනුණි. මෙහි විශ්ලේෂණ ක්‍රමවේදය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනුණි. ලබාගත් දත්ත විශ්ලේෂණයට අනුව පැහැදිලි වූයේ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අන්තර්ජාලය භාවිත කරමින් තොරතුරු ගවේෂණය නිසා ඔවුන්ට විවිධ වු ඵලදායි තොරතුරු ලබා ගැනීමට හැකියාව ලැබෙන බවත් , තොරතුරු ග්‍රහණය කරගැනීමට අවශ්‍ය වන්නා වූ කුසලතා පිළිබඳව ඇති දැනුම අවම බවත් දක්නට ලැබේ.

***මුඛ්‍ය පද:*** *තොරතුරු, තොරතුරුවල වැදගත්කම, තොරතුරු සාක්ෂරතාව, තොරතුරු සාක්ෂරතා ආදර්ශන, තොරතුරු තාක්ෂණය*

[1]පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, manuuok199466@gmail.com

# නවීන තොරතුරු තාක්ෂණය හමුවේ විද්‍යුත් තොරතුරු ගවේෂණ උපක්‍රම පිළිබඳ පවතින දැනුවත්භාවය පිළිබඳ අධ්‍යයනයක් : කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යාර්ථීන් ඇසුරින්

පී. බී. අයි. මධුමාලි[1]

**සංක්ෂේපය**

21 වන සියවස තුළ දැනුම හා තොරතුරුවල බහුලතාවය හමුවේ තොරතුරු පුපුරා යාමකට ලක්ව ඇත. එබැවින් උසස් අධ්‍යාපනයෙහි නිරතවන විද්‍යාර්ථීන්හට අධ්‍යාපනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ තොරතුරු තාක්ෂණය හරහා බොහෝ තොරතුරු අවශ්‍යතා හා උවමනා සංතෘප්ත කර ගැනීමට නිතැතින්ම අන්තර්ජාලය භාවිතා කිරිමට සිදු වේ. ඒ අනුව විවිධ වූ අවශ්‍යතා මත තොරතුරු ගවේෂණය කිරිමට විද්‍යුත් තොරතුරු ගවේෂණ ශිල්පක්‍රම අවැසි වන්නා සේම ඒ හරහා අවශ්‍ය තොරතුරු, අවශ්‍ය වේලාවට නිවැරදි ආකාරයෙන් සොයාගැනීමට මෙමගින් හැකියාව ලැබේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සීඝ්‍ර දියුණුවත් මූලික කරගෙන තොරතුරු ගවේෂණය ද සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම අභිබවා යම්කිසි ආකාරයක වර්ධනීය තත්ත්වයකට පත්ව ඇත. එවන් කාල වකවානුවක තොරතුරු ගවේෂණ උපක්‍රම පිළිබඳ පවතින දැනුවත්භාවය ඉතා අවම මට්ටමක පැවතීම මෙහි පර්යේෂණ ගැටළුව විය. එසේම මෙහිදි මූලික අරමුණු වූයේ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් අධ්‍යාපනික කටයුතු සඳහා අවැසි තොරතුරු සමුද්ධකරණය කර ගැනීමට භාවිතා කරන ශිල්ප ක්‍රම මොනවාද? විද්‍යුත් තොරතුරු ගවේෂණ ප්‍රමුඛ පද සහ ඒ හරහා ලබා ගත හැකි වාසි, ප්‍රයෝජන පිළිබඳ පවතින දැනුවත්භාවය කෙසේද? යන්න අධ්‍යයනය කිරිම සහ නවීන විද්‍යුත් මූලාශ්‍ර පිළිබඳ දැනුවත්භාවය ලබා දීමත් ඒ සඳහා අවැසි යෝජනා ඉදිරිපත් කිරිමයි. මෙහිදි දත්ත ව්‍යුහගත කිරිම උදෙසා ප්‍රාථමික මූලාශ්‍ර සහ ද්විතියික මූලාශ්‍ර යොදාගත් අතර ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි ද ද්විතියික මූලාශ්‍ර ලෙස පොත්පත් හා වාර සඟරා මඟින් දත්ත රැස් කරන ලදී. ප්‍රමුඛ වශයෙන් නිරීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ දත්ත රැස් කරන ලදී. මෙහිදී සම්ප්‍රදායික තොරතුරු ගවේෂණ ක්‍රම අභිබවා නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම හරහා ලැබෙන පිටුවහල දත්ත රැස් කිරිමේ නිර්ණායක ලෙස යොදා ගැනිණි. උසස් අධ්‍යාපනය තුළ නිරතවන්නන් වශයෙන් විද්‍යුත් තොරතුරු ගවේෂණ ශිල්ප ක්‍රම පිළිබඳ පවතින දැනුවත්භාවය සාමාන්‍ය ප්‍රතිශතයක් ගන්නා බවත් සාම්ප්‍රදායික ක්‍රමවේද ඔස්සේ ඉගෙනුම් කාර්යය තවදුරටත් සිදු කරන බවත් මෙහිදි හඳුනාගැනිණි. ස්වයං අධ්‍යාපනයෙහි නිරත වන විද්‍යාර්ථීන් තුළ වෙනස්වන ලෝකය පිළිබඳව මෙන්ම විද්‍යුත් තොරතුරු ගවේශණ උපක්‍රම පිළිබඳවද පුළුල් දැනුවත්භාවයක් පැවතිය යුතුය. නමුත් මෙහිදී උපන්‍යාසය වශයෙන් ප්‍රස්තුත වූයේ තොරතුරු තාක්ෂණය කොතරම් දියුණු වුව ද ඒ හරහා අධ්‍යාපනික වශයෙන් ලබාගත හැකි දැනුම් පන්නරය මෙන්ම විද්‍යුත් තොරතුරු ගවේෂණ ක්‍රම පිළිබඳ පුළුල් දැනුම් මට්ටමක් නොමැති බවයි.

***මුඛ්‍ය පද:*** *තොරතුරු තාක්ෂණය, තොරතුරු ගවේෂණය, ගවේෂණ ශිල්පක්‍රම, සෙවුම් වර්ග, උසස් අධ්‍යාපනය*

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, madhumaliiresha80@gmail.com

# මුද්‍රා නාටක තුළ දැකිය හැකි අන්තර් සංස්කෘතික ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක් (චිත්‍රසේනයන්ගේ මුද්‍රා නාට්‍යන්ට විශේෂිතව)

ආර්. බී. ආර්. ඒ. සකුන්තලා[1]

## සංක්ෂේපය

සෑම රටකටම තමාට ආවේණික වු මුද්‍රා නාට්‍ය සම්ප්‍රදායක් ඇති අතර එකී රටේ නර්තන ක්‍රමයන්ට අනුගතව ඇති නිසා එක් එක් රටවල මුද්‍රා නාට්‍ය අතර පොදු සමානාර්ථයක් දක්නට නොමැත. නර්තන කලාවේ උල්පත වශයෙන් මුද්‍රා නාට්‍ය හඳුනා ගත හැක. ආදි මානවයා වචනය සොයා ගැනීමට පෙර අදහස් ප්‍රකාශ කරනු ලැබුවේ ආංගික අභිනයෙනි. වචනය අතික්‍රමණය කළ සංගීතයත්, වචනයට පූර්වයේ පැවති නර්තනයත් යන කාරණා ද්විත්වයෙහි අනුකූලතා පූර්වක සුසංයෝගය වන්නේ මුද්‍රා නාට්‍යයයි. රංග වස්ත්‍ර, පසුතල දර්ශන, ආලෝකය ආදී මේ සියල්ල සමග ප්‍රේක්ෂකයා චමත්කාරජනක ලෝකයකට ගෙනයා හැකි ප්‍රබල කලාවක් වන මුද්‍රා නාට්‍යය හුදු චමත්කාරයෙන් නිමා වන සාමාන්‍ය නර්තනයක් පමණක් නොවන බව අවිවාදය. දේශීය මුද්‍රා නාට්‍ය කලාවේ ආරම්භකයා ලෙසින් චිත්‍රසේනයන් හඳුනා ගැනේ. චිත්‍රසේනයන් භාරතයේ ශිල්ප හදාරා සියරට එන සමයේ මෙරට පාරම්පරික නර්තන කලාව ඉතා දිළිඳු අවධියක තිබිණි. මෙකල ඔහු එළඹ සිටියේ තුංමංසලකටය. සම්ප්‍රදාය රැකගෙන සිටීම, නව නිර්මාණයකට ප්‍රවේශ වීම හෝ සම්ප්‍රදාය රකිමින් නව නිර්මාණ කිරීම එම මං තුනයි. ඔහු තෝරා ගනු ලැබුවේ සම්ප්‍රදාය රකිමින් නව නිර්මාණ කිරීමේ ප්‍රගතිශීලී මාර්ගයයි. චිත්‍රසේන ශූරීන්ගේ නිර්මාණ මුද්‍රා නාට්‍ය හා නර්තනය යන අංශ යටතේ වර්ධනය වී ඇත. කවර හෝ ජාතියක සංස්කෘතියක මුලයන් අමතක කර කරන්නාවූ නිර්මාණ නිසා ජාතියක් වියවුලකට පත් වීම අනිවාර්ය බව ප්‍රකාශ වන සංස්කෘතිය පිළිබඳ යුනෙස්කෝ නිර්වචනය චිත්‍රසේන නම් නර්තන ප්‍රාඥයා තම නිර්මාණයට ගුරු කොට ගත්තේය. නල දමයන්ති, හිම කුමරි, කරදිය, රන් කිකිළි හා නෘත්‍යාංජලී, විදුර, රාවණා යන නිෂ්පාදන සියල්ල මෙරට මුද්‍රා නාට්‍ය ක්ෂේත්‍රයේ වපසරිය පුළුල් කරන්නාවූ චිත්‍රසේනයන්ගේ පර්යේෂණාත්මක නිර්මාණ ලෙස හඳුනා ගත හැක. මෙහි විශේෂත්වය වන්නේ භාරතීය නර්තන විලාශ, භාරතීය කතා පුවත් සිය නිර්මාණ සඳහා භාවිතා කීරිමයි. ශාන්තිකර්මයටත්, පෙරහරටත් ජන කලාවක් ලෙස භාවිතා වූ උඩරට, පහතරට, සබරගමු නර්තන කලාවන් විනෝදාස්වාද මාර්ගයන් ලෙස සංවර්ධනය කර නූතන 'ප්‍රොසීනියම්' වේදිකාවට සරිලන ලෙස ප්‍රතිනිර්මාණය කිරිමේ පුරෝගාමියා වූයේ ද චිත්‍රසේනයන්ය. මෙම අධ්‍යයනය සවිස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ද්විතීක දත්ත මත සිදු කරන ලදී. දේශිය නර්තනයේ මූලයන් රඳවාගෙන බටහිර දියුණු ජගත් නර්තන කලාවන්හි විචාරවත් ආභාසය ලබා ගැනීමේදී ප්‍රඥාවන්ත ප්‍රථම නර්තනවේදීයා වශයෙන් අවිවාදයෙන් පිළිගත් චිත්‍රසේනයන්ගේ නිර්මාණ හා බැඳි අන්තර් සංස්කෘතික ලක්ෂණ ඔහුගේ මුද්‍රා නාට්‍යයන්ට විශේෂිතව විමසා බැලීම මෙහි මුඛ්‍ය අරමුණ විය.

***මුඛ්‍ය පදඃ*** *මුද්‍රා නාට්‍ය, අන්නර් සංස්කෘතිය, බලපෑම, නර්තන කලාව, නාට්‍ය*

[1] ජසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, anjusenadhi94@gmail.com

# ශ්‍රී ලංකාවේ දේශපාලන මැතිවරණ ක්‍රියාදාමය තුළ මහජන මතය සකස් කිරීමේලා භාවිතා කරන නව මාධ්‍යයක් ලෙස මුහුණු පොතෙහි (facebook) ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනයක්

එන්. එම්. එල්. විමලරත්න[1]

**සංක්ෂේපය**

වර්තමාන තොරතුරු සමාජ පද්ධතිය කෙරෙහි නව මාධ්‍යයේ ආගමනය සිදු වී ඇති අතර මානව සමාජය එහි පවතින වෙනස්කම් වෙත අනුවර්තනය වෙමින් පවතී. නව මාධ්‍ය සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන හා ආගමික ආදී සියලුම ක්ෂේත්‍ර කෙරෙහි බලපෑම් සිදුකරන අතර ප්‍රබලතම බලපෑමක් සිදු කරනුයේ දේශපාලන ක්ෂේත්‍රයටයි. විශේෂයෙන්ම මැතිවරණ කාලසීමාවන්හිදී නව මාධ්‍යයේ බලපෑම ප්‍රබලවම නිරූපණය වන්නේය. එකී කාලවකවානුව තුළ දේශපාලනය සහ නව මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී. ශ්‍රී ලංකාව තුළ 1982 සිට 1999 කාල පරාසයට වඩා මෑත කාලය ගත් විට මැතිවරණ හා දේශපාලන සිදුවීම් හරහා මහජන මතය වෙනස් කිරීමෙහිලා භාවිතා කරන දේශපාලන සන්නිවේදනය සහ නව මාධ්‍යයේ භූමිකාව ප්‍රබල වී ඇති බවට සමාජයේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය හා ඒ ආශ්‍රිත අධ්‍යනය තුළින් අනාවරණය වේ. මෙම පර්යේෂණය මගින් මැතිවරණ ක්‍රියාවලිය සඳහා බලපෑම් කරන මුහුණු පොතේ භූමිකාව පිළිබඳ දත්ත ලබා ගැනීමට සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි හා නිරීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ දත්ත රැස් කරන ලදී. මැතිවරණ කටයුතු සන්නිවේදනය සඳහා යොදාගන්නා ප්‍රචාරණ විධි, ඒ සඳහා කරන පෙළඹවීම් ඔස්සේ මහජන මතය සඳහා වන බලපෑම්, දේශපාලන සන්නිවේදනය තුළ දේශපාලන සංවිධාන, ප්‍රේක්ෂකයින් සහ මාධ්‍යය යන ප්‍රධාන මූල බීජ තුනෙහි ක්‍රියාකාරීත්වය දත්ත රැස් කිරීමේ නිර්ණායක ලෙස යොදා ගැනිණි. ඒ හරහා වර්තමාන සමාජය තුළ මැතිවරණ කටයුතු උදෙසා නව මාධ්‍යයේ බලපෑම ඉතා විශිෂ්ට ලෙස යොදාගන්නා ආකාරය මෙහිදී හදුනාගැණිනි. මැතිවරණ සමයේ මහජන මතය නිර්මාණය කිරිමටත්, මහජන මතය හැඩගැස්වීමටත් ප්‍රබල අවියක් බවට පත්ව ඇති මුහුණු පොත මඟින් විසිරී පවතින ජනතා මතයන් ඒකරාශී කිරීම සඳහා ප්‍රබල මෙහෙයක් සිදුකරයි. දේශපාලන සංවිධාන, දේශපාලන නායකයින් සහ මහජනයා අතර සන්නිවේදනය සඳහා මුහුණු පොතේ බලපෑම කෙසේ සකස් විය යුතුද එය මහජන මතය කෙරෙහි දක්වන බලපෑම සහ එහි වාසි අවාසි ආදී කරුණු මෙම අධ්‍යයනයේ අරමුණු ලෙස යොදා ගන්නා ලදී. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මැතිවරණය තුළ දැනුවත් හා බුද්ධි තත්වයෙන් අනූන ඡන්දදායකයින් පිරිසක් ගොඩනැංවිමට ප්‍රමුඛ මෙහෙයක් නව මාධ්‍යයෙන් සිදු කරයි. එ අනුව මෙහිදි උපන්‍යාසය ලෙස ප්‍රස්තුත වුයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු මහජන මතය කෙරෙහි දක්වන පෙළඹවීම නව මාධ්‍යයක් ලෙස මුහුණු පොත ඔස්සේ ජනතාව වෙත ලබා දිමට උත්සුක වීඇති ආකාරය හඳුනා ගැනීමයි.

***මුඛ්‍ය පදඃ*** *අන්තර්ජාල හා සමාජජාල, නව මාධ්‍ය, දේශපාලන මැතවරණ, දේශපාලන සන්නිවේදනය, මහජන මතය*

[1] දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nmlakshi9512@gmail.com

# පාසල් සිසුන්ගේ විභාග ප්‍රතිඵල සාධනය කෙරෙහි සන්නිවේදන මාධ්‍යය සහ සමාජ ජාල මාධ්‍යය සිදුකරන බලපෑම:පාසල් සිසුන් ඇසුරින්

ඩබ්ලිව්. ඩී. ධර්මතිලක[1]


**සංක්ෂේපය**

තාක්ෂණයෙන් පෘථුල සමාජයක ජීවත්වන මිනිසා තොරතුරු කාර්යක්ෂම ව දැනගැනීම සඳහා සන්නිවේදන මාධ්‍ය සමඟ සමීපව කටයුතු කරයි. "පරිගණක, අන්තර්ජාල වෙබ් අඩවි මෙන්ම ස්ථාවර දුරකථන, ජංගම දුරකථන සහ අනෙකුත් රැහැන් රහිත සන්නිවේදන උපකරණ, ජාල, බ්‍රෝඩ්බෑන්ඩ් සහ විවිධ විශේෂිත උපාංග ආදිය වැනි සියලු ආකාරයේ තාක්ෂණයන් ආවරණය කරන්නේද එය තොරතුරු සන්නිවේදන තාක්ෂණයයි." සන්නිවේදන තාක්ෂණය කාර්යක්ෂම, විධිමත් සන්නිවේදනය සඳහා වැදගත් වන තාක්ෂණය විවිධ ක්ෂේත්‍ර වෙත අනිටු බලපෑම් ඇති කරයි. ඉන් ප්‍රධාන බලපෑම් සිදුවන ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය දැක්විය හැකිය. පාසල් යන වියේ නව යෞවන යෞවනියන් අති විශාල ප්‍රමාණයක් රූපවාහිනී, පරිගණකය හා සමාජජාල වෙබ් අඩවි භාවිතා කරනු ලබයි. මෙම අධ්‍යයනයේ ගැටළුව වන්නේ පාසල් සිසුන් බහුලව සන්නිවේදන මාධ්‍යයත්, සමාජජාල වෙබ් අඩවි පරිහරණයට යොමුව සිටීමයි. අධ්‍යයන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පාසල් සිසුන්ගේ විභාග ප්‍රථිඵල සාධනය කෙරෙහි සන්නිවේදන මාධ්‍යය සහ සමාජජාල මාධ්‍යවල බලපෑම සොයා බැලීමයි. මෙම අධ්‍යයනය ප්‍රමාණාත්මක අධ්‍යයනයක් ලෙසින් සිදු කරන ලදී. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය භාවිතා කරන ලදි.පාසල වෙත ගොස් සිසුන් වෙත ප්‍රශ්නාවලි ලබා දීමෙන් දත්ත එකතු කර ගන්නා ලදී. සංගහනය ලෙස උඩදුම්බර ද්විතියික පාසලේ 10-13 යන ශ්‍රේණිවල පාසල් සිසුන් 100ක් විය. නියැදියට අනුව විෂම ප්‍රාදේශීය ආර්ථික, සමාජීය මට්ටම් නියෝජනය කරන්වුන් විය. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රස්තාර, ප්‍රතිශත යන ශිල්ප ක්‍රම භාවිතා කරන්නට විය. අධ්‍යයන ප්‍රථිඵල වලට අනුව පර්යේෂණයට සහභාගි වූවන්ගෙන් බහුතරයක් වන 88% ක ප්‍රමාණය රූපවාහිණි, දුරකථන භාවිතාකරන්නන් වූ අතර ඔවුන්ගෙන් 72% ප්‍රමාණය පාසල් වාර විභාගය සඳහා ලකුණු 75ට වඩා ලබාගන්නා අය විය.ඔවුන්ගෙන් 38% ක් facebook ද 32% youtube, whatsapp, Imo, viber යන මාධ්‍යයන් 57%ක ප්‍රමාණයක් භාවිත කරයි. දිනකට පැය 2-4 පමණ කාලයක් රූපවාහිණි නරඹන්නවුන් 88% ප්‍රමාණයක් සිටියි. නියැධියෙන් පැය 1-5 අතර අධ්‍යයන කටයුතුවල නිරත වන්නවුන් 68%ක ප්‍රමාණයක් සිටියි. ඔවුන් සමාජජාල හා සන්නිවේදන මාධ්‍ය සමඟ ගත කරන කාලය පැය 2-3 පමණ වේ. අධ්‍යයනයට අනුව නිගමනය කළහොත් සිසුන්ගේ විභාග ප්‍රථිඵල සාධනය කෙරෙහි සමාජ මාධ්‍යයන්ගෙන් හෝ සන්නිවේදන මාධ්‍යයන්ගෙන් කිසිදු බලපෑමක් ඇති නොකරන අතර ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වෙත ද ඉන් බාධාවක් වී නොමැති බව නිගමනය කළ හැක.


***මුඛ්‍ය පද:*** *පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්, සාමාජ ජාල මාධ්‍යය, සන්නිවේදන මාධ්‍යය, උඩදුම්බර*

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wathsaladilrukshi31@gmail.com

# ශ්‍රී ලංකාවේ චිත්‍රපට පූර්ව ප්‍රචාරණය සඳහා සමාජ ජාල මාධ්‍යවල බලපෑම (Youtube, Facebook සමාජ ජාලවලට විශේෂිතව)

ඩබ්. ජේ. සී. පීරිස්[1] , එස්. ඒ. ඩී. එස්. පෙරේරා

## සංක්ෂේපය

මිනිස් අධ්‍යාත්මය විවරණය කිරීමෙහිලා අන් කලාවන් අභිබවා යන ප්‍රබල කලාවක් ලෙස සිනමාව හඳුනා ගත හැකිය. වර්තමානය වන විට සිනමාව කලාවක් පමණක් නොව දැවැන්ත කර්මාන්තයක් බවට පත්ව ඇත. වාණිජකරණයට ලක්වූ චිත්‍රපට කර්මාන්තයෙහි චිත්‍රපටයක සාර්ථකත්වය කෙරෙහි එහි පූර්ව ප්‍රචාරණය ප්‍රබල ලෙස බලපෑම් කරනු ලැබේ. එහිදී තාක්ෂණයේ දියුණුවත් සමගම අන්තර්ජාලය භාවිතා කරමින් ප්‍රචාරණ කටයුතු සිදු කිරීම වර්තමානයේ බහුලව සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකාවේ ද චිත්‍රපට පූර්ව ප්‍රචාරණය සඳහා සමාජ ජාල යොදා ගැනීම සුලභව දක්නට ලැබේ. චිත්‍රපට පූර්ව ප්‍රචාරණය සඳහා Facebook, Youtube සමාජජාල වෙබ් අඩවි සෘජු බලපෑමක් එල්ල කරන්නේ ද? යන ගැටළුව මූලික කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. Facebook හා Youtube යන සමාජජාල මාධ්‍ය අතරින් වැඩි බලපෑමක් එල්ල කරන්නේ කුමන මාධ්‍යය ද? Facebook මගින් චිත්‍රපට පූර්ව ප්‍රචාරණයට බලපෑම එල්ල කරන්නේ කුමන ආකාරයෙන් ද? Youtube මගින් චිත්‍රපට පූර්ව ප්‍රචාරණයට බලපෑමක් එල්ල කරන්නේ කුමන ආකාරයෙන් ද? පර්යේෂණ අනු ප්‍රශ්න සඳහා ද පර්යේෂණය මගින් අධ්‍යයනය කර ඇත. පර්යේෂණයේ පරමාර්ථය වන්නේ චිත්‍රපට පූර්ව ප්‍රචාරණ ක්ෂේත්‍රයට සක්‍රිය හා වඩාත් ඵලදායී ම මාධ්‍ය හඳුන්වා දීමයි. මෙම පර්යේෂණයේ අරමුණු අතර චිත්‍රපට ක්ෂේත්‍රයට පිවිසෙන ආධුනික චිත්‍රපට කරුවන්ට අවබෝධයක් ලබා දීම, අඩු පිරිවැයකින් වැඩි ප්‍රතිලාභ ලැබීමට චිත්‍රපට නිශ්පාදකවරුන් පෙළඹවීම, චිත්‍රපට ක්ෂේත්‍රය නව මානයක් හඳුන්වා දීම, අඩු කාලයකින් වැඩි ජනප්‍රියතාවයක් ලබා ගැනීම මූලික වෙයි. මෙම පර්යේෂණය සිදු කිරීමේ දී සමීක්ෂණ ක්‍රමවේද යටතේ ප්‍රශ්ණාවලි, ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ යටතේ තොරතුරු සාමාන්‍යකරණයට ලක් කර නිගමන ඉදිරිපත් කර ඇත. නියැදිකරණයේ දී සසම්භාවීය නියදිකරණය යටතේ ම අහඹු නියදි ක්‍රමය ආධාරයෙන් දත්ත දායකයන් තෝරා ගෙන ඇත. එමගින් ලබා ගත් දත්ත SPSS මෘදුකාංගය යටතේ විශ්ලේෂණය කර ඇත. එහිදී ශ්‍රී ලංකාව තුළ චිත්‍රපට පූර්ව ප්‍රචාරණය සඳහා Facebook හා Youtube සමාජ මාධ්‍ය සක්‍රිය දායකත්වයක් දක්වන බව නිගමනය කළ හැකි ය. සමාජ ජාල මාධ්‍යය මගින් සිදු කරන චිත්‍රපට පූර්ව ප්‍රචාරණ ගුණාත්මක, ඵලදායී මෙන් ම ආකර්ශනීය ලෙස සිදු කළ යුතුයි යන්න යෝජනා කළ හැකි ය.

***මූඛ්‍ය පදඃ*** *චිත්‍රපට, පූර්ව ප්‍රචාරණය, Youtub, Facebook, සමාජජාල මාධ්‍යය*

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, peiris.janith@gmail.com

# තරුණ පරපුරට රූපවාහිනී මාධ්‍යය භාවිතය අවම කිරීම සඳහා Youtube සමාජජාල මාධ්‍ය සිදු කරන බලපෑම (ටෙලි නාට්‍යවලට විශේෂිතව)

එච්. පී. එස්. එච්. හඳුන්පතිරණ [1]

## සංක්ෂේපය

සන්නිවේදනයේ පහසුව සඳහා නිපදවන ලද උපකරණ අතරින් මිනිසාට වඩාත්ම සමීප උපකරණයක් බවට පත් වීමට රූපවාහිනියට හැකියාව ලැබී ඇත. රූපවාහිනිය ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් බැවින් ඒ වෙත ජනතාව ආකර්ශන වීම ඉතා වේගවත් ව සිදු වුන අතර ඉල්ලුම ද වේගයෙන් ඉහළ ගියේ ය. සමාජජාල මාධ්‍ය හරහා විවිධ ප්‍රදේශයක පැතිර පවතින තොරතුරු, සංවිධාන, ප්‍රජාව, පුද්ගලයන් එකිනෙක සම්බන්ධ කරනු ලැබේ. වර්තමාන මාධ්‍ය විශේෂඥයින් දක්වන පරිදි වර්තමානය වන විට සමාජජාල මාධ්‍ය රූපවාහිනිය වෙත දැඩි බලපෑමක් එල්ල කිරීමට සමත්ව ඇත. එමනිසා මෙම පර්යේෂණ මාතෘකාව කාලෝචිත මාතෘකාවක් ලෙස හැඳින් විය හැක. තරුණ පරපුරේ රූපවාහිනී මාධ්‍ය භාවිතය සඳහා Youtube සමාජජාල මාධ්‍ය හරහා නිශේධනාත්මක බලපෑමක් එල්ල කරන්නේද? යන්න පර්යේෂණ ගැටළුවයි. පර්යේෂණයේ දී යොදා ගනු ලැබූ අතුරු ප්‍රශ්න ලෙස රූපවාහිනිය නැරඹීම සඳහා මිනිසුන් තුළ පවතින්නේ කවර ආකාරයේ කැමැත්තක්ද?, Youtube නිසා රූපවාහිනී නාට්‍ය නැරඹීම අත්හල තරුණ කොටසක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය වී සිටීද?, නව පරපුර මේ පිළිබඳව දක්වන්නා වූ අදහස් මොනවාද?, නව පරපුර රූපවාහිනී මාධ්‍යයට වඩා Youtube මාධ්‍යයට ප්‍රියතාවයක් දැක්වීමට හේතු මොනවාද? යන්න දැක්විය හැක. ප්‍රේක්ෂකයා වඩාත් ආකර්ෂණය වන්නේ ජනමාධ්‍යයටද නව මාධ්‍යයටද යන්න සොයා බැලීම පර්යේෂණයේ පරමාර්ථයයි. අරමුණු ලෙස මාධ්‍ය ක්ෂේත්‍රය තුළ පවතින්නා වූ නව ප්‍රවනතා හඳුනා ගැනීම, නව මාධ්‍යය අරමුණු කර ගනිමින් නාට්‍ය නිෂ්පාදනය කිරීම සඳහා නිෂ්පාදකයන් පෙළඹවීම, රූපවාහිනී වෙළඳ දැන්වීම්කරුවන්ට අනාගතයේ ඇති වන තර්ජන පිළිබඳ අවබෝධයක් ලබා දීම දැක්වීමට හැක. මෙම අධ්‍යයනයේ දී සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලිද, නිරීක්ෂණයද, පර්යේෂණ මූලාශ්‍ර ලෙස උපනිශ්‍රය කර ගනු ලැබේ. නියදිය තෝරා ගැනීමේ දී සසම්භාවී නියදි ක්‍රමය යටතේ අහඹු නියදිය සඳහා පුද්ගලයන් 20 දෙනෙක් භාවිත කළ අතර ගැහැණු 10 දෙනෙක්, පිරිමි 10 දෙනෙක් යොදා ඇත. ලබා ගනු ලැබූ දත්ත SPSS මෘදුකාංගය භාවිත කර විශ්ලේෂණය කළ අතර එසේ කිරීම තුළින් තරුණ පරපුර රූපවාහිනී මාධ්‍ය භවිතය අවම කිරීම සඳහා Youtube සමාජජාල මාධ්‍ය කරන ලද බලපෑම 70%ක් බව අනාවරණය විය. එයට හේතු ලෙස දැන්වීම් අවම වීම, අවශ්‍ය ඕනෑම වේලාවක ටෙලි නාට්‍ය නැරඹීමට හැකි වීම ආදිය හඳුනා ගැනිණි. ජනමාධ්‍ය පරිහානියට ලක් වන බව පෙනී ගිය අතර එය අවම කර ගැනීමට ගුණාත්මක මෙන් ම ඵලදායී රූපවාහිනී සේවාවක් ස්ථාපිත කළ යුතුය යන්න යෝජනාවකි.

***මුඛ්‍ය පද:*** *රූපවාහිනී මාධ්‍ය, තරුණ පරපුර, ටෙලි නාට්‍ය, Youtube, සමාජ ජාල මාධ්‍ය*

[1]ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, Sinekaharini@gmail.com

# තොරතුරු සුලබත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාසල් දරුවන්ගේ තොරතුරු අවශ්‍යතාවය සපුරා ගැනීම: බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල අධ්‍යාපන කොට්ඨාසය ඇසුරින්

ජී.ඩී.එන්. මධුෂිකා[1]

## සංක්ෂේපය

තොරතුරු යනු අර්ථයක් සහිතව ලබන්නා තුළ කිසියම් අදහසක්, දැනුමක්, අවබෝධයක් ජනිත කරවීමට හැකි සුවිශේෂී වටිනාකමකින් යුක්ත සංවිධානය කරන ලද දත්ත සමූහයක් ලෙස නිර්වචනය කළ හැක. වර්තමානය වන විට මිනිසාගේ පස්වන අවශ්‍යතාවය බවට තොරතුරු පත්ව ඇත. සීඝ්‍රයෙන් වර්ධනය වන තොරතුරු තාක්ෂණය හේතුකොටගෙන තොරතුරු සුලබත්වය ඇති වී ඇත. විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තොරතුරු ගලා ඒම හේතුවෙන් තොරතුරු අවශ්‍යතාවය සපුරා ගැනිම උදෙසා විවිධ සන්නිවේදන මාර්ගයන් භාවිත කරයි. වර්තමානයේ සෑම පුද්ගලයකුම සාර්ථකත්වයේ පදනම වී ඇත්තේ ඵලදායි ලෙස තොරතුරු භාවිත කිරිම තුළිනි. තොරතුරු බිහි වීමේ වේගය සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බැවින් එම තොරතුරු අවශ්‍ය ආකාරයෙන් ග්‍රහනය කර ගැනිමේ හැකියාව ග්‍රහකයා සතුව පැවතිය යුතු හැකියාවකි. සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම්, තාක්ෂණික පහසුකම් ද විවිධ මට්ටමකින් ව්‍යාප්ත වී ඇති නිසා තොරතුරු නිසි පරිදි සපුරා ගන්නේ ද යන්න පර්යේෂණ ගැටළුවයි . ග්‍රාමීය ප්‍රදේශයන්හි පාසල් දරුවන් ද ඉහත කී තොරතුරු සුලබත්වය හමුවේ විධිමත්ව තොරතුරු අවශ්‍යතාවය සපුරා ගැනිම පිළිබඳව අධ්‍යනය කිරීම මෙම අධ්‍යනයේ අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස නියැඳිය තෝරා ගැනිමේදි සමානුපාතික ස්තරායන නියැදීම මඟින් තෝරා ගැනිම සිදු කරනු ලබයි. බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල අධ්‍යාපන කොට්ඨාශයේ අධතපනික අවශ්‍යතාවයන්, යටිතල පහසුකම් අවම මට්ටමක පවතින 1C වර්ගයට අයත් පාසල් තුනක දරුවන් ඇසුරින් සම්මුඛ සාකච්ජා, ප්‍රශ්නාවලි ආදිය යොදවා ගනිමින් ද්විතීක ශ්‍රේණි යටතේ 6-11 සහ 12-13 ශ්‍රේණි ලෙස වෙන් කරමින් පාසල් සිසුන්ගෙන් තොරතුරු එක් රැස් කර ගන්නා ලදි. මෙහිදි දත්ත විශ්ලේෂණය සඳහා වගු ප්‍රස්ථාර ආදිය යොදා ගන්නා ලදි. වර්තමානය වන විට තොරතුරු සුලබත්වය මත තොරතුරු අවශ්‍යතාවයට සරිලන ඉතාමත් නිවැරදි තොරතුරු අත්පත් කර ගැනිමට හැකියාව පුද්ගලයා සතු විය යුතුය. එසේනම් රටක සංවර්ධනය මැන බැලීමේ එක්තරා සාධකයක් වන පාසල් ශිෂ්‍ය ප්‍රජාව තුළදී තොරතුරු සුලබත්වය හමුවේ නිසි පරිදි තොරතුරු අවශ්‍යතාවය සපුරා ගැනිම ග්‍රාමීය පාසල් තුළ අවම මට්ටමක පනතින බව අවසාන වශයෙන් නිගමනය කළ හැක.

***මූඛ්‍ය පදඃ*** *තොරතුරු, තොරතුරු සුලබත්වය, තොරතුරු අවශ්‍යතාවය, බදුල්ල දිස්ත්‍රික්කය*

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, madushikagdn@gmail.com

# නාගරික ශ්‍රාවක ප්‍රජාව පාරිභෝගිකයින් බවට පත්වීමේදී ගුවන්විදුලි වෙළෙඳ දැන්වීම් සිදුකරන බලපෑම

එන්. පී.ඩී.අනුත්තරා[1]

## සංක්ෂේපය

කාර්මික විප්ලවයෙන් පසුව පැන නැගුණු ජනමාධ්‍ය, සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රබල හැරවුම් ලක්ෂයක් විය. යම් අදහසක් එකම අවස්ථාවකදී විශාල ජන සංඛ්‍යාවකට හඩ ඔස්සේ ආමන්ත්‍රණය කල හැකි මාධ්‍යයක් වශයෙන් ගුවන්විදුලිය හැඳින්විය හැකිය. නිෂ්පාදනයක්, සේවාවක් හෝ පරමාදර්ශයක් කෙරෙහි යම් ක්‍රියාකාරකමක් කිරීම හෝ එහි මිල දී ගැනීම සඳහා ග්‍රාහකයා පොළඹවන ආකාරයේ සන්නිවේදන ක්‍රමය වන්නේ වෙළඳ දැන්වීම්කරණයයි. ආයතනයක් තම නිෂ්පාදන හා සේවා පිළිබඳ ව පාරිභෝගිකයා දැනුවත් කිරීමට ගුවන්විදුලි මාධ්‍ය යොදාගැනීම ගුවන්විදුලි වෙළඳ දැන්වීම්කරණයයි. වර්තමාන ගෝලීයකරණ සමාජය තුල නව මාධ්‍යයෙහි පවතින ප්‍රබලත්වය හේතුවෙන් ගුවන්විදුලි දැන්වීම්කරණය කෙරෙහි වෙළඳ ආයතනයන්හි ඇල්මක් තවමත් පැවතීම හේතුවෙන් පර්යේෂණ මාතෘකාව කාලෝචිත වෙයි. ගුවන්විදුලි වෙළඳ දැන්වීම්කරණය තුලින් නාගරික ශ්‍රාවක ප්‍රජාව පාරිභෝගිකයන් බවට පත්වන්නේද? යන්න පර්යේෂණ ගැටළුවයි. වෙළඳ ආයතන දැන්වීම්කරණයේදී ගුවන්විදුලි මාධ්‍යය අනාගත ප්‍රවර්ධන කටයුතු සඳහා තව දුරටත් භාවිත කල හැකිද යන්න සොයාබැලීම පර්යේෂණයේ පරමාර්ථයයි. අරමුණු ලෙස හඩ පමණක් මූලික කරගත් ගුවන්විදුලි මාධ්‍යය ග්‍රාහක මනසට ආමන්ත්‍රණයේදී නිවේදකයන් සතු කථන හැකියාව වෙළඳ දැන්වීම් ග්‍රාහකයා වෙත සමීප කරලීම සඳහා පවතින සාර්ථක අසාර්ථකත්වය හඳුනාගැනීමයි. අධ්‍යයනයේ දී සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලිද, නිරීක්ෂණ ද, පර්යේෂණ මූලාශ්‍ර ලෙස උපනිශ්‍රය කරගෙන ඇත. නියැදිය තෝරාගැනීමේදී සසම්භාවී නියැදි ක්‍රමය යටතේ අහඹු නියදිය තෝරාගනු ලැබෙයි. නියදිය සඳහා පුද්ගලයින් 100ක් භාවිතා කරන අතර ගැහැණු 50 දෙනෙක්, පිරිමි 50 දෙනෙක් යොදාගනී. ලබාගත් දත්ත SPSS මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව නගරාශ්‍රිත ප්‍රජාව ගුවන්විදුලිය ශ්‍රවණය කරනවාට වඩා ශ්‍රවණය වන අවස්ථා බහුල බව අනාවරණය වේ. පර්යේෂණ නිගමනයේ දී ගුවන්විදුලි වෙළඳ දැන්වීම්කරණය හරහා නාගරික ශ්‍රාවක ප්‍රජාව පාරිභෝගිකයන් බවට පත්වන අවස්ථාව 65% කි. මෙහිදී වෙළඳ දැන්වීම ඉදිරිපත් කරනු ලබන වේලාව, අදාල තොරතුරු වල අන්තර්ගත සරල බව හා නිවේදකයාගේ සිත්ගන්නා සුළු ඉදිරිපත් කිරීමේ ස්වභාවය ශ්‍රාවකයාට අදාල නිෂ්පාදනය මිල දී ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමේදී හේතුවන බව අනාවරණය විය. රූප මාධ්‍ය දැන්වීම්කරණයේ දී දෘෂ්‍ය මායාවට හසු ව ග්‍රාහකයා පාරිභෝගිකයකු බවට පත්වීමට සාපේක්ෂව ගුවන්විදුලි දැන්වීම්කරණයේ දී ග්‍රාහකයා බුද්ධිමත් තීරකයකු වශයෙන් පාරිභෝගිකයකු බවට පත්වන බව හඳුනාගැනිණ. පැරණි නිවේදකයන්ට සාපේක්ෂව වර්තමාන නිවේදකයන් ගුවන්විදුලි මාධ්‍යයේදී භාෂාව හැසිරවීම පිළිබඳ සැළකිල්ලක් දක්වන්නේ නම් ඵලදායී යන්න යෝජනාවකි.

***මුඛ්‍ය පද:*** *ගුවන්විදුලි මාධ්‍යය, වෙළඳ දැන්වීම්, පාරිභෝගිකත්වය, ග්‍රාහකත්වය නිවේදකයා*

[1] ජනසන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dinidhi.anuththara18@gmail.com

# අධ්‍යාපන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මහජන මතයක් ගොඩනැගීමට නව මාධ්‍ය ඇති කරන බලපෑම (Face Book ඇසුරෙන්)

ඩබ්. ටී. කේ. ටී. සෙව්වන්දි[1] , ආර්. ඩබ්. ඩී. එස්. කුමාරි, කේ. කේ. එස්. චතුරිකා

## සංක්ෂේපය

රාජ්‍ය අංශයට සාපේක්ෂව පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව සංසන්දනාත්මකව වර්ධනීය තත්ත්වයක් ළඟා කරගෙන ඇති කාලවකවානුවක් තුළ, 1945 මෙරට ස්ථාපිත වූ නිදහස් අධ්‍යාපනයත් එකී කුලකයට හසුවන්නට වූයේ මෙරට අධ්‍යාපන ක්‍රියාවලිය පෞද්ගලීකරණයට යොමු වීමත් සමඟයි. එම මතය රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස වර්ධනය වීමත් සමඟ විවිධ සමාජතලවල කථිකාවතට යොමුවන කරුණක් වීමට සාපේක්ෂව එය කාලීන මාතෘකාවක් බවට පත් වී ඇත. එහිදී ප්‍රබල කථිකාවතක් නිර්මාණය වන්නට සමාජ ජාල මාධ්‍ය ප්‍රබල මැදිහත් වීමක් සිදු කරයි. ඒ අනුව අධ්‍යාපන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය කෙරෙහි මහජන මතයක් ගොඩනැගීමට සමාජ මාධ්‍ය සිදුකරන බලපෑම Face Book ආශ්‍රය කොට ගෙන පර්යේෂණයට යොමු කිරීම අපගේ මාතෘකාවයි. අධ්‍යාපන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මහජන මතයක් ගොඩ නැගීමට නව මාධ්‍ය ධනාත්මකව බලපෑම් කරයි ද යන්න මෙහි පර්යේෂණ ගැටළුවයි. අධ්‍යාපන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් මහජන මතයක් ගොඩ නැගෙන්නේ කුමන පිරිසක් අතරින් ද, ඒ සඳහා පදනම් වූ හේතු මොනවාද, අධ්‍යාපන පෞද්ගලීකරණය යන්න විශ්ව විද්‍යාල ශිෂ්‍යයින්ට බලපාන්නේ කෙසේද යන අතුරු ප්‍රශ්න මෙම පර්යේෂණය සඳහා යොදා ගැනිණි. අධ්‍යාපන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය කෙරෙහි මහජන මතයක් ගොඩනැගීමට වැඩියෙන් බලපෑම් කරන්නේ නව මාධ්‍ය ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ පරමාර්ථය යි. අරමුණු ලෙස නිදහස් අධ්‍යාපනය අගාධයට යොමු වීමට පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය හේතු වීම සම්බන්ධයෙන් ජනතාව දරන ආකල්පයත් , ඒ පිළිබඳ ජනතාව තුළ දේශපාලන සවිඥනිකභාවයක් ඇති කිරීම ත්, රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බලපෑම් කිරීමට තරුණ පරපුරේ සක්‍රීය දායකත්වයක් ඇති කිරීමත් දැක්විය හැකිය. මෙම අධ්‍යයනයේදී සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණ මඟින් තොරතුරු රැස් කරනු ලැබේ. නියැදිය තෝරා ගැනීමේ දී අහඹු නියැදීම යටතේ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් යොදා ගැනේ. මේ සඳහා ශිෂ්‍යයන් 30 හා ශිෂ්‍යයාවන් 30 යුත් නියැදියක් යොදා ගැනේ. ලබා ගන්නා ලද දත්ත SPSS මෘදුකාංගය භාවිතා කරමින් විශ්ලේෂණය කළ අතර එසේ කිරීම තුළින් අධ්‍යාපනය පෞද්ගලීකරණ සම්බන්ධයෙන් මහජන මතයක් ගොඩ නැගීමට සමාජ මාධ්‍ය සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇති බව අනාවරණය විය. අධ්‍යාපන පෞද්ගලීකරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් වර්තමානය වන විට අධ්‍යාපන විශේෂඥයින්ගේ ද, ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ ද, සමාජ විද්‍යාඥයින්ගේ ද අවධානය යොමු විය යුතු බව සමස්ත අදහස යි.

***මුඛ්‍ය පද :*** *අධ්‍යාපනය පෞද්ගලීකරණය, මහජන මතය, Face Book, විශ්ව විද්‍යාල ප්‍රජාව, ප්‍රතිපත්තිය*

[1] දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, Thilankakamani@gmail.com

# රූපවාහිනී දැන්වීම්කරණය තුළින් යොවුන් හා බාල පරපුරට සිදුවන බලපෑම

ඩබ්ලිව්. එල්. වැලිකන්න[1]

**සංක්ෂේපය**

සන්නිවේදනය වනාහී පෘථුල පරාසයක් තුළ විහිදුණු විෂය පථයකි. ලොව සෑම රටකම පාහේ විවිධ වූ සන්නිවේදන ක්‍රම දැකිය හැකි  ය. ඒවා අතර පරිභෝජන අර්ථ ක්‍රම අතුරෙන් විවිධ විද්‍යුත් උපකරණ අතර සුවිශේෂී වූත් ප්‍රධානතම ජනමාධ්‍යයක් වූත් රූපවාහිනිය මෙරටට හඳුන්වා දීමෙන් පසු ලොව අන් රටවලට මෙන්ම ශ්‍රී ලංකාවේද, ඊට අනන්‍යයව පැවති ආචාරධර්ම ගති සිරිත්, මානසික සන්සුන් බව හා රසඥතාව උඩුයටිකුරු කරදුන් වුවත්. රූපවාහිනී විවිධ වැඩසටහන් අතුරින් සමාජයේ සෑම සමාජ ස්ථර වලද, සෑම වයස් කණ්ඩායම් වල ද සෑම අධ්‍යාපන මට්ටම් වල ද ප්‍රේක්ෂක ජනකොටස් කෙරෙහි එක ලෙස බලපාන අංගය රූපවාහිනී දැන්වීම් වේ. ඒ වනාහි වාණිජ අර්ථක්‍රමය යටතේ සමාජයේ එකිනෙකා අභිබවා තම නිෂ්පාදන, භාණ්ඩ හා සේවා ආයතන ද පෙරමුණට ගැනීමට සහාය කරගනු ලබන ප්‍රධානත ම සන්නිවේදන ක්‍රමයවේ. ප්‍රධාන වශයෙන් ම රූපවාහිනියේ පළවන්නා වූ මෙම දැන්වීම් යොවුන් හා බාලපරපුරෙහි චින්තනයට හා චර්යා රටාවන්ට සිඳුකරන බලපෑම විවරණය කර ගැනීම මෙම පර්යේෂණයේ අරමුණයි. රූපවාහිනියේ බලපෑම වඩාත් එල්ල වනුයේ යොවුන් හා බාල පරපුරට බැව් එකහෙලා පිළිගනු ලබන මතයකි. ළමා සිත් ඇඳ බැඳ ගනුයේ රූපවාහිනීයේ වැඩසටහන් හා නාට්‍යවලට වඩා, සෑම වැඩසටහනක් මැදම කඩින් කඩ ගලා යන වෙළඳ දැන්වීම්වලට යි. අනෙකුත් සන්නිවේදන මාධ්‍යවලට වඩා රූපවාහිනී වෙළඳ දැන්වීම් කොතෙක් දුරකට ළමා මනසට බලපෑම් කරනවා ද, යන්න අධ්‍යනය කිරීම  මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වේ. සමාජ පද්ධතියක මුදුන් මුල ලෙස සැලකෙන යොවුන් හා බාලපරපුර විධිමත් චින්තනමය චර්යා පද්ධතියකින් සන්නද්ධ කළයුතු වුව ද මෙකී දැන්වීම්කරණය හරහා විනයනය නොවූ පරපුරක් සමාජයට නිරායාසයෙන් දායාද වීම නොවැළැක්විය හැකි ය. උක්ත පර්යේෂණ ගැටළුවට අදාල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද්විතියික මුලාශ්‍ර භාවිතයෙන් සිදු කෙරෙන මෙම පර්යේෂණයට අවශ්‍ය ද්වීතීයික දත්ත රැස්කර ගනු ලබන්නේ මෙම විෂය පිළිබඳ ප්‍රාමාණික උගතුන් විසින් ලියන ලද ග්‍රන්ථ, ලිපි සහ අන්තර්ජාලය තුළින් ලබාගත් ලිපිය. රූපවාහිනි දැන්වීම්කරණය හරහා යොවුන් හා බාල පරපුර, උදෙසා චර්යාමය හා ආකල්පමය වශයෙන් සිඳු කරන බලපෑම අහිතකර බව මෙම පර්යේක්ෂණයේ නිගමනයයි.

***මුඛ්‍ය පදඃ*** *ආකල්ප, චර්යාව, දැන්වීම්කරණය, යොවුන් සහ බාල පරපුර, රූපවාහිනිය, සන්නිවේදනය*

[1] දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, lwelikanna@gmail.com

# ශ්‍රී ලංකාවේ ඡන්දදායක චර්යාව හැඩගැස්වීමෙහිලා ජන මාධ්‍ය මගින් සිදු කරනු ලබන බලපෑම (2015 ජනාධිපතිවරණය ඇසුරින්)

එම්. ඒ. එල්. ලශාන්දිකා[1], ඩී. අයි. එච්. එස්. පෙරේරා

## සංක්ෂේපය

ජනමාධ්‍ය වූ කලී ජනතාවගේ එදිනෙදා ජීවිතය හා සම්බන්ධ අත්‍යවශ්‍ය කරුණක් බවට අද පත්ව තිබේ. එනම් තොරතුරු දැන ගැනීම, විනෝදාස්වාදය, පෙළඹවීම ආදී සෑම ක්‍රියාවලියක් කෙරෙහිම ජනමාධ්‍ය මඟින් කරනු ලබන බලපෑම දැක ගත හැකි වේ. එහිදී රූපවාහිනිය, ගුවන් විදුලිය, සමාජ ජාලා වෙබ් අඩවි යනාදිය විද්‍යුත් මාධ්‍ය ලෙසද පුවත්පත් මුද්‍රිත මාධ්‍ය ලෙසද ආදි වශයෙන් නොයෙකුත් මාදිලියේ මාධ්‍යයන් දැකගත හැක. ඡන්දදායකයකු යනු වයස අවුː 18 ට වැඩි ඡන්දය භාවිතා කිරිමට සුදුසුකම් සපුරා ඇති ලාංකීය පුරවැසියෙකි. මෙහිදි 2015 ජනවාරි 08 වන දින පවත්වනු ලැබූ මෙරට හත්වන ජනාධිපතිවරණය ඇසුරින් ඡන්දදායක චර්යාව හැඩගැස්සවීමේලා ජනමාධ්‍ය මඟින් සිදු කරනු ලැබූ බලපෑම කොතෙක්දැයි අධ්‍යනය කිරීම අපගේ පර්යේෂණ මාතෘකාව වේ. 2015 ජනාධිවරණයේ ඡන්දදායක චර්යාව හැඩගැස්සවීමේලා නව මාධ්‍ය ධනාත්මක බලපෑමක් කර තිබේ ද යන්න අපගේ පර්යේෂණ ගැටළුවයි. ජනාධිපතිධූර අපේක්ෂකයන්ට ජනමාධ්‍ය මඟින් පක්ෂපාතීත්වය දක්වනු ලැබීමත්, මැතිවරණ ව්‍යාපාරයන්හි කරනු ලබන කතිකාවත් ජනමාධ්‍ය හරහා ප්‍රචාරණය කරනු ලැබූ ආකාරයත්, ඡන්දදායකයින් තුළ දේශපාලනික සවිඥානික බවක් ඇතිව ඇති ආකාරයත්, ඡන්දදායකත්වයේ දී තරුණ පරපුරේ සක්‍රීය දායකත්වයක් පැවති බවත් සනාථ කිරීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. මෙම අධ්‍යනයේදී ප්‍රාථමික දත්ත හා ද්විතීක දත්ත යන දත්ත මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබා ගනු ලැබීය. එහිදී ප්‍රාථමික දත්ත යටතේ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණ මඟින් තොරතුරු රැස් කර ගනු ලැබීය. ද්විතීයික දත්ත උපයෝගි කර ගැනීමේදී පොත් පත්, ලිපි, සඟරා, අන්තර්ජාල මූලාශ්‍ර භාවිතා කරන ලදී. නියදිය තෝරා ගැනීමේදී අහඹු නියදිම යටතේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් යොදා ගැනිණි. මේ සඳහා ගැහැණු ළමුන් දස දෙනෙක් ද, පිරිමි ළමුන් දස දෙනෙක්ද යොදා ගනු ලැබීය. ලබා ගන්නා ලද දත්ත SPSS මෘදුකාංගය භාවිතා කරමින් විශ්ලේෂණය කරන ලදි. අවසාන නිගමනය වන්නේ ජනමාධ්‍ය මඟින් විරෝධාකල්පී පිළිවෙත් අනුගමනය කරමින් ශ්‍රී ලාංකීය ඡන්දදායකයන්ගේ මතය වෙනස් කිරීමට දායක වී ඇති බවයි. නමුත් කුමන ආකාරයේ පක්ෂපාති අයුරින් තොරතුරු සම්ප්‍රේෂණය කරනු ලැබුවද ජනතාව වෙත නිවැරදිවූත් සත්‍යවූත් තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට ජනමාධ්‍ය දරණ ප්‍රයත්නය විශිෂ්ඨ බව කිව හැකිය.

***මුඛ්‍ය පදඃ*** *ජනමාධ්‍ය, ඡන්දදායක චර්යාව, ජනාධිපතිවරණය, ඡන්දදායකයෝ*

[1] දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, lashandikaloshani@gmail.com

# පාරිභෝගික මිලදී ගැනීමේ තීරණය කෙරෙහි රූපවාහිනී ප්‍රචාරණය බලපෑම

ඩී. කේ. එම්. මලගල[1]

## සංක්ෂේපය

රූපවාහිනි මාධ්‍යයට ආවේණික වූ හැකියාවන් හා එහි බලය ව්‍යාපාරික පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යොදා ගනු ලැබීම ලෝකයේ බොහෝ රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේද සිදුවිය.එනම් වාණිජ ප්‍රචාරණ මාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය යොදා ගැනීමයි. එසේ යොදා ගැනීමත් සමගම එතෙක් පැවති සම්ප්‍රදායික මාධ්‍ය වලට වඩා වැඩි අවධානයක් රූපවාහිනී වෙත යොමු වී තිබේ. ප්‍රචාරණ මාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය යොදා ගැනීම දිනෙන් දිනම වර්ධනය වෙමින් පවතී. පාරිභෝගිකයෙකු තීරණයක් ගන්නේ ස්වකීය අදහස් ආකල්ප මෙන්ම ඒ කෙරෙහි බලපෑ හැකි බලවේග රාශියක් ක්‍රියාත්මක වන පරිසරයක් තුළය. ඒ අනුව මෙම අධ්‍යයන සැළකීමේදී පර්යේෂණ ගැටළුව ලෙස පාරිභෝගිකයන්ට භාණ්ඩ හා සේවා පිළිබඳ පාරිභෝගික විශ්වාසය ගොඩනැගීම සඳහා රූපවාහිනි ප්‍රචාරණය තුලින් කෙබදු බලපෑමක් ඇතිවේද? යන්න විමසා බැලීමයි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ රූපවාහිනී ප්‍රචාරණය පාරිභෝගික මිලදී ගැනීම් කෙරෙහි කවර ආකාරයෙන් බලපාන්නේ ද යන්න පරීක්ෂා කිරීම හා ඒ මගින් ඇතිවිය හැකි පෙළඹුම කෙරෙහි සමාජ ආර්ථික සාධක වල බලපෑමක් ඇත්ද යන්න පරික්ෂා කිරීමයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික දත්ත පදනම් ව බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ තුළින් 100 දෙනකුගේ යුතු පහසු නියදීමේ ක්‍රමවේදය යටතේ ප්‍රශ්ණාවලියක් තුළින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී. ඒ අනුව නියැදිය 93% පමණ ප්‍රමාණයක් ප්‍රචාරණ දැන්වීම් ස්වකීය අවධානය ලක් වූ මාධ්‍යයක් වශයෙන් රූපවාහිනිය සඳහා කර ඇති අතර ගුවන් විදුලිය සඳහන් කර ඇත්තේ 18.2% ප්‍රමාණයකි. එමෙන්ම මෙහිදී රූපවාහිනිය නැරඹීමේදී වෙළඳ දැන්වීම් කෙරෙහි කැමැත්ත හා අවධානය ඉහළ මට්ටමක පවතින අතර එය 61.8% ක් වේ. 13.5% ප්‍රමාණය ඒ කෙරෙහි විශේෂත්වයක් නොමැත යන්න ප්‍රකාශ කර ඇත. රූපවාහිනිය ප්‍රචාරණය නිසා මිලදී ගැනීම්ට ඇති නැඹුරු වීම පිළිබඳ කල්පිත පරීක්ෂාව සිදු කළ විට එහි දී වගු අගය ලෙස 9.488 ක් ලෙසද ගණනය කළ අගය 1.56 විය. මේ අනුව මිලදී ගැනීමට නැඹුරු වීම හා පුද්ගලයන්ගේ රැකියාවක් අතර සම්බන්ධයක් නැත යන අභිශූන්‍ය කල්පිතය පිළිගැනීමට සිදු විය. මිලදී ගැනීම පිළිබඳ ප්‍රතිචාර වයස් කාණ්ඩ අනුව ගත්විට වගු අගය 5.99 වන අතර ගණනය කළ අගය 0.11 විය. ඒ අනුව මිලදී ගැනීමට නැඹුරු වීම කෙරෙහි පුද්ගලයන්ගේ වයස් මට්ටම් වල බලපෑමක් නොමැත යන්න පිළිගැනීමට සිදු විය. පාරිභෝගික අවධානයට භාජන වීම හා රූපවාහිනි ප්‍රචාරණය අතර ප්‍රබල සම්බන්ධතාවක් ඇත යන්න හා භාණ්ඩ හා සේවා පිළිබඳ පාරිභෝගික විශ්වාසය ගොඩනැගීම කෙරෙහි රූපවාහිනී ප්‍රචාරණය බලපෑම එතරම් ප්‍රබල නැත යන්න මෙම පර්යේෂණය තුළින් නිගමනය කළ හැකි විය.

***මුඛ්‍ය පද :*** *රූපවාහිනී ප්‍රචාරණය, පාරිභෝගික මිලදී ගැනීම්, වාණිජ පරමාර්ථ, වෙළඳ ප්‍රචාරණය*

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kaushalyamadhubhashini11@gmail.com

# තොරතුරු ප්‍රචාරණ ක්‍රියාවලියෙහිලා ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (මෑතකදී ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු දින බෝම්බ පිපිරීම් මාලාවට විශේෂිතව)

කේ. අයි. ඩී. සේනාරත්න[1]


## සංක්ෂේපය

තොරතුරු යනු මානව ජීවිතය වෙනස් කළ හැකි අංගයකි. එය මානව අයිතිවාසිකමකි. තොරතුරු අවශ්‍යතාවයන් සමඟ දිවිගෙවන ජනතාවට වඩාත් නිවැරදි කාලීන තොරතුරු සේවාවක් ලබාදීම සඳහා ජනමාධ්‍ය බැඳී සිටී. ජනතාවගේ තොරතුරු අවශ්‍යතාවය මානව අයිතිවාසිකමක් දක්වා විකාශනය කිරීමට උරදුන් මාධ්‍යයන් රැසක එකතුවක් ලෙස ජනමාධ්‍ය හඳුන්වාදිය හැකිය. මානවයා වටා තිබෙන්නා වූ සමාජ සන්දර්භය තුළ සිදුවන්නා වූ විවිධ විපර්යාසයන් පිළිබඳව සාධිකාරී තොරතුරු වාර්තාගත කිරීම ජනමාධ්‍යයේ වගකීමකි. එම විපර්යාසයන් පාදක කොටගෙන සම්මුති, විසම්මුති තුළින් ජනමතයක් ගොඩනැඟීම සමාජ ජාල මාධ්‍ය හරහා මානව නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය පවතින රටක් ලෙස මෙරට ජන මාධ්‍යයට සාපේක්ෂව සමාජ මාධ්‍යයන් තුළින් අදහස් ප්‍රකාශනයට, විවේචනයට, ඇගයීමට අවස්ථාව හිමිව ඇත. රටක සාමාන්‍ය ජනතාවට පෞද්ගලික වශයෙන් සහ ජාතියක් වශයෙන් මුහුණ දීමට සිදුවන විශාල ව්‍යවසනයන් තුළදී ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය මගින් සිදුකරන තොරතුරු ප්‍රචාරණ ක්‍රියාවලිය පිළිබඳව සහ එහි බලපෑම පිළිබඳ විමර්ශනයක යෙදීම මෙහි අරමුණ වේ. රටේ හදිසි අවස්ථාවන් තුළදී ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය මඟින් ලබාදෙන තොරතුරු සේවාවන් එම සේවාවන්වල ස්වභාවය මෑතකදී ශ්‍රී ලංකාව තුළ සිදුවූ බෝම්බ පුපුරා යාම හමුවේ ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය මඟින් ජනතාවට තොරතුරු සැපයූ ආකාරය කෙබඳුදැයි අධ්‍යනය කිරීම මෙම අධ්‍යනයේ සෙසු අරමුණු ලෙස සඳහන් කළ හැකිය. මෙම අධ්‍යනයෙන් රටක තොරතුරු ජනගත කිරීමේ තීරණාත්මක අවස්ථාවකදී එම සේවාවන් මහජනයාට බලපාන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබාගතහැකි අතර ගුණාත්මක, සාධිකාරී, නිරවද්‍ය තොරතුරු ප්‍රචාරණයේ වැදගත්කම යනාදිය පිළිබඳව ද එම අවස්ථාවේදී මාධ්‍යයේ සහයෝගය සහ ලබාදුන් ඵලදායී සේවාවන් මහජනතාව ඵලදායීව එම සේවාවන් භාවිතකළ ආකාරය,යනාදිය පිළිබඳව මෙම අධ්‍යනයෙන් අවබෝධයක් ලබාගත හැකිය. මෙහිදී එම බෝම්බ පිපිරුම සිදු වූ දින සිට සති දෙකක පමණ කාලයක් ජනමාධ්‍ය තුළ විවිධ වාරණයන්, නීති, රෙගුලාසි පනවනු ලැබූ ආකාරයද විමර්ශනාත්මකව අධ්‍යයනය කළ හැකිය. පර්යේෂණ කාර්යය සඳහා දත්ත රැස්කිරීමට නිරීක්ෂණ අධ්‍යයන ක්‍රමය හා සිද්ධි අධ්‍යයනය යොදාගත හැකි අතර තෝරාගත් ජනමාධ්‍ය ලෙස රූපවාහිනිය, පුවත්පත, ගුවන් විදුලිය සහ සමාජ මාධ්‍ය ජාලා ලෙස Face book,Whatsapp,You tube ප්‍රධාන මූලාශ්‍ර වශයෙන් යොදාගැණේ.දත්ත එක්රැස් කිරීමට ගුරුවරයින්, නීතිඥයන්, ජනමාධ්‍යවේදීන්ල විශේෂ පොලිස් නිළධාරීන්, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කණ්ඩායම් යොදාගැනීමට අපේක්ෂා කෙරේ. දත්ත එක්රැස් කිරීමට ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණ භාවිතා කළ හැකි අතර Excel, SPSS මෘදුකාංග මඟින් දත්ත විශ්ලේෂණය කිරීමට හැකිය.


**මූඛ්‍ය පදඃ** තොරතුරු, තොරතුරු ප්‍රචාරණය, තොරතුරු සේවාව, ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය, ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය, වාරණය

[1] පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, imchapa514@gmail.com

# ශ්‍රී ලාංකීය රූපවාහිනී වෙළෙඳ දැන්වීම්වල රූප මාධ්‍ය භාවිතය (තෝරාගත් වෙළෙඳ දැන්වීම් 10ක් ඇසුරින්)

ඩබ්ලිව්. ඒ. එස්. විජෙසිංහ[1]


**සංක්ෂේපය**

වර්තමානය වන විට වෙළඳ උපක්‍රමයක් ලෙස ප්‍රධාන වශයෙන්ම රූපවාහිනී වෙළඳ දැන්වීම් යොදා ගැනීමේ ප්‍රමුඛතාවයක් දක්නට ලැබේ. පුද්ගලයාගේ ආකල්පමය වෙනස් වීම් තුලින් චර්යාත්මක වෙනස් වීම් ඇති කිරීමට තරම් නිර්මාණශීලි සහ ආකර්ශනීය ලෙස වෙළඳ දැන්වීම් නිර්මාණය කරනු ලබයි. පුද්ගලයාගේ චර්යාත්මක සහ ආකල්පමය වෙනස් වීම් කෙරෙහි රූපවාහිනී වෙළඳ දැන්වීම්වල නිර්මාණාත්මක හා තාක්ෂණික භාවිතයේ ශක්‍යතාවය සාධකයක් වී තිබේද යන්න මෙහි අධ්‍යයන ගැටළුව වේ. සදාචාරාත්මක පසුබිමක් මත වඩා ගුණාත්මක සහ අවශ්‍යයක භාණ්ඩ හා සේවා වඩා නිර්මාණශීලි ආකාරයට රූප මාධ්‍ය භාවිත කරමින් වෙළෙඳ දැන්වීම් නිර්මාණය කිරීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දීම මෙහි අරමුණ වේ. පුද්ගලානුබද්ධ සහ සමාජමය වශයෙන් ආකල්පමය සහ චර්යාත්මක වෙනස්කම් ඇති කිරීමට තරම් රූප මාධ්‍ය යොදාගැනීමේ ප්‍රබලතාවය පිළිබඳව මෙහිදී අධ්‍යයනය කරයි. විවිධ වර්ගයන්ගෙන් තෝරාගත් වෙළඳ දැන්වීම් 10ක් නියැදිය ලෙස ගනී. භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීම සඳහා රූපමාධ්‍ය භාවිත කරන ආකාරය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යනයක් කිරීම මෙහිදී සිදුවේ. සම්මුඛ සාකච්ඡා, වෙළඳ දැන්වීම් නැරඹීම, අන්තර්ජාලය භාවිත කිරීමෙන් අදාල ලිපි කියවීම මඟින් රැස්කරගත් දත්ත ගුණාත්මක දත්ත විශ්ලේෂණයෙන් විශ්ලේෂණය කරන ලදී. මෙහිදී නිර්මාණාත්මක කාර්යය මෙන්ම තාක්ෂණික ක්‍රියාවලියද එකසේ වැදගත් වීම, රූප මාධ්‍ය භාවිත කරන ආකාරය හා උපක්‍රම අනුව භාණ්ඩය හෝ සේවාව පාරිභෝගිකයා වෙතට සමීප වීමේ ප්‍රමාණය තීරණය වීම, නිර්මාණාත්මක සහ ආකර්ෂණීය ලෙස පුද්ගලයාගේ මනෝභාවයන් ආමන්ත්‍රණය කරන ආකාරය, භාවිත කරන සංගීත හා ශබ්ධ රටා, වර්ණ හා ඇඳුම් පැලඳුම් භාවිතය, කැමරා උපක්‍රම, සංස්කරණ ශිල්පීය ක්‍රම මෙන්ම ප්‍රචාරය වන ගුවන් කාලය යන හේතු සාධකවල බලපෑම සිදුවන බව සොයාගන්නා ලදී. රූප මාධ්‍ය හා ගුවන්කාලය වඩා ඵලදායි ලෙස පුද්ගලයාගේ චර්යාත්මක හා ආකල්පමය වෙනස් වීම් කෙරෙහි යොදවාගැනීම සඳහා භාණ්ඩයේ හෝ සේවාවේ ගුණාත්මක භාවය මෙන්ම සදාචාරාත්මක අයිතීන් සම්බන්ධ ව රූපවාහිනී මාධ්‍ය ආයතන හා නිර්මාණකරුවන් තුල වාරණයන් පැනවීම මෙහිදී සිදු කළ හැක.


***මූඛ්‍ය පදඃ*** *රූපවාහිනී වෙළෙඳ දැන්වීම්, රූප මාධ්‍ය, නිර්මාණශීලී, තාක්ෂණික, ආකල්පමය වෙනස් වීම්*

[1] ලලිත කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sandamaliahesha@gmail.com

# ශ්‍රී ලාංකීය ප්‍රේක්ෂකයා දේශීය සිනමාපට නැරඹීමට සාපේක්ෂව විදේශීය සිනමාපට නැරඹීමට යොමුවීම පිළිබඳ අධ්‍යයනය (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඩබ්ලිව්. ඒ. එස්. විජේසිංහ[1]

## සංක්ෂේපය

ශ්‍රී ලාංකීය සිනමාව උපත ලබා ඇත්තේ යුරෝපියානු සිනමාවේ ආභාෂයෙනි. අතීතයේ සිට වර්තමානය දක්වා ම ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ සිනමා කෘති නිරීක්ෂණය කිරීමේ දී විවිධ ශානර යටතේ නිර්මාණය වු සිනමාපට හඳුනා ගත හැකිය. කොලිවුඩ්, බොලිවුඩ්, හොලිවුඩ් සිනමාපටවල විශේෂ ලක්ෂණ හඳුනා ගත හැකි නමුත් ශ්‍රී ලාංකීය සිනමාවේ ආවේණික වූ ලක්ෂණ පැහැදිලි ව හඳුනාගත නොහැක. වර්තමානයේ දී ශ්‍රී ලාංකීය ප්‍රේක්ෂකයා දේශීය සිනමාවට වඩා විදේශීය සිනමාපට නැරඹීමට යොමු වි ඇති බව පැහැදිලි වේ. ඒ සඳහා විවිධ හේතු සාධක බලපා ඇති බව හඳුනා ගත හැකිය. එයට හේතු හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. ප්‍රේක්ෂකයා පුළුල් පරාසයක් තුළ විහිදී ඇති නිසා ත් තරුණ ප්‍රේක්ෂකයා දේශීය සිනමාවේ ප්‍රබල සාධකයක් වන නිසා ත් පර්යේෂණයේ පහසුව සඳහා විශ්ව විද්‍යාල සිසුන් 100 දෙනෙකු සරල සසම්භාවී නියැදුම් ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදී. ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ තෝරාගත් ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත ප්‍රස්ථාර, වගු හා ප්‍රතිශත වැනි සරල සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම මගින් විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව තෝරාගත් ප්‍රේක්ෂකයින්ගෙන් 80% කටත් වැඩි පිරිසක් විදේශීය චිත්‍රපට නැරඹීමට ප්‍රවණතාවක් දක්වන බව සහ 40% කටත් වඩා අඩු ප්‍රමාණයක් දේශීය චිත්‍රපට නැරඹීමට කැමැත්තක් දක්වන බව හඳුනාගත හැකි විය. මෙයට හේතු ලෙස විදේශීය චිත්‍රපටවල ඇති කුතුහලය සහ ඒවායේ තර්කානුකූල භාවය නිසා චිත්‍රපටය පුරාම සජීවීව සම්බන්ධ වීමේ හැකියාව, බොහෝ දුරට චිත්‍රපටය අවසානයේ යම් ආදර්ශයක් ලබාදීම වැනි කරුණු ඇති බව හඳුනා ගැනීමට හැකිවිය. දේශීය චිත්‍රපට නැරඹීමට අඩු ප්‍රවණතාවයක් දැක්වීමට හේතු ලෙස කථා තේමාවේ ඇති ඒකාකාරීත්වය, රූපය සහ හඬ මුසු කිරීමේදී පවතින දුර්වලතාවයන්, චිත්‍රපටය නැරඹීමේදී රසාස්වාදයට යම් යම් බාධා ඇතිවීම යන කරුණු හඳුනා ගත හැකි විය. මෙය දේශීය සිනමාවේ මන්දගාමීත්වයට ප්‍රබල සාධකයක් වී ඇති අතර මෙම තත්වයන් මඟහරවා ගනිමින් දේශීය සිනමාව වර්ධනීය තත්ත්වයකට පත් කිරීමට නම් සම්ප්‍රදායෙන් බැහැරව නිර්මාණකරණයට යොමු වීම, යථාර්ථය සැබෑ ලෙස ප්‍රතිනිර්මාණය කිරීම, ඒ සඳහා නවීන තාක්ෂණික ක්‍රමෝපායන් භාවිත කිරීම, නිර්මාණකරුවන්ට අධ්‍යයන පසුබිමක් ලබාදීම, විචිත්‍රවත් වර්ණ හා පසුතල භාවිත කිරිම, දක්ෂ රංගන ශිල්පීන් සම්බන්ධ කරගැනීම යන කරුණු සිදු කිරීමට හැකි බව යෝජනා කළ හැකිය.

***මූඛ්‍ය පදඃ*** *ප්‍රේක්ෂකයා, දේශීය සිනමාපට, නැරඹීම, විදේශීය සිනමාපට, ප්‍රවණතාව*

[1] ලලිත කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sandamaliahesha@gmail.com

# ශ්‍රී ලාංකේය සිනමා මාධ්‍යය ප්‍රවර්ධනය සඳහා සිනමා ට්‍රේලරයේ (Film Trailer) ප්‍රචාරණ මූලිකාංග භාවිතයේ ඇති වැදගත්කම පිළිබඳ විමසුමක්.

සී. බී. බී. ඉහළගෙදර[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලාංකේය චිත්‍රපට හුදෙක් ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක් ලෙස හඳුන්වාදිය හැකි ය. වර්තමානය වනවිට නව මාධ්‍ය භාවිතා කිරීම මගින් චිත්‍රපට ප්‍රවර්ධනය සිදුවන අවධියක, චිත්‍රපට ට්‍රේලර කලාවද විවිධ වූ න්‍යායන් හා මූලිකාංග පාදක කර ගනිමින් ව්‍යාප්ත වන්නට විය. උදාහරණ ලෙස ආචාර්ය ඇන්තෝනි වෝ විසින් දක්වන ලද මූලිකාංගයන් මෙහිදී හඳුනාගත හැකි වේ. හුදෙක් වර්තමානය වන විට චිත්‍රපට ට්‍රේලර ප්‍රචාරණයෙහි ඇති සාර්ථකත්වය සිනමා කෘතියෙහි ප්‍රවර්ධනය සඳහා සෘජුවම බලපා තිබේ. ශ්‍රී ලාංකේය චිත්‍රපට ප්‍රවර්ධනය සඳහා චිත්‍රපට ට්‍රේලරයේ ප්‍රචාරණ මූලිකාංග භාවිතයේ ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. එහෙත් වර්තමාන ශ්‍රී ලාංකේය සිනමාව තුළ ඇතැම් සිනමා කෘති චිත්‍රපට ට්‍රේලරයේ ප්‍රචාරණ මූලිකාංග භාවිතා කිරීම දැකගත හැකි නොවේ. මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ චිත්‍රපට ට්‍රේලරයේ ප්‍රචාරණ මූලිකාංග යෝග්‍ය ලෙස භාවිතා කිරීම කොතෙක් දුරට චිත්‍රපට ප්‍රවර්ධනය සඳහා භාවිතා කළ හැකිද යන්න පිළිබඳ අධ්‍යයනය කළ හැකිවීමයි. ශ්‍රී ලාංකේය චිත්‍රපට ප්‍රවර්ධනය සඳහා චිත්‍රපට ට්‍රේලරයේ ප්‍රචාරණ මූලිකාංග භාවිතයේ ඇති බලපෑම් හා වර්තමානය වන විට චිත්‍රපට ට්‍රේලරයේ ප්‍රචාරණ නව ප්‍රවනතා නිර්මාණය වී තිබේ ද යන්න විමසීම මෙම පර්යේෂණයේ ගැටළුවයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණ සිදු කරනු ලබයි. ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර භාවිතා කිරීමට බලාපොරොත්තු වන අතර ප්‍රාථමික මූලාශ්‍ර සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිත කරන අතර ද්විතීයික මූලාශ්‍ර සඳහා අලෙවිකරණය පිළිබඳ ග්‍රන්ථ හා පර්යේෂණ ලිපි භාවිතා කරනු ලබයි. සම්මුඛ සාකච්ඡා සඳහා ආලෝකෝ උදපාදි චිත්‍රපටයේ නිෂ්පාදක තුසිත විජයසේන මහතා මේ සඳහා සම්බන්ධ කර ගනු ලබයි. මෙසේ සොයා ගනු ලබන තොරතුරු අනුව චිත්‍රපට ප්‍රවර්ධනය සඳහා චිත්‍රපට ට්‍රේලරයේ ප්‍රචාරණ මූලිකාංග භාවිතය සෘජුවම බලපාන බව මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලෙස දැක්විය හැකිය. ඒ අනුව චිත්‍රපට ට්‍රේලරයේ ප්‍රචාරණ මූලිකාංග චිත්‍රපට ප්‍රවර්ධනය සඳහා සාර්ථක ලෙස යොදා ගත හැකි බව නිගමනය කළ හැකිය.

***මූඛ්‍ය පදඃ*** *චිත්‍රපටය, ට්‍රේලරය, අලෙවිකරණය, සිනමාකෘත, චිත්‍රපට ප්‍රවර්ධනය*

[1] ප්‍රතිබිම්බ කලා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, chathuraihalagedra@gmail.com

# *STATISTICS*

# *AND*

# *SOCIAL SCIENCES*

# Childhood Obesity and Academic Performance at School

A.D. N. P. Assalla [1]

## ABSTRACT

Childhood obesity is one of the most serious public health challenges of the 21st century. Children who are obese are above the normal weight for their age and height. Childhood obesity leads to its related noncommunicable diseases and psychosocial health problems of children. Childhood obesity increases the risk of adulthood obesity and obesity related diseases such as hypertension, diabetes, and dyslipidemia. Successful academic performance is important during the school years and is also a strong predictor of occupational and social success in adult life. Therefore, the main objective of this study is to examine the association between children's overweight status and their academic achievements. This study was based on primary and secondary data. Primary data were obtained from a cross-sectional survey conducted through a structured questionnaire in Gampaha district. Simple random sampling method were used to select 80 students. Descriptive statistics including mean, standard deviation and inferential statistics comprising chi square test, correlation analysis and multiple regression analysis were used to analyze data using SPSS and Excel. Overweight students both girls and boys achieved lower average marks for math and language than their non-overweight peers. Age, gender, mother's BMI, father's BMI, skipping breakfast, eating fast foods and snacks have identified as key determinant for the development of obesity. The overweight students also demonstrated significantly more detentions, worsened school attendance and less participation on sports. This study has identified that, obesity is negatively associated with academic performance in both gender at school.

***Key words:*** *childhood obesity, academic performance, multiple regression analysis, Sri Lanka*

[1] Department of Social Statistics, University of Kelaniya, nireshaassalla@gmail.com

# A Study of Social and Health Conditions related to Female-Headed Households in Rural Areas in Sri Lanka

W. M. G. N. Panampitiya[1]

## ABSTRACT

In every human society, the household is one of the most significant social institution. Female-Headed Households (FHHs) is a new structural form of household and this new structural form of household has become a significant phenomenon in both global and national level. Although FHHs have occupied a prominent place in development discourse globally, very limited researches had been conducted regarding social and health conditions related to FHHs in Sri Lanka. The main objective of this study was to identify the background and issues related to social and health conditions, root causes, and interrelationships among those issues of FHHs in rural areas. The empirical research was conducted in five *Grama Niladari* Divisions of *Galgamuwa* divisional secretariat division which conveyed a marked increase of *FHHs* in Sri Lanka. Data were collected from hundred *FHHs* through purposive sampling method. Questionnaires and semi-structured interviews were used as primary data collection techniques. The study revealed that the inadequate education and vocational qualifications, low level of tendency to enter to formal employment sector, unsustainability of livelihood activities, low conditions of houses and related facilities, some legal issues related to residence, inadequate social supportive mechanisms in the community, lack of leadership and empowerment were prominent among social conditions and related issues. Unavailability of toilet facilities (19%), unavailability of drinking water in the own household (45%), prevalence of long-term affected health issue (49%) were the key issues of health and sanitary facilities related to FHHs in the sample. Based on these findings it has provided suggestions to improve social well-being and to improve health sanitary and infrastructure facilities, to reduce prevalence of non-communicable and communicable diseases as well as health risk and to improve quality of life and mental well-being among FHHs.

***Key Words:*** *Female-Headed Households (FHHs), Social Conditions, Health Sanitary and Infrastructure Facilities, Leadership, Empowerment***.**

[1] Department of Sociology, University of Kelaniya, gnpanampitiya@gmail.com

# Spread of cancer among children below 14 years

W. M. L. D. Jayathilake[1] ,K. M. N. P. Kulathunga, K. D. Liyanage , W. W. L. C. Jananjana, L. P. I. S. Madhushani

## ABSTRACT

A cancer which occurs due to unconnected replication of abnormal sales inside body.it can affect any kind of sales category in our body. Where sales functions, structure, totally get abnormal from its normal cell action. From all non - communicable diseases take place and currently children are too suspect to it. Research problem is "why cancer is spreading among children below 14. According to the study the main objective is finding what are the most common cancer type develop within these children among finding whether the gender is affecting or not to spread cancer. We used the simple random sample method here and the maharagama apeksha hospital was use as target population. The sample was 30 and the chisquare test was use to analyse the data. Descriptive statistics, time series analysis and GIS was used. Time series analysis was used to determine the prognosis of cancer. Finding of this research are food, generation, environmental factors cause for cancer leukemia, lymphoma, brain tammors are the major cancers among children and leukemia is the leader in cancer and gender is not etiological factor for cancer in children.

***Key words:*** *children, cancer, non- communicable disease*

[1] Department of Social Statistics , University of Kelaniya, lakshikadulanjalij@gmail.com

# University Students and Social Phobias

V. H. Jayasuriya[1] H. C. Y. Jayasinghe

## ABSTRACT

There has been a recent increase in interest regarding social phobia because of higher than expected incidences of social phobia, and because social phobia leads to disrupted relationships, severe anxiety, depression, substance abuse and loss of natural faculties at an important level in patients. Until recently, the concept of self-esteem in psychiatry literature in broadest terms, has been a judgment that show "how a person values him". The present study aimed to determine the impact of social phobia of self-esteem & self-image of university life, study participant were 100 students choose by randomly in university of Kelaniya. Our Subject were administered the Rosenberg self-esteem scale &Social phobia scale (SPS). And also we analyzed data by using SPSS. Moreover, our objective is, to demonstrate the prevalence of social phobia & its relation to body image and self- esteem. Basically our research question is the present study aimed to determine the impact of social phobias and how it effect of self-esteem and self-image of university students. The result show that persons with social phobia have lower self-esteem and more distorted body image than do those without social phobia. Finally, we can identify there were some limitations. Those are; This study does not represent the general population and also this study does not represent the changes in outpatients' body image & self-esteem before and after therapy.

***Keywords:*** *Self-image, self-esteem, social phobia, university students, work performance*

[1] Department of Philosophy, University of Kelaniya, Vihahimaya0717@gmail.com

# The effectiveness of holding Advanced Level GIT examination in online

K. Vithanawasam[1], M.P.Lakshani, R.G.R.T.Dharmarathna, W.C.L.Weerakkody, H.M.D.I.Herath

## ABSTRACT

This research discussed about the effectiveness of holding General Information Technology examination which is held for Advanced Level students in online. This is a computer related optional subject that has to be appeared by all the A/L candidates. The GIT examination had started in 2005, but it became compulsory in 2015. From 2005 to 2018 the GIT paper was held as a writing paper. But in 2019 the Examination Department has decided to hold the GCE A/L GIT examination as an Online pilot test. It was held from 11th of march 18th of march at 655 centers with the participation of 186,097 candidates. Two exam papers were given for 3hours. 10 extra minutes was granted as a loading time and paper should be answered according to the system. The candidates who got the admission for the GIT pilot examination 2019 were the population of the research and some candidates who got the admission for GIT pilot paper, were randomly selected from the western province . Finding whether the candidates have the basic computer literacy, the most effective method is either online paper or writing paper, issues that were occurred during the examination sessions and the effectiveness of holding the GIT paper as online paper continuously were the objectives of the research. The outcome of this research indicates that most of the students don't have primary computer literacy even to operate a computer and they haven't enough facilities to learn. Therefore, some students were afraid of facing the exam and some were even not participated. Moreover, some students were not able to face the examination properly due to some issues like power cutting and system errors. Finally, this research gives a conclusion that this online pilot paper wasn't successful one without a proper preparation and it is better to hold the GIT examination as a written paper.

***Key words:*** *A/L GIT examination, Advanced Level students, Online examination, effectiveness, Sri Lanka.*

[1] Department of Social Statistics, University of Kelaniya, kaushidulanjani@gmail.com

# Fashion Trendings (Attitudes) Among Undergraduates (Reference to University of Kelaniya)

D. D. W. N. Gunarathna[1], H. P. C. N. Herath, H. A. N. D. Hettiarachchi, S. G. L. O. Hansini, D. D. Y. N. Gunarathna

## ABSTRACT

Fashion is a communicational product. In easphepips, fashion has been defined as it is a collection of uppredicapevly (beautiful) ideas and according to history, fashion is a center of alter social trending, through the history. In the literature review, it was highlighted that many of the surveys have been based on women. There is a limited number of surveys which considered university students as the research field. Therefore, research problem is what is the opinion of the undergraduates in university of Kelaniya, towards the fashion trending. Is there any influence on the fashion selections, by the educational background of the undergraduates and does it vary between the various economic levels and fashion trending? Key objective is to finding out the social, economic and educational impact on the fashion trending of undergraduates. 80 undergraduates selected form the faculty of Social Sciences, Humanities, Commerce and Management and Science using stratified sampling method used. Collecting data for Primary data is selected to using a questionnaire and secondary data obtained from the ICCMS and Academic Division. In order to present and analyze data the specified statistics soft wares such as SPSS, Excel and Minitab used. Several data analysis methods were used to present data analysis. Therefore, mean comparison test, multiple response cross tabulation table, correlation, regression analysis and chi square testing. It was possible to get a lot of findings on the data analysis. Many of undergraduates select clothes, Shoes and cosmetics as their fashion types. Few of undergraduates select bags and salon as their fashion types. There is a weak positive correlation between the monthly income and the expenditure on fashion. There is no relationship between time for fashion and time for education of undergraduates. Friends and the culture are the most external factors on focusing for fashion. 65% of undergraduates use technology for their fashion. There is no significant relationship between faculty & taste of fashions of undergraduates. We suggest organizing programs to improve the awareness of undergraduates on how important fashions in accordance with personality development and the undergraduates should be led to participate in the programs held by cultural centers in the university.

***Key words:*** *Clothes, Fashions, University, Student*

[1] Department of Social Statistics, University of Kelaniya, wathsalaniromi@gmail.com

# Household Well-Being Ranking Tools' Application in Local Context Sri LankaCase Study – A Section of Kelani Valley Railway Line

D. D. W. N. Gunarathna[1]

## ABSTRACT

The existing poverty monitoring system in Sri Lanka only measured up to the district level. It has been unable to meet the requirement of the government and other poverty intervention organizations for identifying the extremely poor households and evaluate the selected poverty interventions. However, the extreme poorest household is to be unrecoverable from their present level because they did not receive any assistance not only from the society but also from the responsible authorities. Another major issue arising with this measurement is considering only monetary dimensions of a household. Nowadays most developing countries tend to use the multidimensional well-being index to measure their individual well-being levels which can use for comparing up to international level. According to those reasons, this study is seeking a well-being measuring index to selected case study area and compare the different measurement and their applicability and limitations. To conduct this research, case study selected as Kelani Valley railway line either side household from baseline railway station to Cotta road railway station with 300 sample households. The developed index included 19 indicators and the survey questionnaire designed basing those indicators. With the analysis results, only 11 indicators are significance with the 0.05 level and with the significant indicators, the new index is derived. Furthermore, the derived index, peoples' perceptions and existing poverty measurement modeling with linear regression (SPSS) and compared each model and indicators to find out the best tool for wealth ranking in the local context.  Derived index and existing poverty measurement more significance with the 0.05 level.  As the final conclusion though this research tends to intervene in a new well-being index with multi-dimensions the existing measurement more reliable than it. but the well-being index more correlates with the indicators than the existing measurement.so it is good to rethink the existing measurement improvement with new indicators and the monitor system can break down up to the local level which is more useful to knowing well-being levels as individuals or community.

***Keywords:*** *well-being index, households, linear regression model*

[1] Department of Social Statistics, University of Kelaniya, Wathsalaniromi2gmail.com

# Time to first employment (A Special Reference to the Graduates of University of Kelaniya)

A. P. D. N. Perera[1], D. K. M. Malagala, M. Rasanjalee, P. T. Pathirana, R. R. A. L. W. Ranathunga

## ABSTRACT

Graduate Employability means that higher education alumni have developed the capacity to obtain work. The recent experience reveals that even talented graduates have to wait for a long time to be employed after the graduation. Many of the graduates have passed out obtain a certificate, which does not help enough them to find suitable employments. Under this circumstance, graduates' unemployment has become a severe problem in Sri Lanka during the last few decades. Therefore, this study was conducted in order to investigate that, is there a difference between the graduates' faculties and the time to first employment. The sample was chosen using stratified random sampling method. Under the proportional system, 5% of the total population was selected for the sample. The sample of the survey is only from the latest passed out 100 graduates of university of Kelaniya in 2017. Primary data was collected by giving questionnaires to the selected sample unit. Secondary data was obtained from the academic section of the university of Kelaniya and literature survey. Collected data was analyzed using the SPSS software and MS Excel. Mean as a central tendency measure, Chi square test and Point & Interval estimation were used as analysis methods. Analyzed data was presented by using tables and charts. According to the data analysis, the average time of getting the first employment of a graduate is about five months. According to the ANOVA table, P-value is 0.044. Hence it can be concluded that there is significant difference on average time to first employment as per faculties at 95% confidence level. According to the interval estimation, that is, out of 2038 graduates, a number between 1810 to 2022 may employ by now. Finally, we can conclude that there is a difference between the faculty and time to first employment of graduates as per faculties.

***Key words:*** *Graduate employability, Faculty, First employment, Time*

[1] Department of Social Statistics, University of Kelaniya, nadeeshaniperera95@gmail.com

# Impact of the Ragging Session on the Academic Performance of Undegraduates: With Reference to the University of Kelaniya

S. D. A. Shashikala[1], E. A .K. Gayeshani, L. M. G. Navodya, R. B. I. V. Rathnamalala, A. M. Dilini

## ABSTRACT

Ragging has become a major concern of society today. Ragging is a disturbing reality in the higher education system of our country. Despite the fact that over the years ragging has claimed hundreds of innocent lives and has ruined careers of thousands of bright students because in this research. Our objectives are find the actual prevalence of ragging in Sri Lankan Universities, to find the relationship between participation in ragging religion and gender and to find the effect of ragging on academic performance. For accomplishing the objectives the sample of 100 students who can read and write Sinhala and English languages. Students were included 1st year and 2nd year in faculty of social science, faculty of humanities, faculty of management and faculty of science in university of Kelaniya. Twelve male students and thirteen female students were included each faculty and each year. We hope to collect data by giving them a questionnaire and by a face to face discussion. We hope to take more female students than male students and more buddhist students than other religions. Because they are the most in University of Kelaniya. The results of this research based on quota sample method and we don't use faculty of medical and faculty of computer and technology We use descriptive methods for analysis data those are Central Tendency, Correlation, Regression Analysis (Freehand Method), Scatter Plot Diagrams. Our expected outcome is Ragging is impact for Academic performance of undergraduates. Specially there will be more boys being ragging than girls in the university ragging process.by comparing faculties there is a high incidence of ragging in the faculty of management and faculty of Art.

***Key words:*** *Academic performanc, Ragging session, undergraduates*

[1] Department of Social Statistics, University of Kelaniya, shashikalasenadeera97@gmail.com

# The Status of Psychological and Physical Concerns on Utility of English Medium Undergraduates

K. H. Serasinghe[1], I. K. Galagama, S. N. Gunathilaka

## ABSTRACT

English being recognized as one of foremost communicational tool in various countries and it is most acceptable and popular language other than any other languages. According to Alfitri (2012) 375 million people use English as their first language and 750 million people use English as their second language. English play a major roll within individual lives and as a result of that, utility of English became a major part in each individuals. In academic field English language became prominent language in both staff and undergraduates and leading language of instruction in most of higher education institutions i.e. universities. The main objective of the research was to identify what are the major psychological and physical obstacles face by English medium student within the University premise and as specific objective to examine how demographic nature of student's influence on their continuation of study in English medium. The research has carried out using both qualitative and quantitative research methods. Purposive random sampling method being applied to collect primary data. The sample was consisted with 100 undergraduates under the department of Philosophy, University of Kelaniya. The collected qualitative data through questionnaire has being analysed using SPSS version 22 manually to draw up descriptive statistics. The research has found that, among the total sample 14% of the students face physical difficulties such as body shivering, drowsiness, suffocating, fast heartbeat, and swatting while 32% of students indicated mentally stressed such as feeling uneasy, confuse, shy, sleepy and anger. Therefore, it can be concluding as English become provocative language among the English medium undergraduates and that has been caused by psychological, physiological and demographic factors as well.

***Key words**: English, Physical, Psychological, Undergraduates, Utility*

[1] Department of Philosophy, University of Kelaniya, himaserasinghe3@gmail.com

# Search for the sports role models: an investigation into the sports role models of the University of Kelaniya

R. P. D. D Rajapaksha[1], D. S. Wehigaldeniya, A. M. S. J. P Abeykoon, R.W. B. M. D. M. Bandaranayaka

## ABSTRACT

This study was driven for identifying major type of Sport Role Models who influence Sport Participation. Trough, a reviewing of the theoretical background, the major types of Roles Models who faithful for increases Sport Participation were identified. In this study, aimed to find out if the inspirational role had an impact on the motives of university athletes, to start with their sport, to stay in the sport or increase commitment for training and competition to become an elite athlete. An analysis was done using a frequency distribution focusing on 100 student who participate actively in any sport in University of Kelaniya. As well as retrospective method was used to interpret the result of this study. According to Students, their Parents act as Role Model to make sacrifices for the sport. It is the highest in 23.4 %. In addition, friendship contribution act as a Role Model to Sport has begun to increase dramatically. It is mentioned as 22. %. Coaches contribute on Sport Participation Trough Find out daily sports participation. It means that continuous attendance / Retain in sport of the participant continually observed by Coaches 21.6%. Sport Stars contributes and act as Role Model for observers changing behaviour. Particularly way of playing of the participant in sport has been highly influenced by Sport Stars. It is symbolized as 36.15%. This study expands the Knowledge on Sport Role Models and Sport Participation. It also highlights the involvement of various Role Models at each stage to enhance the sports participation of university players. This observation may help to researchers who willing to conduct Sport Role Models and Sport participation and this research has potential to use as a Sport participation development programs particularly University of Kelaniya.

***Key words:*** *Sports Role Model Sport Participation, University sports, Sport Development*

[1] Department of Sport Science and Physical Education, University of Kelaniya, dushshanthadeepal@outlook.com

# විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය උසස් අධ්‍යාපනය කෙරෙහි ඇති බලපෑම (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින් )

කේ. එම්. ඩී. එම්. තිලකරත්න[1]

**සංක්ෂේපය**

ඉංග්‍රීසි භාෂාව යනු වර්තමාන සමාජය තුළ ඉතාමත් වැදගත් සහ අත්‍යාවශ්‍ය සාධකයක් බවට පත්ව ඇති භාෂාවකි. උසස් අධ්‍යාපනය ලබන්නන්ට මෙය ඉතාමත් සුවිශේෂී සාධකයක් වී ඇත. උසස් අධ්‍යාපනයට පිවිසීමේදී ඉංග්‍රීසි භාෂාව පිළිබඳව පවත්නා වූ සාක්ෂරතාවය පිළිබඳ අවධානයක් යොමු නොකළ ද උසස් අධ්‍යාපනය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා ඉංග්‍රීසි භාෂා දැනුමක් පැවතිය යුතු වීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය උසස් අධ්‍යාපනයට කෙසේ බලපාන්නේද යන්න අරමුණු කොට ගෙන කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් 150 කින් යුත් නියැදියක් තෝරා ගනු ලැබූ අතර එහිදී එක් පීඨයකින් විද්‍යාර්ථීන් 30 බැගින් නියෝජනය වන ලෙස සසම්භාවී ලෙස ස්තෘත නියැදීම යටතේ සමාජ විද්‍යා, මානව, වාණිජ හා කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ පීඨයන් නියෝජනය වන ලෙස නියැදිය තෝරා ගන්නා ලදී. එමෙන්ම මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලි ක්‍රමය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කළ අතර ද්විතීයික දත්ත ලෙස ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ප්‍රකාශිත වාර්තා ලබා ගන්නා ලදී. ඉංග්‍රීසි භාෂා අධ්‍යයනයට විද්‍යාර්ථීන් දක්වන රුචිකත්වය 40%ක් පමණ වූ අතර 65%, 35%, 81%, 93%, 70% ලෙස සමාජ විද්‍යා, මානව විද්‍යා, වාණිජ හා කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ පීඨයන්හි විද්‍යාර්ථීන්ගේ තෘප්තිමත්භාවය පළ කොට ඇත. එම පීඨ 5 තුළ අ.පො.ස. (උ/පෙළ )ඉංග්‍රීසි භාෂාව අසමත් වීම 60%, 80%, 45%, 20%, 70% ලෙස දක්නට ලැබුනි. මෙයට ප්‍රධාන හේතුන් වූයේ දරුවන් තම අධ්‍යයන කටයුතු වලදී ප්‍රධාන විෂයන් වලට දැඩි අවධානයක් යොමු කිරීමත් ඉංග්‍රීසි භාෂාව කෙරේ එතරම් උනන්දුවක් නොතිබීමත් ය. 2017 වසරේදී අ.පො.ස. (උ/පෙළ) විභාග සඳහා ළමුන් 253330 ක් පෙනී සිටි අතර ඔවුන්ගෙන් 163104 ක් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති අතර මොවුන්ගෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වී ඇත්තේ 48.88%ක ප්‍රමාණයකි. මෙයට ප්‍රධාන හේතු ලෙස ඉදිරිපත් ව තිබුනේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඉංග්‍රීසි භාෂාව සමත් වීම අනිවාර්යය නොවීම, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට ප්‍රමාණවත් ගුරුවරු පාසල් වල නොමැති වීම, ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම පිළිබඳව අවබෝධයක් නොමැති වීමයි. මේ අනුව අවසන් නිගමනය වූයේ උසස් අධ්‍යාපනයට යොමු වීමට ප්‍රථමව ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය පිළිබඳ නිසි අනවබෝධය නිසා උසස් අධ්‍යාපනයට යොමු වීමේදී මොවුන් දැඩි ලෙස පීඩාවට පත් වන බවයි.

***මුඛ්‍ය පද:*** *ඉංග්‍රීසි භාෂාව, අ.පො.ස. (උ/පෙළ), උසස් අධ්‍යාපනය, විද්‍යාර්ථීන්, විශ්වවිද්‍යාල*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dineshmadusankat@gmail.com

# උසස් පෙළ සිසුන් පුස්තකාල භාවිතය සඳහා යොමු වීමේ ප්‍රවණතාවය

ඒ. එච්. එම්. එල්. එම්. අබේරත්න[1]

**සංක්ෂේපය**

තම අධ්‍යන කටයුතු වඩාත් සාර්ථක කර ගැනීම සඳහා, නව දැනුම එක්කර ගැනීම සඳහා පුස්තකාල භාවිතා කිරීමට මෙම සිසුන් යොමුවීමේ ප්‍රවණතාවය පිළිබඳ මෙමගින් අධ්‍යයනය කෙරේ. ගම්පහ දිස්ත්‍රික්කයේ සිසුහු 100 දෙනෙකු තෝරාගෙන ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස් කරන ලදී. මෙම දත්ත විශ්ලේෂණය කිරීමට විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම භාවිතා කරන ලදී. මෙම අධ්‍යනයේදී සිසුන් 18%ක ප්‍රතිශතයක් ප්‍රකාශකර සිටියේ ඔවුන් කිසිම ආකාරයකින් පුස්තකාල භාවිතා නොකරන බවයි. තවත් 35%ක ප්‍රතිශතයක් ප්‍රකාශකර සිටියේ ඔවුන් පුස්තකාල කාල පරිච්ඡේදයේදී හා විවේක කාලයේදී තම පුස්තකාල භාවිතා කරන බවයි. තවත් 7%ක ප්‍රතිශතයක් ප්‍රකාශ කර සිටියේ ඔවුන් සෑම විටම තම අධ්‍යන කටයුතු සඳහා පාසල් පුස්තකාල මෙන්ම මහජන පුස්තකාල සේවාවන්ද භාවිතා කරන බවයි. මෙම අධ්‍යන හරහා ඔවුන් හදාරන විෂය ක්ෂේත්‍ර අනුවද ඔවුන්ගේ පුස්තකාල භාවිතය වර්ගීකරණය කිරීමට හැකිවිය. එහිදී අනාවරණය වූ ආකාරයට කලා විෂය හදාරන සිසුන්ගෙන් පුස්තකාල භාවිතයට සිසුන් 15%ක් වූ අතර තාක්ෂණවේදය හදාරන සිසුන්ගේ පුස්තකාල භාවිතය 5%ක් පමණ ඉතා අඩු මට්ටමක විය. වාණිජ විෂය හදාරන සිසුන්ගේ පුස්තකාල භාවිතය 24%ක ප්‍රතිශතයක්ද,ජීව විද්‍යාව හදාරන සිසුන් 32%ක ප්‍රතිශතයක්ද, ගණිතය විෂය හදාරන සිසුන් 24%ක ප්‍රතිශතයක්ද පුස්තකාල භාවිතා කරන බව තහවුරු කරන බව තහවුරු විය. සිසුහු පුස්තකාල භාවිතය අවම වීමට හේතු විමසූ විට අනාවරණය වූයේ ඔවුන්ට අතිරේක පන්ති ආදිය නිසාවෙන් කාලය නොමැති වීම, පාසල්වල අවශ්‍ය තරම් පහසුකම් නොමැති වීම, අන්තර්ජාල භාවිතයෙන් වඩාත් පහසුවෙන් හා ඉක්මනින් විෂය කරුණු ලබාගත හැකිවීම ආදියයි. කෙසේ වුවත් සිසුන් පුස්තකාල භාවිතය තුළින් පොතපත පරිශීලනය වැඩිවශයෙන් යොමුකරවාලී ඔවුන්ගේ අනාගත අධ්‍යාපනයයි. මොවුන්ට අනාගත ජීවිතය ආලෝකමත් කරගැනීමට මෙය විශාල පිටුවහලකී.එමනිසා පාසල් පුස්තකාල මෙන්ම මහජන පුස්තකාලද විධිමත් ලෙස සංවර්ධනය කර ඒවායේ පහසුකම් වැඩි දියුණු කිරීම වර්තමානයේ පවතින ජාතික අවශ්‍යතාවකි.

***මුඛ්‍ය පදඃ*** *පුස්තකාල භාවිතය, උසස්පෙළ සිසුන්, මහජන පුස්තකාල, පාසල් පුස්තකාල*

[1] Department of Social Statistics, University of Kelaniya, ahmiprarthana@gmail.com

# ගණිකා වෘත්තිය කෙරෙහි තරුණියන් පෙළඹීමට බලපාන සාධක (කොළඹ දිස්ත්‍රික්කය ඇසුරින්)

පී.ඒ.එස්.එම්.දීපෂිකා[1]

## සංක්ෂේපය

ගණිකා වෘත්තිය යනු මෙරට සමාජ සංස්කෘතිය තුළ නිරන්තරයෙන්ම ගැරහුමට ලක්වන නීතිවිරෝධී වෘත්තියකි. නමුත් ඔවුන් නීතියේ රැහැනට හසුවීම මෙන්ම ඔවුන්ගේ ස්වයං පාපොච්චාරණයන් ආදී පුවත් නිරන්තරයෙන් අප මාධ්‍ය ඔස්සේ දැකීමෙන් ගම්‍ය වන්නේ එය වර්තමානයේ විශාල සමාජ ඛේදවාචකයක් බවට පත්වී තිබෙන බවයි. මෙම  අධ්‍යනයේදී ප්‍රධාන වශයෙන් අවධානය යොමුවූයේ වයස අවුරුදු 18-30 තරුණියන් ගණිකා වෘත්තිය කෙරෙහි යොමු වීමට බලපාන සාධක හඳුනාගැනීමයි. හිමබෝල නියැදීම භාවිතයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ඉහත වයස් කාණ්ඩයේ තරුණියන් 100 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් ලබාගැනීමට සිව්මසක් ගත විය. ඔවුන් සමඟ සම්මුඛ සාකච්ඡා තුලින් අවශ්‍ය දත්ත රැස්කර ගන්නා ලද අතර එම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම යොදාගන්නා ලදී. මෙම අධ්‍යනයේදී විශේෂයෙන්ම පෙනීගිය කරුණක් නම් මෙම තරුණියන්ගෙන් වැඩි පිරිසක් වයස අවුරුදු 18 පිරීමටත් මත්තෙන් විවිධ ලිංගික අතවරයන්, හිංසාවන්ට නිරතුරුව ගොදුරු වූවන් බවයි. එසේ දිගින් දිගටම සිදුවීම නිසාවෙන් අද වනවිට මෙය තම වෘත්තිය බවට පත්කර ගත් පිරිස ප්‍රතිශතයක් ලෙස 54%කි. එමෙන්ම 39% පිරිසක් මෙලෙස අතවරයන්ට පත්වී ඇත්තේ තම පවුලේ ඥාතීන්ගෙන් හෝ සමීපතමයන්ගෙන් බව වැඩිදුරටත් අනාවරණය විය. එමෙන්ම පැල්පත්වාසී ජීවන රටාව හේතුවෙන්  කුඩාකල සිටම අධික මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවී තම මත්ද්‍රව්‍ය සඳහා දෛනිකව අවශ්‍ය වන මුදල උපයා ගැනීමටම මෙම වෘත්තියේ නියැලෙන පිරිස 17% ප්‍රතිශතයක් විය. සිය පවුලේ ආර්ථික අවශ්‍යතා සපුරාලීමට මෙය වෘත්තීය කරගත්  පිරිස 20% ලෙස අනාවරණය කරගත හැකිවිය. කෙසේ වූවද පොදුවේ ගත්කල මෙම තරුණියන්  සියලු දෙනාම පාහේ අධික මානසික පීඩාවන් විඳදරා ගනිමින්, සමාජය කෙරෙහි වෛරයෙකින් පසුවන්නන් බව වඩාත් හොඳින් පැහැදිලිවූ අතර මෙවන් පිරිසකගෙන් කිසිදු විටෙක සමාජයට යහපතක් බලාපොරොත්තු විය නොහැක. එමෙන්ම මෙම පිරිස් සමාජයෙන් පිළිකුල් නොකොට වඩාත් යහපත් අයුරින් සමාජගත කිරීමට ක්‍රියාමාර්ග ගැනීම කාලීන සමාජීය අවශ්‍යතාවයකි.

***මූඛ්‍ය පදඃ*** *තරුණියන්, ගණිකා වෘත්තිය*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, mihiranithegreat@gmail.com

# ළමා අපයෝජන සිද්ධි වාර්තා වීමේ ප්‍රවණතාවය (බස්නාහිර පළාත ඇසුරින්)

කේ. කේ. ඩබ්ලිව්. සුබෝදනී[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ පවතින නීතිය අනුව වයස අවුරුදු 18 ට අඩු සියලු මනුෂ්‍යයන් ළමයින් වේ. ළමයෙකුගේ කායික හා මානසික තත්ත්වයට පිටස්තරව ඔහුගේ හෝ ඇයගේ යහපතට හා මනා කල් ක්‍රියාවට එරෙහිව සිදුකරනු ලබන කුමන හෝ අයහපත් ක්‍රියාවක් ළමා අපයෝජනයක් ලෙස හැඳින්වේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ දැවෙන සෞඛ්‍ය හා සමාජ ගැටළුවක් බවට මෙය පත්ව ඇත. ඒ අනුව බස්නාහිර පළාත තුළින් වාර්තා වන ළමා අපයෝජන ප්‍රමාණය ක්‍රමයෙන් ඉහල යාම ගැටළුවක් ලෙස ගෙන අධ්‍යනය කිරීමේදී ප්‍රධාන අරමුණ ලෙස වසර පහක් තුල බස්නාහිර පළාතේ ළමා අපයෝජනය සංඛ්‍යාවේ වර්ධනය කොපමණද යන්න පරික්ෂා කිරීමත් උප අරමුණක් ලෙස වැඩි වශයෙන් වාර්තා වන ළමා අපයෝජන කාණ්ඩය කුමක්ද යන්න පිළිබඳව සොයා බැලීමත් සලකා බලයි. එහිදී ශ්‍රී ලංකාවේ වැඩිම ළමා අපයෝජන ප්‍රමාණයක් වාර්තාවන බස්නාහිර පළාත් පහසු නියදීම යටතේ තෝරාගත් අතර 2014 සිට 2018 වර්ෂය දක්වා ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති දත්ත වාර්තා ද්විතීයික දත්ත ලෙස භාවිතා කරන ලදී. අධ්‍යනය සඳහා බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනෙන් වාර්තා වූ ළමා අපයෝජන සංඛ්‍යා දත්ත යොදාගත් අතර ප්‍රස්තාර හා වගු භාවිතය දත්ත ඉදිරිපත් කර ඇත. ඒ අනුව මුලු දිවයිනටම සාපේක්ෂව බස්නාහිර පළාතේ 2014 වර්ෂයේ 30.75% ක් ලෙස වාර්තා වූ ළමා අපයෝජන සංඛ්‍යාව 2015 වර්ෂය වන විට 31.15% දක්වා වර්ධනය වී ඇති අතර 2016 වර්ෂයේදී 29.33 % ක් දක්වා අඩු වී ඇත. නමුත් 2017 වර්ෂය වන විට 31.81% දක්වා නැවත වර්ධනය වී ඇති මෙම ප්‍රතිශතය 2018 වර්ෂය වන විට පෙර වර්ෂ සියල්ලටම වඩා වර්ධනය වී 31.92%ක අගයක් ගනී. එමෙන්ම වැඩිම ළමා අපයෝජන ප්‍රමාණයක් සෑම වර්ෂයකදීම කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති අතර සළකා බැලූ වර්ෂ පහ තුළ සමස්ත ශ්‍රී ලංකාවේ ළමා අපයෝජන සංඛ්‍යාවේ ප්‍රමාණය උස් පහත් වෙමින් වර්ධනය වේ. 2017 වර්ෂයට වඩා ළමා අපයෝජන 498 ක් 2018 වර්ෂයේදී වාර්තා වී ඇති අතර බස්නාහිර පළාත තුළද 2017 වර්ෂයට වඩා ළමා අපයෝජන 169 ක් 2018 වර්ෂයේදී වාර්තා වී ඇත. සෑම වසරකම විවිධ අපයෝජනයන් කාණ්ඩය හා හිරිහැර වදහිංසා පිළිබඳ අපයෝජන කාණ්ඩයන්ගේ ළමා අපයෝජන ප්‍රමාණයන් ඉතා වැඩි වශයෙන් වාර්තා වී ඇති බව තහවුරු විය.

***මුඛ්‍ය පදඃ*** *බස්නාහිර පළාත, ළමා අපයෝජන, ප්‍රවණතාවය*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wathsalakottage@gmail.com

# පුද්ගල පෞරුෂය වර්ධනය කෙරෙහි පවුල් සංස්ථාවේ බලපෑම පිළිබඳ සමාජ මනෝවිද්‍යාත්මක අධ්‍යයනයක්.

එම්. ඒ. එම්. සඳමාලි[1]

## සංක්ෂේපය

ඕනෑම සමාජයක විධිමත් සැකැස්ම පවුල මගින් නිරූපණය කරයි. සමාජය තුළ පවතින සංස්ථා ලෙස පවුල් සංස්ථාව, අධ්‍යාපන සංස්ථාව, ආර්ථික සංස්ථාව, දේශපාලන සංස්ථාව, ආගම, නීතිය යන සංස්ථා එකිනෙකට සම්බන්ධ වන අතර එක් සංස්ථාවක් බිඳ වැටීම අනෙකුත් සංස්ථා කෙරෙහි විවිධ ලෙස බලපානු ලබයි. ඒ අනුව ශ්‍රී ලාංකේය සමාජය තුළ පවුලේ කාර්යභාරය හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය ඉතා වැදගත් වී ඇත. පුද්ගලයෙකු සතුව ඇති "මා", "මාගේ", "තමා", යන හැගීම් ගොඩනැගීමට සමාජානුයෝජනය අවශ්‍ය වේ. මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය වූයේ ප්‍රාථමික සමාජානුයෝජන ක්‍රියාවලිය තුළින් පුද්ගල පෞරුෂය ඉහළ නැංවීමත්, ඒ තුළින් සමාජ ප්‍රගමනයට සියළු දෙනා දායක කර ගන්නේ කෙසේ දැයි හඳුනා ගැනීමත් ය. එහි දී ප්‍රධාන අරමුණු ලෙස, පෞරුෂ වර්ධනයට කුඩා කළ සිට නිසි සමාජානුයෝජනයක් අවශ්‍ය බව පෙන්වා දීම, පවුල තුළින් සිදුවන අපගාමී චර්යාවන් සමාජයට ඇති කරන බලපෑම අධ්‍යයනය කිරිම, පවුල් සංස්ථාවේ විවිධ බලපෑම් තුළින් පුද්ගල පෞරුෂයට ඇතිවන බලපෑම අධ්‍යයනය කිරිම සහ සමාජ වෙනස් වීමට සාපේක්ෂව පුද්ගලයාගේ කාර්යභාරය වෙනස් වී දැයි අධ්‍යයනය කිරිමය. මෙම අධ්‍යයනය සඳහා මුලටියන ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාකඳුර-නැගෙනහිර සහ රංසෑගොඩ-නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් යොදා ගනු ලැබීය. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිතා කරනු ලැබීය. නියැදිය ලෙස සසම්භාවි නියදි ක්‍රමයක් වන සරල සසම්භාවි නියදි ක්‍රමය යටතේ පවුල් 50 කින් ලබාගත් දත්ත SPSS සහ Excel වැනි පරිගණක මෘදුකාංග යටතේ විශ්ලේෂණය කරන ලදි. මෙම පර්යේෂණයේ නිගමනය වන්නේ පෞරුෂය වර්ධනයට කුඩාකළ සිටම නිසි සමාජානුයෝජනයක් පවුල තුළින් ලැබීම මඟින් යහපත් ස්වීයත්වයකින් යුතු පුද්ගලයින් බිහි වේ. එසේ නොමැති වූ විට අපගාමී චර්යාවන් වලට යොමු වන පුද්ගලයින් හඳුනා ගත හැකිය. පුද්ගල ආකල්ප වර්ධනය, මානසික ආතති කළමනාකරණය, ධනාත්මක පෞරුෂ ලක්ෂණ ගොඩනගා ගැනීම, නායකත්වය ප්‍රගුණ කිරීම, ආත්මය ගොඩනගා ගැනීම ජීවත්වන පරිසරය මෙන්ම සාර්ථක ජීවිතයක් ගොඩනගා ගැනීමට අත්‍යාවශ්‍යය සාධක පැවතිය යුතු බව නිගමනය කළ හැකිය. යම් රටක සමාජය ශක්තිමත් කිරිමට නම් යහපත් ස්වීයත්වයකින් හෙබි ගුණ ගරුක සමාජයකට පවුල් සංස්ථාව ශක්තිමත් විය යුතු ය. ඒ තුළින් මනා කායික හා මානසික වර්ධනයක් සේම පෞරුෂත්වයක් සහිත පුද්ගලයින් බිහි වනු ඇත.

***මුඛ්‍ය පදඃ*** *පුද්ගලයා, පවුල, සමාජානුයෝජනය, පෞරුෂය, සමාජ ප්‍රගමනය*

[1] සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, manojimunasinghe@gmail.com

# ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ව්‍යාප්තිය සහ එහි ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක්

කේ. ඩී. ලියනගේ[1], කේ. එම්. ජී. එම් . ඩයස්, ඒ. එන්. දිල්ෂාරි, එස්. එච්. ඒ. ප්‍රභාෂිණී

**සංක්ෂේපය**

මත්ද්‍රව්‍ය දූර්භාවිතය සමාජමය අධ්‍යයන අතර සාකච්ඡාවට බඳුන්වන ප්‍රධාන නිර්ණායකයක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම ඒඩ්ස්, හෙපටයිටීස් සී, හෙපටයිටීස් බී වැනි රෝග තත්ත්වයන් මත්ද්‍රව්‍ය භාවිතා කරන ජනගහනය අතර බහුල වශයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. මත්ද්‍රව්‍ය දූර්භාවිතය කාලානුරූපීව විවිධ සමාජ, ආර්ථික හා දේශපාලන සංසිද්ධීන්ගේ බලපෑමට ලක්වෙමින් වෙනස් වන ප්‍රපංචයකි. මෙවැනි පසුබිමක් තුළ සිට මත්ද්‍රව්‍ය දූර්භාවිතය පාලනය හා නිවාරණය කිරීම උදෙසා සක්‍රීයව මැදිහත් වීමේදී එසේ ඇතිවන වෙනස්කම් සහ නව ප්‍රවණතා හඳුනා ගෙන තිබීම මනා පිටිවහලක් වෙයි. මෙම අධ්‍යයනය තුළ ප්‍රධාන පර්යේෂණ ගැටළුව බවට පත්වූයේ, මත්ද්‍රව්‍ය නිවාරණයට සක්‍රීය දායකත්වයක් තිබුණද මත්ද්‍රව්‍ය දූර්භාවිතය වසංගතමය තත්වයක් බවට පත්ව ඇත්තේ ඇයි දැයි යන්න අධ්‍යනය කිරීමයි. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණු ලෙස මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය ඉහළ සහ පහළ ප්‍රදේශ හඳුනා ගැනීමත්, මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව ප්‍රවණතා හඳුනා ගැනීම සහ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ කාලීන පැතිකඩ අධ්‍යයනය කිරීමත් පදනම් කොට ගෙන ඇත. මේ සඳහා අධ්‍යන ක්ෂේත්‍රය ලෙස 2018 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම්, බන්ධනාගාරගත වීම් සහ ප්‍රතිකාර සඳහා යොමුවීමට අදාළ දත්ත සැළකිල්ලට ගනිමින් දිවයිනේ ඉහළ ව්‍යාප්තියක් සහිත පළාත් වල ඉහළ ව්‍යාප්තියක් සහිත දිස්ත්‍රික්කයන් සහ එම දිස්ත්‍රික්කයන් තුළ ඉහළ ව්‍යාප්තියක් සහිත පොලිස් බල ප්‍රදේශ 25ක් යොදා ගෙන ඇත. මේ සඳහා ද්විතීයික දත්ත යොදාගත් අතර එම දත්ත ශ්‍රී ලංකාවේ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පර්යේෂණ වාර්තා මගින්, සඟරා, පොත්පත් සහ අනෙකුත් වාර්තා මගින් ලබා ගන්නා ලදී. මෙම අධ්‍යනයට අනුව අන්තරායකාර ඖෂධ ගණයට ගැනෙන මත්කාරක ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා අනුව බහුතරයක් පිරිස බහුවිධ මත්ද්‍රව්‍ය භාවිතා කරන බවත්, මත්ද්‍රව්‍ය භාවිතයට මුලින්ම යොමු වන වයස් සීමාව පිළිබඳව සැළකීමේදී බහුතරයක් පුද්ගලයින් වයස අවුරුදු 15ත් 19ත් අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිතා කිරීමට යොමුවී ඇති බවත් හඳුනා ගත හැකිවිය.

***මුඛ්‍ය පදඃ*** *මත්ද්‍රව්‍ය දූර්භාවිතය, මත්ද්‍රව්‍ය ආශ්‍රිත නූතන ප්‍රවණතා, අවධානම් සහගත බලපෑම්, අන්තරායකර ඖෂධ, මත්ද්‍රව්‍ය භාවිත රටා*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dilharaliyanage9651@gmail.com

# ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතයේ ප්‍රවණතාවය (බස්නාහිර පළාත ඇසුරින්)

කේ. කේ. ඩබ්ලිව්. සුබෝදනී[1], ඩී. එස්. අබේසිංහ


**සංක්ෂේපය**

වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ පුද්ගලයින් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීම විශාල සමාජ ගැටළුවක් බවට පත්ව ඇත. මත්ද්‍රව්‍ය භාවිතය ආරම්භය මෑතකාලීනව සිදු නොවුනද අද වන විට එම තත්වය සීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පවතී. 2018 වර්ෂයේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් වැඩි වශයෙන් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාත තුළින් වන අතර එම කරුණ පර්යේෂණ ගැටළුව ලෙස යොදා ගෙන 2015 සිට 2018 දක්වා වසර හතරක් තුළ බස්නාහිර පළාතේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් වාර්තා වීමේ ප්‍රවණතාවය සොයා බලන ලදී. තවද වැඩිම වශයෙන් භාවිතා කරනු ලබන්නේ කුමන මත්ද්‍රව්‍ය ද යන්න සොයා බැලීමත් සහ බස්නාහිර පලාතේ දිස්ත්‍රික්ක ත්‍රිත්වය තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් පුද්ගලයින්ගේ ව්‍යාප්තිය සොයා බැලීමත් උප අරමුණු ලෙස යොදාගන්නා ලදී. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි බොහොමයක් වාර්තා වන බස්නාහිර පළාත පහසු නියදීම යටතේ තෝරාගත් අතර 2015 සිට 2018 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය විසින් නිකුත් කළ වාර්ෂික දත්ත වාර්තා ද්විතීයික දත්ත ලෙස භාවිතා කරන ලදී. එහිදී 2015 වර්ෂයේ බස්නාහිර පළාත තුළින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි පිළිබඳව අත්අඩංගුවට පත් පුද්ගලයින් සංඛ්‍යාව 49475 ක් වූ අතර එය මුළු අත්අඩංගුවට ගැනීම් වලින් 59.98% ක් විය. 2016 වන විට එම ප්‍රමාණය 60.27% ක් දක්වා ද 2017 වන විට 60.84% ක් දක්වා ද වර්ධනය වී ඇති අතර 2018 දී මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් බස්නාහිර පළාතෙන් අත්අඩංගුවට පත් වී ඇති ප්‍රමාණය 60506 කි. ප්‍රතිශතාත්මකව ගත් විට එම අගය 61.27% කි. ඒ අනුව 2015 සිට 2018 දක්වා බස්නාහිර පළාත තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව වර්ධනය වීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය. එමෙන්ම 2015 සිට 2018 දක්වා බස්නාහිර පළාතේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට පත්වූ පුද්ගලයින් වැඩියෙන්ම වාර්තා වී ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයෙන් වන අතර සෑම වර්ෂයකදීම 'ගංජා' නැමති මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ගේ ප්‍රමාණය ඉහළින් ම පවතී.


***මුඛ්‍ය පද:*** *මත්ද්‍රව්‍ය, බස්නාහිර පළාත, ප්‍රවණතාවය*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wathsalakottage@gmail.com

# සාමාන්‍යපෙළ විභාගයෙන් පසු සිසුන් විවිධ පාඨමාලා සඳහා යොමුවීමේ ප්‍රවණතාව (ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රයෙන්)

පී.ඒ.එස්.එම්.දීපෂිකා[1]

## සංක්ෂේපය

වර්තමානය වනවිට සාමාන්‍යපෙළ විභාගයෙන් අනතුරුව සිසුන් විවිධ ආකාරයේ පාඨමාලාවන් සඳහා යොමුවීමේ විශාල ප්‍රවනතාවයක් දැකිය හැක. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන හේතු සාධක හඳුනාගැනීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ විය. මේ සඳහා නියැඳිය ලෙස ගම්පහ දිස්ත්‍රික්කය තුල වූ පාසල් දහයකින් 2018 වර්ෂයේ සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දුන් සිසුන් 200 දෙනෙකු සසම්භාවීව තෝරාගන්නා ලද අතර ඔවුන් වෙත සරල ප්‍රශ්නාවලියක් ලබා දීමෙන් අවශ්‍ය දත්ත එක්රැස් කරගන්නා ලදී. SPSS , Microsoft Excel මෘදුකාංග මෙන්ම විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම ද දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා විය. මෙම අධ්‍යනයේදී විශේෂයෙන්ම අනාවරණය වූ කරුණු නම් සාමාන්‍යපෙළ විභාගයෙන් අනතුරුව සිසුන්ගෙන් 87% ඉහළ ප්‍රතිශතයක් කුමන හෝ පාඨමාලාවක නියැලෙන බවයි. තවද 49% පිරිසක් ප්‍රකාශ කර සිටියේ ඔවුන් පරිගණක හා ඉංග්‍රීසි භාෂා යන පාඨමාලා ද්විත්වයටම යොමුවන බවයි. එමෙන්ම සිසුන් 24% පිරිසක් ඔවුන් උසස්පෙළ හැදෑරීම සඳහා තෝරා ගැනීමට අපේක්ෂා කරන ලද විෂය ධාරාව හා අනුබද්ධ පාඨමාලාවන් වලට යොමුවන බව අනාවරණය විය. තවද 4% පමණ ඉතා සුළු පිරිසක් දැක්වූ ආකාරයට ඔවුන් තම ඉදිරි වෘත්තීය ජීවිතය සකසා ගැනීමට වෘත්තීය පාඨමාලා තෝරාගෙන ඇත. මෙහිදී ඔවුන් මෙම පාඨමාලා සඳහා පෙළඹීමේ දී තරඟකාරී අධ්‍යාපන රටාව, තරඟකාරී රැකියා වෙළඳපොළ, තාක්ෂනික දියුණුව, පෞද්ගලික රුචිකත්වය, දෙමාපිය පෙළඹවීම කුටුම්භ ආදායම් මට්ටම ආදී සාධක බලපාන බව අනාවරණය විය. වර්තමානය වනවිට විශාල වශයෙන් විවිධ පාඨමාලාවන් පවතින බැවින් වඩාත් ගුණාත්මක, පිළිගැනීමකින් යුතු හා වඩාත් සුදුසුම පාඨමාලා තෝරා ගැනීමට සිසුන්ට විධිමත් මඟපෙන්වීමක් අවශ්‍යම බව මෙහිදී පැහැදිලි විය.

***මුඛ්‍ය පද:*** *සාමාන්‍ය පෙළ සිසුන්, පාඨමාලා*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wathsalakottage@gmail.com

# වකුගඩු රෝගී පවුල්වල ආදායම් හා වියදම් විස්තර පිළිබඳ සමාජවිද්‍යාත්මක විමසුමක්

කේ.පී.එස්.අසංගිකා[1]

## සංක්ෂේපය

ශරීරයේ පැවැත්මට විශාල කාර්යයභාර්යක් ඉටු කරන වකුගඩු, විවිධ හේතු නිසා රෝගී විය හැකි ය. වකුගඩු රෝගීවීම හෙවත් වකුගඩු අකර්මණ්‍යතාවය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි. එනම්, තීව්‍ර වකුගඩු අකර්මණ්‍යතාව (Acute renal Failure) හා නිදන්ගත වකුගඩු අකර්මණ්‍යතාවය (Chronic Kidney disease) යනුවෙනි. මෙම වකුගඩු රෝගයන්ට බලපාන හේතු අතරින්, ඇතැම් හේතු ප්‍රභේද දෙකට ම පොදුවන අතර ඇතැම් හේතු ඒ ඒ රෝගයන්ට විශේෂිත වූ හේතූන් ය. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කලාපවල නැතහොත් වියළි කලාපයේ ජනතාවට බහුල වශයෙන් වැළඳෙන දිගුකාලීන නැතහොත් නිදන්ගත වකුගඩු රෝගය, කෘෂිකාර්මික වකුගඩු රෝගය ''හඳුනානොගත් හේතු නිසා හටගත්'' රෝගී තත්ත්වයකි. මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ වකුගඩු රෝගය කුටුම්භයේ ආර්ථිකයට බලපාන ආකාරය හඳුනා ගැනීම, හා ඔවුන්ට ලබා දී ඇති විසඳුම් කෙතෙක්දුරට යාවත්කාලීන ද යන්න හඳුනාගැනීම වේ. මෙම පර්යේෂණයේ ගැටළුව වශයෙන් තෝරාගනු ලැබුවේ වකුගඩු රෝගය නිසා රෝගියාගේ කුටුම්භයේ ආර්ථිකයට කුමන ආකාරයේ බලපෑමක් සිදුවන්නේද? යන්නයි. ඒ අනුව නිශ්සසම්භාවි නියැඳුම් ක්‍රමය යටතේ සමීක්ෂණ විධික්‍රමයට අනුගතව දත්ත රැස්කිරීමේ ශිල්පක්‍රම වශයෙන් ප්‍රශ්ණාවලි, සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලදී. නියැදිය වශයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රදේශයෙන් වකුගඩු රෝගී 50 දෙනෙක් යොදා ගනිමින් දත්ත දායකයින් ගෙන් සපයාගත් දත්ත SPSS මෘදුකාංගය මගින් විශ්ලේෂණය කරන ලදී. නිදන්ගත වකුගඩු රෝගය නිසාවෙන් සමාජ ආර්ථික ගැටළු රැසකට දෛනික ජීවිතයේ දී මෙම ජනතාව මුහුණ දෙන ආකාරයක් හඳුනාගැනීමට හැකි විය. කෘෂිකර්මාන්තයේ නියැලුණු රෝගීන් බහුතරයක් මේවන විට විරැකියාවෙන් පීඩා විඳීමත්, වැන්දඹු කාන්තා ගෘහමුලික කුටුම්භ බිහිවීමේ වැඩි ප්‍රවණතාවක් හඳුනාගත හැකි අතර එය ආර්ථික සංවර්ධනය කෙරෙහි විශාල බලපෑමක් සිදු කරයි. රෝගයට අවශ්‍ය වන්නා වූ වෛද්‍යමය ප්‍රතිකාර සඳහා විශාල වියදමක් දැරීමට සිදුවීම, රෝගියා ගෘහමූලික වන කුටුම්භයන් හි දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාලවීම වැනි තත්ත්වයන් මෙන් ම රෝගයට ගොදුරු වූ පවුල්වල අවිවාහක තාරුණ්‍යයට විවාහය පිළිබඳ ගැටළු මතු වීම, සමාජ - සංස්කෘතික ගැටළු ඇතුලුව සමාජ ආන්තීකරණයට ලක් වීම, මෙන් ම ආර්ථික ගැටළු රාශියකින් පීඩාවට ලක්වන ආකාරය අනාවරණය කරගැනීමට හැකි විය.

***මුඛ්‍ය පද:*** *නිදන්ගත වකුගඩු රෝගය, කෘෂිකාර්මික වකුගඩු රෝගය, උතුරු මැද පළාත, ආර්ථික ගැටළු, සමාජීය ගැටළු*

[1] සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kprsujani@gmail.com

# ශ්‍රී ලංකාවේ සංවර්ධනය උදෙසා කාන්තාවගේ දායකත්වය (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරෙන්)

ඩබ්ලිව්. ඒ. ඩී. මධුශ්‍රියා[1]

## සංක්ෂේපය

සංවර්ධන ප්‍රවේශය තුළ රටක් අපනයනය වර්ධනය, වාණිජ අංශයේ හා කාර්මීකරණයේ දියුණුවත් බලාපොරොත්තු වේ. කාන්තාව හා සංවර්ධනය යන අංශ ද්විත්වය ශ්‍රී ලංකාව තුළ අනෙක් රටවල් වලට වඩා ප්‍රශස්ත මට්ටමකින් බැඳී පවතින බව සංවර්ධන වේදීහු ප්‍රකාශ කරති. එම නිසා සංවර්ධනය සඳහා කාන්තාවගේ දායකත්වය පිළිබඳ පර්යේෂණය කාලෝචිත වෙයි. සංවර්ධන ක්‍රියාවලිය උදෙසා ශ්‍රී ලාංකික කාන්තාවගේ සහභාගිත්වය කුමන මට්ටමක පවතීද? යන ගැටළුව මූලික කර ගනිමින් මෙම පර්යේෂණය සිදුකර ඇත. මෙම පර්යේෂණයේ පරමාර්ථය ලෙස සංවර්ධනයෙහිලා කාන්තා සහභාගීත්වය වැඩි කර, කාන්තාව සවිබල ගන්වන්නේ කෙසේ ද යන්න පිළිබඳව ද අවධානය යොමුව තිබේ. පර්යේෂණයේ අරමුණු අතර ස්වයං රැකියා පුහුණු වැඩසටහන් සඳහා කාන්තා දායකත්වය සක්‍රීය කිරීම, අඩු දායකත්වයක් දක්වන කාන්තාවන් හඳුනා ගැනීම හා ඊට හේතු සාධක හඳුනා ගැනීම සිදුකර තිබේ. මෙම පර්යේෂණය සමීක්ෂණ ක්‍රමවේදය යටතේ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්ණාවලි හා නිරීක්ෂණය භාවිත කර සොයා ගත් තොරතුරු මගින් පොදු සාමාන්‍යකරණයට ලක් කර නිගමනය ඉදිරිපත් කර තිබේ. සසම්භාවී නියැදි ක්‍රමයේ එන සරල ස්ථරගත නියැදිය උපයෝගී කර ගනිමින් ගම්පහ දිස්ත්‍රික්කය පදනම් කරගත් දත්ත දායකයන් නියැදි ස්ථර හතරක් යටතේ තෝරා ගන්නා ලදී. එනම් පැල්පත් ජනතාව, ග්‍රාමීය ජනතාව, ගැමිරික ජනතාව, නාගරික ජනතාව යන සෑම ස්තරයකින් ම පවුල් පහ බැගින් දත්ත දායකයින් විස්සක් පර්යේෂණ සඳහා දායක කර ගන්නා ලදී. එමගින් ලබා ගත් දත්ත මෘදුකාංග යටතේ විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව සමස්තයක් වශයෙන් කාන්තාව 62% ක සක්‍රීය දායකත්වය දක්වන බවත් ඉන් 58% ක දායකත්වයක් දක්වන්නේ ග්‍රාමීය හා ගැමිරික පවුල්වල කාන්තාව බව අනාවරණය කරගත හැකි විය. ඒ අනුව කාන්තාව හා සංවර්ධනය අතර අනුලෝම සහසම්බන්ධයක් ඇති බව නිගමනය කළ හැකි විය. මේ පර්යේෂණය හරහා සංවර්ධනය සඳහා කාන්තාවගේ දායකත්වය වැඩි කර ගැනීමට යෝජනා කිහිපයක් ඉදිරිපත් කර ඇත. එනම් දුගී හා පැල්පත් වාසී අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා චක්‍රීය ණය පහසුකම සහිතව ස්වයං රැකියා පුහුණු වැඩසටහන් මෙහෙයවීමත්, ඔවුන් සඳහා සංවර්ධනවේදීන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, උපදේශකවරුන් හා විවිධ සංවිධාන මගින් සංවර්ධන ක්‍රමෝපායන් කාන්තාවට හඳුන්වාදීමත්, සංවර්ධන වැඩසටහන් සැලසුම්කරණයේ දී කාන්තාවන් සහභාගී කරවා ගැනීමත් යෝජනා අතර වෙයි. සංවර්ධනය පිළිබඳව මාධ්‍ය සංදේශනය තුළින්, අධ්‍යාපනවේදීන්, සමාජ විද්වතුන්, රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් හරහා කාන්තාව සංවර්ධනය සඳහා දායක කර ගැනීමේ වගකීම නිසි අයුරින් ක්‍රියාත්මක කරවිය යුතුවේ.

***මූඛ්‍ය පදඃ*** *සංවර්ධනය, කාන්තා දායකත්වය*

[1] සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dinushad50@gmail.com

# විශේෂ අධ්‍යාපන ඒකකවල සිසුන්ගේ චර්යාව හැඩගැස්වීම කෙරෙහි අවශේෂ සිසුන්ගේ චර්යාවෙහි බලපෑම

ආර්. එම්. ඒ. ඩී. බී. රත්නායක[1]

**සංක්ෂේපය**

පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය දරුවන් මූලික කර ගනිමින් ඉගැන්වීම සිදුවේ. අධ්‍යාපනය ලබන දරුවන්ගේ ශාරීරික හා මානසික හේතු කරගනිමින් සාමාන්‍ය දරුවන් හා විශේෂ දරුවන් වශයෙන් බෙදීමකට ලක්කර ඔවුන්ට ඉගැන්වීම සිදු කරයි. විශේෂ ළමුන් හට විශේෂ අධ්‍යාපන ඒකක ගොඩනගා ඇති අතර ඒ සඳහා විශේෂ අවධානයක් හා පුහුණුවක් ඇති ගුරුවරුන් යොදාගනිමින් ඉගැන්වීම සිදු කරයි. මෙය ඒකකීකරණ අධ්‍යාපන ක්‍රමය ලෙස හඳුන්වයි. ඒකකීකරණ අධ්‍යාපන ක්‍රමය යටතේ විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ චර්යාව හැඩගැස්වීමෙහිලා අවශේෂ සිසුන්ගේ චර්යාත්මක බලපෑම කෙබඳුද යන්න මෙම පරීක්ෂණයේ ගැටළුව වේ. පර්යේෂණ ප්‍රශ්න ලෙස විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ චර්යාවන් සාමාන්‍ය සිසුන්ට කරන බලපෑම කෙබඳුද යන්නත් සමාන්තර පන්ති කාමර පරිසරය ඒකකීකරණ පන්ති කාමර පරිසරයට සිදු කරන බලපෑම කෙබඳුද යන්නත්ය. අධ්‍යයන අරමුණු වශයෙන් අවශේෂ සිසුන් විශේෂ සිසුන් කෙරෙහි ලබා දෙන සහය ප්‍රමාණවත්දැයි සොයා බැලීමත් විශේෂ සිසුන් සාමාන්‍ය සිසුන් හා සැසඳීමේදී ගුරුවරුන් විසින් ලබාදෙන සහාය ප්‍රමාණවත් ද යන්න සොයා බැලීමක් සිදු කර තිබේ. මෙම අධ්‍යයනය සඳහා සමීක්ෂණ විධික්‍රමය යටතේ එන ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්ණාවලි හා නිරීක්ෂණය භාවිත කර සොයාගත් තොරතුරු පොදු සාමාන්‍යකරණයට ලක් කර ඇත. සසම්භාවී නියැදි ක්‍රමය යටතේ එන ස්ථරගත නියැදි ක්‍රමය උපයෝගී කරගනිමින් පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය ඒකකීකරණ පන්ති කාමරයකට යොමු කළ විශේෂ දරුවන් හා අවශ්‍ය දරුවන්ද එම පන්ති භාර ආචාර්යවරයාද යොදා ගනිමින් පන්තියකින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තුනකුත්, අවශේෂ දරුවන් තුනකුත් එලෙස ළමුන් හය දෙනෙකු වන පරිදි 6 ශේණියේ සිට 11 ශේණිය දක්වා දරුවන් තිස් හයක් ද, පන්ති භාර ආචාර්යවරයා ද ලෙස සාමාජිකයින් 42 පර්යේෂණයට භාජනය කර ඇත. ලබාගත් SPSS මෘදුකාංගය මගින් විශ්ලේෂණය කර බැලීමේදී නියැදියෙන් දරුවන්ගෙන් ADHD 5% ක් ද, ෘදඅබ Syndrome 27.5% ද, ඔටිසම් 25% ක් ද, සෙමෙන් ඉගෙනගන්නා දරුවන් 20%ක් ද, ශාරීරික ඌනතා ඇති දරුවන් 20% ක් ද, කථන හා ශ්‍රවන ආබාධ සහිත ප්‍රතිශතය 5% ක් වේ. එයිනුත් 95% ක ප්‍රමාණයක් ඔටිසම් හා සෙමෙන් ඉගෙන ගන්නා දරුවන් වේ. විවේක කාලය තුළ ක්‍රීඩා කරන විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ ප්‍රමාණය 70% ක් වන අතර, ක්‍රීඩා නොකළත් ක්‍රියාකාරී ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකම් වල යෙදෙන ප්‍රමාණය 85% වේ. මේ ක්‍රියාකාරකම් සඳහා අවශේෂ දරුවන්ගේ ක්‍රියාකාරී දායකත්වය 90% ක් වන අතර එයිනුත් 78% ක ප්‍රතිශතයක් විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ සමීපතම යහලුවකු සේ සළකා උපකාර කිරීමට පෙළඹී තිබේ. මෙම නියැදිය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ලබන දරුවන්ගේ ක්‍රියාකාරී හැසිරීම සඳහා අවශේෂ සිසුන්ගේ බලපෑම ප්‍රතිශතයක් ලෙස 76% කි. ගැටළුවට පිළියම් ලෙස රාජ්‍ය අංශය හා පාසල් අධ්‍යාපනය ඒකක ඔස්සේ විවිධ ක්‍රියා මාර්ග ගත හැකි බවත් දෙමාපියන් පාසල් ගුරුවරුන් අධ්‍යාපනවේදීන් සමාජ විද්වතුන් මෙහිදී නිසි අයුරින් නිශ්චිත ප්‍රතිපත්ති රාමුවක් හා ඊට අනුකූල විධිමත් ක්‍රමවේද ක්‍රියාවට නැවිය යුතුය.

***මුඛය පද:*** *විශේෂ අධ්‍යාපන සිසුන්, අවශේෂ සිසුන්, චර්යා, ඒකකීකරණ අධ්‍යාපනය*

[1] සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, rathnayakermadb@gmail.com

# සාම්ප්‍රදායික කර්මාන්තකරණයේදී නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටළු (සිංහාරමුල්ල වළං කර්මාන්තය ඇසුරින්)

එම්.පී. ටී. රංගන[1], ඩබ්. පී. ඩී. චරිත් ගුණවර්ධන

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්ත අතර තවමත් ලංකාවේ සිදුවෙමින් පවතින කර්මාන්තයක් ලෙස වළං කර්මාන්තය පෙන්වා දිය හැකිය. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට පැවත එන සාම්ප්‍රදායික කර්මාන්තයක් ලෙස වළං කර්මාන්තය හඳුනාගත හැකිය. මහාවංශය තුළ පවා සඳහන් වන අන්දමට අතීතයේදී කුඹල් කර්මාන්තයේ නියැලී සිටි පිරිස් ජීවත් වූ වීදි පවා හඳුනාගෙන තිබුණි. නමුත් වර්තමානය වන විටත් මෙම කර්මාන්තය සාම්ප්‍රදායික කර්මාන්තයක් ලෙසට පවතින නමුත් මෙහි කැපී පෙනෙන වර්ධනයක් සිදු වෙමින් නො පවතී. මේ සඳහා නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටළු මේ සඳහා බලපා ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ කුඹල් කර්මාන්තකරණයේදී නිෂ්පාදකයින් මුහුණ දෙන ප්‍රධාන ගැටළු අධ්‍යයනය කිරීමය. මේ සඳහා තවමත් මෙම කර්මාන්තය සිදු කරන ප්‍රදේශ අතර කැලණිය ප්‍රාදේශීය සභාවේ සිංහාරමුල්ල ග්‍රාමය තෝරාගන්නා ලදී. එහි පවුල් 10 ක් පමණ මෙම කර්මාන්තයේ නියැලී සිටිති. මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා පවුල් 10යේම දත්ත ලබා ගැනුණි. තොරතුරු ඒකරාශී කිරීමේදී ප්‍රාථමික හා ද්විතීයික දත්ත පදනම් කර ගන්නා ලදී. ප්‍රාථමික දත්ත වශයෙන් නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා ක්‍රම පදනම් කර ගෙන දත්ත රැස් කර ගන්නා ලදී. නිරීක්ෂණ ක්‍රමය යටතේ වළං නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ නිරීක්ෂණය කළ අතර පවුල් 10යේම නිෂ්පාදකයන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කරමින් තොරතුරු ලබා ගන්නා ලදී. ද්විතීයික දත්ත ලෙස මහාවංශය, සාහිත්‍ය ග්‍රන්ථ, අන්තර්ජාලය වැනි මූලාශ්‍රවලින් තොරතුරු ගබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය කිරීමේදී නියැදි විශ්ලේෂණය සඳහා කේන්ද්‍රික ප්‍රවණතා මිනුම්, ප්‍රස්ථාරික ක්‍රම මෙන්ම GIS තාක්ෂණය ආදිය යොදා ගන්නා ලදී. අධ්‍යයනයේදී හඳුනාගත් නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටළු ලෙස අමුද්‍රව්‍ය සීඝ්‍රයෙන් ක්ෂය වී යාම හා මිල ඉහළ යාම, නිෂ්පාදකයින්ට නව දැනුම ලබාගැනීම අවම මට්ටමක පැවතීම, දේශගුණ තත්වයන්, රාජ්‍ය මැදිහත්වීම ඉතා අවම මට්ටමක පැවතීම, පසු පරම්පරාව මෙම කර්මාන්තයෙන් දුරස් වීම ඔවුන්ගේ ප්‍රධාන ගැටළු වේ. මෙම නිෂ්පාදන කර්මාන්තය ඉදිරියට පත්වාගෙන යාමට රාජ්‍ය අනුග්‍රහය ලබාදීම, ණය පහසුකම් ලබා දෙමින් නිෂ්පාදකයා දිරි ගැන්වීම, නිෂ්පාදකයින්ව පුහුණු කිරීම හා නව දැනුම ලබාදීම, ප්‍රදර්ශන ආදිය පවත්වමින් මෙම කර්මාන්තයේ වටිනාකම සමාජගත කිරීම, විකල්ප අමුද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම ගැටළුවලට යෝජනා ලෙස නිගමනය කරන ලදී.

***මුඛ්‍ය පද :*** *සාම්ප්‍රදායික, වර්ධනය, ක්ෂය වී යාම*

[1] භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, thushanrangana33@gmail.com

# ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි පවතින කාලීන ප්‍රවණතා

අයි. අයි. ඒ. සිල්වා[1]

**සංක්ෂේපය**

වර්තමානය වන විට මත්ද්‍රව්‍ය භාවිතය සමාජය තුල වසංගතමය තත්වයක් බවට පත්ව ඇත. නිශේදනාත්මක ප්‍රතිඵල බොහෝමයක් ඇති කරන මත්ද්‍රව්‍ය භාවිතය තුලින් උද්ගත වන ආර්ථිකමය හා සමාජීය ගැටළු රාශියකි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් අතර HIV/AIDS, හෙපටයිටිස් සී (HCV), හෙපටයිටිස් බී (HBV), වැනි රෝග තත්වයන් ව්‍යාප්ත වීමද බහුල වශයෙන් සිදු වේ. මොවුන් කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන්ද පිරිහීමට ලක් වේ. අනන්‍යතාවය ගිලිහී යමින් යුතුකම් හා වගකීම් පැහැර හැරීමත් සමග පුද්ගල සබඳතා බිඳ වැටෙනු ඇත. තවද පුද්ගල අභිමතාර්ථයන් සඵල කිරීමෙහිලා යෙදවිය හැකි මුදල් මත්ද්‍රව්‍ය සඳහා වැය කිරීම නිසා ආර්ථික වශයෙන් පරිහානියට ලක් වන අතර ඒ තුලින් සෘජු හා වක්‍ර ගැටලු රාශියක් මතු වේ. මෙම අධ්‍යනයේදී මත්ද්‍රව්‍ය භාවිතයෙහි පවතින ප්‍රවණතාවයන් හඳුනා ගැනීම අරමුණු කර ගන්නා අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය හා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය මගින් ඉදිරිපත් කර ඇති වාර්තා ඔස්සේ ලබා ගත් ද්විතීයක දත්ත භාවිතයෙන් දත්ත විශ්ලේෂණය සිදුකර ඇත. ඒ අනුව 2018 වර්ෂයේදී මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් සංඛ්‍යාව 2015 වර්ෂයට සාපේක්ෂව 20% කින් වැඩි වී ඇත. 2018 වර්ෂයේදී මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධයෙන් වැඩිම වශයෙන් අත්අඩංගුවට ගැනීම් වාර්තා වන්නේ 61% ක් ලෙස බස්නාහිර පළාතෙනි. 2015 - 2018 සමස්ත කාල පරාසය තුල ගංජා සම්බන්ධයෙන් අත්තඩංගුවට ගැනීම් ඉහල අගයක් ගන්නා අතර 2018 වන විට හෙරොයින් සම්බන්ධ අත්තඩංගුවට ගැනීම් වල සීග්‍ර වර්ධනයක් පවතී. මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් ප්‍රතිකාර සඳහා යොමු වීමේ යම් ප්‍රවණතාවයක් ඇති අතර මත්ද්‍රව්‍ය භාවිතා කිරීමෙහිලා ස්ත්‍රීන්ට වඩා පුරුෂයින්ගේ නැඹුරුතාවය ඉහලය. සමස්ත අධ්‍යනයය තුලින් අනාවරණය වන්නේ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හා එහි ව්‍යාප්තිය තුළ ඉහල වර්ධනයක් සිදුවන බවයි. මත්ද්‍රව්‍ය භාවිතය තවදුරටත් වර්ධනය වීම තුළ තරුණ ප්‍රජාව පමණක් නොව කාන්තාවන් මෙන්ම ළමා පරපුරද මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ ඉඩකඩ පුළුල් වේ යැයි නිගමනය කළ හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව නීතිය නිසියාකාරව ක්‍රියාත්මක කිරීමෙනුත්, මත්ද්‍රව්‍ය භාවිතයෙහි ආදීනව පිළිබඳ ජනතාව දැනුවත් කිරීමෙනුත් සමාජය තුල මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා කටයුතු කළ හැකිය.

***මුඛ්‍ය පද:*** *මත්ද්‍රව්‍ය, භාවිතය, ප්‍රවණතාවය*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, irushilaerangi@gmail.com

# දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම සහ අනෙකුත් සාධක දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් කෙරෙහි බලපෑම

ඩී. ඩී. වයි. එන්. ගුණරත්න[1]

## සංක්ෂේපය

රටක ආර්ථික සංවර්ධන කාර්යයේදී අවශ්‍ය වන මානව ප්‍රාග්ධනය සපයා දීමේ ප්‍රධාන සැපයුම්කරු වන්නේ අධ්‍යාපනයයි. 2015 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා අනුව ශ්‍රී ලංකාව දකුණු ආසියාතික රටවල් අතර වැඩිම සාක්ෂරතාවයක් හිමි රටවල් අතරින් එකකි.(92.6%) මෙවැනි ඉහළ සාක්ෂරතාවයක් (වයස අවුරුදු 15ට වැඩි පුද්ගලයෙක් සතු ලිවීමේ සහ කියවීමේ හැකියාව) සතු වීමෙන් දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි දෙමව්පියන්ගෙන් ලැබෙන්නේ කෙබඳු ආකාරයක මඟ පෙන්වීමක්ද යන්න පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. මෙම අධ්‍යනය මඟින් අපේක්ෂා කරනු ලබන්නේ දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම හා අනෙකුත් සමාජ සාධක දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම කෙරෙහි බලපානු ලබන ආකාරය විමසා බැලීමයි. මෙම අධ්‍යයනය සඳහා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ 2012 වැඩිම සාක්ෂරතාවයක් පවතින දිස්ත්‍රික්කය වන (98.8%) ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් පුද්ගලයින් 50කින් යුතු නියැදියක් යොදා ගන්නා ලදී. මේ සඳහා සම්භාවිතා නොවන හිමබෝල නියැදුම් ක්‍රමය යොදා ගන්නා ලදී. දත්ත ලබා ගැනීමේදී ප්‍රාථමික දත්ත ප්‍රශ්නාවලි මඟින් ද , ද්විතීයික දත්ත මහ බැංකු වාර්තා මඟින් සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වාර්තා මඟින් ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණ ශිල්ප ක්‍රම වශයෙන් විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ශිල්ප ක්‍රම මෙන් ම කල්පිත පරීක්ෂාවන් ද යොදා ගන්නා ලදී. ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීමේදී සිදු කරන ලද කයිවර්ග පරීක්ෂාවට අනුව දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් කෙරෙහි බලපෑමක් නොකරන බව දැක ගත හැකි වේ. එසේම දෙමව්පියන්ගේ අදායම් මට්ටම යන සාධකය විශ්ලේෂණය කිරීමේදී එය දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් කෙරෙහි බලපෑමක් සිදු කරන බව දැක ගත හැකි වේ. මීට අමතරව පියාගේ රැකියාව. මව හෝ පියා විදේශ ගත වීම, පියාගේ බීමත් බව ආදී සාධක දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් කෙරෙහි යම් බලපෑමක් සිදු කර ඇති බව දැක්විය හැකිය. ඒ අනුව අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් කෙරෙහි වැඩි බලපෑමක් නොකළ ද පවුලේ අදායම් තත්වය ඍජු බලපෑමක් සිදු කරන බවයි.දෙමව්පියන්ගේ අදායම් තත්වය අඩු වීම තුළ ඇතැම් දරුවන්ගේ ද අධ්‍යාපන සාධන මට්ටම් අඩු වී ඇත. දෙමව්පියන් විදේශ ගත වීම තුළ දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම් කෙරෙහි වැඩි බලපෑමක් සිදු වන බවත් විධිමත් අධ්‍යාපනයක් ලැබූ දෙමව්පියන්ගේ දරුවන් මෙන්ම විධිමත් අධ්‍යාපනයක් නොලබූ දෙමව්පියන්ගේ දරුවන්ද අධ්‍යාපන සාධන මට්ටමින් ඉහළ ස්ථානයක සිටින බවත් දැක ගත හැකිය.

***මුඛ්‍ය පදඃ*** *මානව ප්‍රාග්ධනය, ආර්ථික සංවර්ධනය, දෙමව්පියන්, සාක්ෂරතාවය, සාධන මට්ටම්*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yashodanayomi12@gmail.com

# උපාධිධාරීන් රාජ්‍ය හා පෞද්ගලික රැකියාවලට යොමුවීම හා රැකියාවේ තත්ත්වය (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරිනි )

එම්. කේ. අයි. අවිශ්ක[1]

## සංක්ෂේපය

විශ්වවිද්‍යාලවලින් උපාධිය සමත්ව 2012 වර්ෂයේ සිට මේ දක්වා රැකියා විරහිතව උපාධිධාරීන් 57000 ක් පමණ වෙතැයි සදහන් වේග එසේම රැකියාවලට යොමුවූ උපාධිධාරීන් බහුතරයක් වුවද ඔවුන්ගේ රැකියාව තමා සිදුකල පාඨමාලාව හා උපාධි සාමාර්ථය මත සිදුවූවක්ද යන්න සොයා බැලීම මෙහිදී බලාපොරොත්තු වේග රැකියා ප්‍රශ්නය උග්‍ර වීම මත අඩු ඇබෑර්තු මත ගාස්තු අය කරන රැකියා ඇබෑර්තුවලට ඉල්ලුම් කරන උපාධිධාරීන්ට තම සුදුසුකමට පත්වීම් ලැබෙන්නේ නැතග මෙම පර්යේෂණයේ අරමුණු ලෙස උපාධිධාරීන්ට රැකියාවක් ලබා ගැනීමේ ඇති හැකියාවල එම රැකියාව උපාධියේ විෂය පාඨමාලාව හා ගැලපීමේ හැකියාව අධ්‍යයනය කිරීමයිග ගම්පහ දිස්ත්‍රික්කය තුල රාජ්‍ය ආයතන 02 ක් හා පෞද්ගලික ආයතන 02 ක උපාධිධාරීන් 80 ක නියැදියක් යොදාගෙන ප්‍රශ්නාවලි ක්‍රමය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය තුලින් දත්ත රැස් කර ඇත. රාජ්‍ය ආයතන තුළ සේවය කරන උපාධිධාරීන් 40න් බහුතරය කලා උපාධිධාරීන් වන අතර තමන්ගේ උපාධියේ විෂය පාඨමාලාවට අදාල කිසිදු රාජකාරියක් සැකසී නොමැති බව අනාවරණය වූ අතර පෞද්ගලික අංශයයේ සේවය කරන බහුතරය කළමනාකරණ උපාධිය සමත් වූ අය බවත් බහුතරය තමන් හැදෑරූ පාඨමාලාවට අදාල රාජකාරි සිදු කරන අය සිටින බවත් තරමක් දුරට හෝ ඒ හා සම්බන්ධිත අය සිටින බව දැකගත හැකි වියග රාජ්‍ය අංශය තුල උපාධියට අදාල නිශ්චිත වැටුප් රාමුවක් දක්නට නොමැති බවත් රැකියාවක් නොමැතිකම මත දැනට රාජකාරීවල නියැලී සිටින බවත් උපාධියට සුදුසු රැකියාවක් ලැබුණහොත් එම රැකියාව අතහැර යන අයවලුන් බහුතරයක් වූ බව දැකගත හැකිය. රාජ්‍ය අංශයේ සේවය කරන උපාධිධාරීන්ගේ ආදායම් පිළිබඳ අධ්‍යයනයේදී 72,5% ක් රුග 30000-40000 අතර ආදායමක් ලබන බව අනාවරණය විය. පෞද්ගලික අංශයේ සේවය කරන උපාධිධාරීන්ගේ ආදායම් පිළිබඳ අධ්‍යයනයේදී 57.5% ක් රුග 40000-50000 අතර ආදායමක් ලබන බව දැක ගත හැකි විය. මෙම පර්යේෂණය තුළින් පෙනී ගියේ රැකියා වෙළෙඳපොලට ඔබින සේ නිසිපරිදි විෂය පාඨමාලා සැකසී නොතිබීමත්ල උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ නිශ්චිත ක්‍රමවේදයක් රජය මගින් සකසා නොතිබීමත්ල උපාධිධාරීන්ගේ සේවය රටේ සංවර්ධනයට දායක කර ගැනීමේ ඇති ඉඩ ප්‍රස්ථාව මද බවත්ල රැකියාවක් නොමැතිකම මත උසස් පෙළට සාපේක්ෂ වන කළමනාකරණ සහකාරල සමෘද්ධි සංවර්ධන නිළධාරීල ග්‍රාම නිළධාරී තනතුරු සදහා අයදුම් කිරීම ආදිය ඇති බව තහවුරු විය. මේ අනුව උපාධිධාරීන් හට රජය හෝ පෞද්ගලික අංශයේ තමන්ගේ සුදුසුකම්වලට සරිලන රැකියාවක් ලබා දීමේ හැකි ක්‍රමවත් සැලැස්මක් රජය මගින් අනිවාර්යයෙන් සැකසිය යුතුය.

***මුඛ්‍ය පදඃ** විශ්වවිද්‍යාල, උපාධිධාරීන්, රැකියා*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, bandaraisuru418@gmail.com

# උපාධි පාඨමාලාවට අමතරව විෂය බාහිර පාඨමාලා සඳහා විද්‍යාර්ථයින්ගේ සහභාගීත්වය (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරෙන්)

ආර්. ආර්. ඒ. එල්. ඩබ්ලිව්. රණතුංග[1]

**සංක්ෂේපය**

තරඟකාරී අධ්‍යාපන රටාව මත විශ්වවිද්‍යාලයට පැමිණෙන විද්‍යාර්ථයා උසස් සාමාර්ථයක් ලබා ගැනීමේ අරමුණින් තම GPA අගය මතම රැඳී සිටීම දක්නට ලැබේ. කැලණිය විශ්වවිද්‍යාලය තුළ සංස්කෘතික මධ්‍යස්ථානයේ පාඨමාලා, සහතිකපත්‍ර පාඨමාලා හැදෑරීමට නොමිලේ අවස්ථාවන් හිමිකර දී ඇත. විශ්වවිද්‍යාල විද්‍යාර්ථයා හට නොමිලේ හැදෑරීමට අවස්ථාව හිමිවුවද එම අවස්ථා ලබා ගන්නේ සුළු පිරිසක් බව එම අංශවල ප්‍රධානීන්ගේ අදහසයි. නමුත් මුදල් ගෙවා ඒවායේ ගුණාත්මකභාවය දන්නා බාහිර පිරිස ඒවා හැදෑරීමට පෙළඹී ඇත. මෙම පර්යේෂණයේ අරමුණු ලෙස සංස්කෘත මධ්‍යස්ථානයේ පාඨමාලා, නූතන භාෂා සහතිකපත්‍ර පාඨමාලා හා පරිගණක පාඨමාලාවලට සහභාගී වීමේ ප්‍රවණතාවය කෙබඳුද හා එහි ප්‍රතිලාභ ලබා ගන්නන්ගේ අදහස් අධ්‍යයනය කිරීමයි. ඒ සඳහා කැලණිය විශ්වවිද්‍යාලය තුල සිව්වන වසරේ සියලුම අධ්‍යයන පීඨ නියෝජනය වන පරිදි 100 ක නියැදියක් ස්තෘත සසම්භාවී නියැදි ක්‍රමය මගින් ප්‍රශ්නාවලියක් ලබා දීමෙන් දත්ත ලබා ගෙන විශ්ලේෂණය කරන ලදී. නියැදිය 100 නියෝජනය වුවද මෙම සියලුම පාඨමාලා කාර්යයන්හි නිරත වන පිරිස 02% ක් පමණ විය. මෙම පාඨමාලා එකකවත් නිරත නොවන 29% ක් දැකගත හැකි වූ අතර එක් පාඨමාලාවක්වත් අඩුම වශයෙන් හදාරන පිරිස 71% ක් විය. එයින් සංස්කෘතික මධ්‍යස්ථානයේ පාඨමාලාවලට හදාරණ පිරිස 08%ක් බව දැකගත හැකිවිය. නූතන භාෂා සහතිකපත්‍ර පාඨමාලාව හදාරණ විද්‍යාර්ථයින්ගෙන් 90% ක් කලා පීඨයේ විද්‍යාර්ථයින් වූ බව දැකගත හැකි විය. පාඨමාලා හැදෑරීමේදී පරිගණක පාඨමාලාවට සහභාගී වීම 56%ක් පමණ බව හෙළිවිය. සමස්ථයක් ලෙස මෙම පාඨමාලා සඳහා විද්‍යාර්ථයින් සහභාගී වීමේ ප්‍රවණතාව අඩුවීමට සංස්කෘතික මධ්‍යස්ථානයේ පාඨමාලා පිළිබඳ දැනුවත්භාවයක් නොතිබීම ප්‍රබලව දැක්විය හැකි අතර අනෙක් හැදෑරීම්වලදී වේලාව ප්‍රමාණවත් නොවීම, අනිවාර්යය දේශන සඳහා කාලය වෙන්කළ යුතු වීම, භෞතික පහසුකම් නොමැතිවීම, ලෙඩරෝගවලට ගොදුරුව සිටීම, අවධානයක් නොදැක්වීම, අවශ්‍යතාවක් නොතිබීම ආදී තත්වයන් දැකගත හැකි විය. මේ අනුව පෙනී ගියේ සමස්ථ ශිෂ්‍ය ප්‍රජාවගෙන් 30% ක් පමණ මේ පිළිබඳ දැඩි අවධානයක් යොමු කරන බවයි.

***මුඛ්‍ය පද:*** *පාඨමාලා, ක්‍රීඩා, සහතිකපත්‍ර, විද්‍යාර්ථයින්, සහභාගීත්වය*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, waruniranathunga9@gmail.com

# අන්තර්ජාලය ශ්‍රී ලංකාවේ පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි ඇති කරන බලපෑම (ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින්)

ඩී .ඩී .ඩබ්ලව්. එන්. ගුණරත්න[1]

## සංක්ෂේපය

නව මාධ්‍යයේ සම්ප්‍රාප්තියත් සමඟ අන්තර්ජාලය වෙනස් වෙමින් පැමිණ තිබේ. සමාජ සංවර්ධනය මෙන්ම සමාජය හිතකර හෝ අහිතකර ලෙස වෙනස් කිරීමේ ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කාර්යභාරයට අද අන්තර්ජාලය මුල පුරා අවසන්ය.එය වැදගත් අමුද්‍රව්‍ය සහිත මාධ්‍යයක් සේම සංස්කෘතියට අහිතකර බලපෑම් ඇති කරන්නාවූත් මාධ්‍යයක් ද වී ඇත.එකී අහිතකර බලපෑම් අතර පාසල් ළමුන් වෙත කෙරෙන බලපෑම බලවත්ය. ඒ අතරින්ද පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි අන්තර්ජාලයේ බලපෑම කතාබහට ලක් වී ඇත. ශ්‍රී ලංකාවේ පාසල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි අන්තර්ජාලයෙන් සිදුවන බලපෑම ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් වී තිබේද යන්න පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ ගැටළුව වේ. සමස්ත ලෝකයේම වර්ධනීය තලයකට පත්ව ඇති මෙම අති නවීන සංනිවේදන පද්ධතිය ශ්‍රී ලාංකේය පාසල් ප්‍රජාව භාවිතා කරන ආකාරය සොයා බැලීමත්, ඉන් ඔවුන්ගේ ආකල්ප පද්ධතියේ මෙන්ම හැසිරීම් පද්ධතියේ ඇති කරනු ලැබූ වෙනස සොයා බැලීමත් මෙම පර්යේෂණයේ උප අරමුණු වේ. මෙම පර්යේෂණය සඳහා නියැදිය වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වන ලෙස ගම්පහ නගරසභා බල ප්‍රදේශයට අයත් වන එක් පාසලකුත්, ගම්පහ ග්‍රාමීය ප්‍රදේශයන්ට අයත්වන ලෙස එක පාසලකුත් ග්‍රාමීය සහ නාගරික යන අංශයන් දෙක නියෝජනය වන පරිදි පාසැල් දෙකක් තෝරාගන්නා ලදී. එම පාසැල් දෙකෙන් ස්තෘත සසම්භාවී නියැදි ක්‍රමය යටතේ අ.පො.ස. උසස්පෙළ අංශ 4කින් සිසුන් තෝරාගන්නා ලදී. පාසැල් දෙකෙන් ගුරුවරුන් ද ඉහත නියැදි ක්‍රමය යටතේම නියැදියට තෝරාගන්න ලදී. ඒ අනුව ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාගච්ජා මඟින් ප්‍රාථමික දත්ත සහ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තා සහ මහා බැංකු වාර්ෂික වාර්තා මඟින් ද්විතියික දත්ත ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය සඳහා කෛවර්ග ව්‍යාප්තිය සහ මූලික සංඛ්‍යාන විධික්‍රම යොදාගන්නා ලදී. ඒ අනුව "පාසැල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි අන්තර්ජාලයේ බලපෑම ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් වේ" යන කල්පිතය කෛවර්ග ව්‍යාප්තිය මඟින් පරීක්ෂා කරයි. අන්තර්ජාලයෙන් හඳුනාගත් පුද්ගලයින් පෞද්ගලිකව මුණගැසීම දක්වා අන්තර්ජාල සබඳතා ගොඩනගා ගැනීමෙන් මෙන්ම ඒ හා සම්බන්ධ චර්යාවන් වෙනස්වීමෙහිලා අන්තර්ජාලය බලපෑම් කරන බවත් පාසැල් ළමුන්ගේ ලිංගික චර්යාවන් කෙරෙහි අන්තර්ජාලයේ බලපෑම ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් වන බවත් මෙම අධ්‍යනය තුළින් හඳුනා ගැනීමට හැකි විය. සියලු පාසැල් ආවරණය වන පරිදි පාසැල් ළමුන්ට ඉතා නිවැරදි ලිංගික අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම මාධ්‍ය භාවිත කිරීමේ නිපුණතාවය සිසුන් වෙත ලබාදීම සහ මාධ්‍ය අධ්‍යාපනය විෂයක් ලෙස පාසැල් තුළ ස්ථාපිත කිරීම කඩිනම් අවශ්‍යතාවයන් වේ.

***මූඛ්‍ය පදඃ*** *පාසැල් ළමුන්, ලිංගික චර්යාවන්, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය, ස්ත්‍රී පුරුෂ භාවය*

---

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, wathsalaniromi@gmail.com

# මහවැලි සී කලාපයේ වී ගොවීන්ගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් පිළිබඳ අධ්‍යයනයක්

ජී. ජී. අයි. ඩී. බස්නායක[1]

## සංක්ෂේපය

ශ්‍රී ලාංකීය රාජධානි ධූරාවලියේ ආදී ම යුගයන් වූ අනුරාධපුර හා පොළොන්නරු යුගයන් මෙරට කෘෂිකර්මාන්තයේ ස්වර්ණමය යුගයන් වූ බවට මෙරට ඉතිහාසය සාක්ෂි දරයි. නමුදු පසුව කෙමෙන් පරිහානිය කරා පියමන් කළ කෘෂිකර්මාන්තය වර්තමානය වන විට ලබා ඇති පුනරුදය සඳහා ගොවිජනපද ව්‍යාපාරය හා අඩසිය වසකට පෙර ආරම්භ වූ මහවැලි ව්‍යාපාරය හේතු වූ බවට සැක නැත. මහවැලි ව්‍යාපාරය මගින් 1980 දී ඇති කරන ලද මහවැලි සී කලාපය, මහවැලි සංවර්ධන ව්‍යාපාරයට අයත් භූමි ප්‍රමාණයෙන් 24% තරම් සැළකිය යුතු අගයක් ගන්නා අතර එහි වෙසෙන ගොවි ජනයාගේ සමාජ ආර්ථික තත්ත්වයන් කවරේද යන්න මෙම අධ්‍යයනය සඳහා පාදක වූ ගැටළුවයි. ඒ අනුව ඔවුන් මුහුණ දෙන සමාජ ආර්ථික තත්ත්වයන් අධ්‍යයනය කිරීම මෙහි මුඛ්‍ය අරමුණු වේ. මෙහිදී ප්‍රාථමික දත්ත පමණක් උපයුක්ත කරගත් අතර, මහවැලි සී කලාපය තුළ පවතින ගොවි සංවිධාන 196 අතුරින් ගොවි සංවිධාන 8 ක් සසම්භාවීව තෝරා ගෙන එකිනෙකින් ගොවීන් 6 දෙනා බැගින් පහසු නියැදීම මගින් තෝරා ගත් අතර එම නියැදියට ඇතුලත් ගොවීන්ට ලබාදෙන ප්‍රශ්නාවලියක් මගින් හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් පර්යේෂණයට අවශ්‍ය දත්ත රැස්කර ගැනුණි. දත්ත විශ්ලේෂණය සඳහා මූලික සංඛ්‍යානමය ශිල්ප ක්‍රමයන් යොදාගත් අතර දත්ත ඉදිරිපත් කිරීම සඳහා වගු ප්‍රස්තාර ආදිය යොදාගන්නා ලදී. අධ්‍යයනයෙන් හෙළි කරගත් කරුණු අනුව නියැදියෙන් 63% ක් පානීය ජලය පිළිබඳව අතෘප්තිමත් නොවේ. 21% ක් වකුගඩු රෝගයට ගොදුරු වී ඇති අතර මාර්ග පද්ධතිය පිළිබඳව 2/3 ක් පමණ සතුටු වුවත් ප්‍රවාහන පහසුකම් පිළිබඳව 79% ක් නොසතුටුය. කෘෂිකාර්මික කටයුතු සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවීම හා ලැබෙන අස්වැන්න අඩුවීම මෙන්ම නිසි මිලක් නොලැබීම ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවයි. වී ගොවිතැන සඳහා ලැබෙන ජලය ඇතැම් විට 75% හෝ 50% දක්වා අඩු වීම ගොවියාගේ ආර්ථික තත්ත්වය අඩපන කිරීමට හේතු වී ඇති අතර රජය විසින් ලබාදෙන පොහොර සහනාධාර ලබා දීමේ ක්‍රියාවලිය ඇතැම් විට කාර්යක්ෂම ලෙස සිදු නොවීම ද ගැටළුවකි. මේ අනුව උක්ත ප්‍රදේශයේ ගොවිජනයා බහුලව ඍණාත්මක නැතහොත් ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දෙන බව නිගමනය කළ හැකිය. මේ අනුව මහවැලි සී කලාපයේ වෙසෙන ගොවීන් මුහුණ පාන ගැටලු හඳුනාගෙන ඊට කඩිනමින් විසඳුම් ලබාදීම මගින් ගොවි ජීවිත නගා සිටුවීමට හැකි වනවා මෙන්ම වී නිෂ්පාදනය වර්ධනය කරගැනීම තුළින් මෙරටින් විදේශයන් කරා ඇදීයන මුදල් මෙරට තුළ යම් ප්‍රමාණක් හෝ ඉතිරි කර ගැනීමට හැකි වනු ඇත.

***මුඛ්‍ය පද :*** *මහවැලි සී කලාපය, වී ගොවියා, කෘෂිකාර්මික කටයුතු, සමාජ ආර්ථික තත්ත්වය, ගැටළු*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, isurudhananjay555@gmail.com

# ශ්‍රී ලංකාව ඇසුරෙන් ස්මාර්ට් ජංගම දුරකථන භාවිතය ඉහළ යාම.

ජී. ඩබ්ලිව්. ශානිකා[1]

## සංක්ෂේපය

අධ්‍යතන ගෝලීය සමාජය තුළ මාධ්‍ය භාවිතය ප්‍රධාන බලවේගයක් ලෙස ක්‍රියාත්මක වේ.ප්‍රථමික මට්ටමක පැවැති සන්නිවේදන ක්‍රමය සංකීර්ණ තත්ත්වයට පත් කිරීමට නව මාධ්‍යයට හැකියාව ලැබී ඇත. නව මාධ්‍ය ලෙස හඳුන්වනු ලබන්නේ අන්තර්ජාලය පදනම් කරගත් මාධ්‍යයන්ය. ඒ අතර ජංගම දුරකථනය ප්‍රධාන වී ඇත. මුල් කාලීන සමාජය තුළ අංකිත තාක්ෂණය පදනම් කරගත් දුරකතනය පැවති අතර පසුකාලීනව නව මාධ්‍ය හා සම්බන්ධ ස්මාර්ට් ජංගම දුරකථනය ප්‍රචලිත විය. ශ්‍රී ලංකාවේ අද ස්මාර්ට් ජංගම දුරකථනය භාවිතය සීඝ්‍රයෙන් වර්ධනය වීම ගැටළුවක් ලෙස අධ්‍යනය කරනු ලැබූ අතර මෙහිදී අධ්‍යයනයේ අරමුණ වූයේ මෙම සීඝ්‍ර වර්ධනයට බලපාන හේතු සොයා බැලීමයි. මෙම අධ්‍යනය ද්විතීයික දත්ත පදනම් කරගෙන සිදු කරන ලදී. මූලිකවම අංකිත තාක්ෂණය සහිත ජංගම දුරකථනය සමාජගත වූ අතර අන්තර්ජාල පහසුකම සහිත නව ස්මාර්ට් ජංගම දුරකථනය බිහිවන්නේ 2000 වසර තුළ දී ය. 2007 වර්ෂයේ දී ස්මාර්ට් ජංගම දුරකථනය හඳුන්වා දීමත් සමඟ ජංගම දුරකථන භාවිතය ජනගහනයෙන් 6% කි. ඉන් වසර හතකට පසුව එනම් 2014 වර්ෂයේදී ජංගම දුරකතන භාවිතය 75% කී. 2018 වර්ෂය වන විට ජනගහනයෙන් 84% ස්මාර්ට් ජංගම දුරකථන හිමිකරුවන්ය. ස්මාර්ට් ජංගම දුරකථනය වර්ධනය වීම සඳහා ද 2000 වසරෙන් පසුව සිදු වූ වෙනස්කම් කිහිපයක් බලපාන ලදී. GPRS පහසුකම් හඳුන්වා දීම, iphone හඳුන්වා දීම, App store හඳුන්වාදීම, 4G තාක්ෂණය හඳුන්වා දීම, Android market හඳුන්වාදීම, බලපාන ලදී. 2012 වර්ෂය වන විට App භාවිතා කරන ප්‍රමාණය 50% දක්වා වැඩිවිය. ශ්‍රී ලංකාවේ 2018 වර්ෂය වන විට ජංගම දුරකථන භාවිතා කරන ප්‍රමාණය සමස්ත ජනගහනයෙන් 84% කී. එම ජංගම දුරකතන භාවිතා කරන පිරිසෙන් 84% Android වර්ගයේ ස්මාර්ට් ජංගම දුරකථන ද 12% ක් iphone වර්ගයේ ජංගම දුරකථන ද 3% windows වර්ගයේ ජංගම දුරකථන ද 1% අංකිත වර්ගයේ ජංගම දුරකථන භාවිතා කරනු ලබයි. ස්මාර්ට් ජංගම දුරකථන භාවිතය සීඝ්‍රයෙන් වර්ධනය වීමට හේතු ලෙස නිගමනය වූයේ පරිගණකයකට සාපේක්ෂව ස්මාර්ට් ජංගම දුරකථනයක් මිලදී ගැනීමට අඩු මුදලක් වැයවීම , ලාභදායී වීම,තාක්ෂණික දියුණුව, selfie කැමරාව, ආකර්ෂණීය නිමාව, වැනි සාධක බලපාන ලද බවයි.

***මුඛ්‍ය පද:*** *ස්මාර්ට් ජංගම දුරකථන, භාවිතය, ප්‍රවණතාවය*

[1] ජන සන්නිවේදන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ganewaththas@gmail.com

# උසස් පෙළ සිසුන්ගේ පරිගණක හා අන්තර්ජාල දැනුම පිළිබඳ අධ්‍යයනය කිරීම (ගාල්ල දිස්ත්‍රික්කය ඇසුරින්)

කේ. කේ. එස්. යූ. අයි උබේසේකර[1]

**සංක්ෂේපය**

දිනෙන් දින දියුණුවන තරඟකාරී ලෝකය තුළ පරිගණකය සහ අන්තර්ජාලය සමඟ වැඩිහිටියන් මෙන්ම ළමයින්ද වර්තමානයේ දැඩි සේ බැඳී ඇත. මන්ද වඩාත් ඉක්මනින් සහ පහසුවෙන් තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාව පරිගණකය සහ අන්තර්ජාලය තුළින් උදාකර දී ඇති බැවිනි. වර්තමාන ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන්ට පරිගණක සහ අන්තර්ජාල භාවිතා කිරිමට ඇති ඉඩ ප්‍රස්ථා සීමා වී ඇත. ඒ අනුව ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාසල් වල අ:පො:ස උසස් පෙළ හදාරන සිසුන්ගේ පරිගණක සහ අන්තර්ජාල භාවිතය පිළිබඳ දැනුම සහ නාගරික පාසල් වල අ:පො:ස උසස් පෙළ හදාරන සිසුන්ගේ පරිගණක සහ අන්තර්ජාල භාවිතය පිළිබඳ දැනුම අතර  වෙනසක් පවතිද යන්න අධ්‍යනය කිරීම  මෙහි මූලික අරමුණ වේ. එහිදී ග්‍රාමිය පාසල්වල  සහ නාගරික පාසල්වල උසස් පෙළ සිසුන්ගේ පරිගණක සහ අන්තර්ජාල භාවිතය පිළිබඳ දැනුම අතර වෙනසක් පවතීද යන්නත්, ස්ත්‍රී පුරුෂ භාවය මත පරිගණක දැනුම අතර වෙනසක් පවතිද, යන්න පිළිබඳවත් අවධානය යොමු කරන ලදී. මෙහිදී ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව කලාපයට අයත් ග්‍රාමීය පාසල්වල උසස් පෙළ සිසුන් සහ ගාල්ල නගර සීමාව තුළ පිහිටි පාසල්වල උසස් පෙළ සිසුන්ගෙන් යුත් සංගහණයෙන් අහඹු නියැදීම යටතේ සිසුන් 100 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් තෝරා ගන්නා ලදි. දත්ත රැස්කිරීම ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යන ක්‍රම දෙකම යටතේ සිදු කිරීම සිදු විය. දත්ත විශ්ලේෂණය සඳහා SPSS, Excel මෘදුකාංග භාවිතා කරන ලදී. මෙම අධ්‍යනයේදී කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් යටතේ මධ්‍යන්‍ය ගණනය කළ විට සිසුවියන්ට සාපේක්ෂව සිසුන් වැඩි වශයෙන් පරිගණකය සහ අන්තර්ජාලය භාවිතා කරන බව හඳුනා ගන්නා ලදී. එමෙන්ම ග්‍රාමීය පාසල්වල උසස්පෙළ සිසුන්ගේ පරිගණකය සහ අන්තර්ජාලය පිළිබඳ දැනුමට වඩා වැඩි දැනුමක් නාගරික පාසල්වල උසස් පෙළ සිසුන් තුළ තිබෙන බවත් එනම් මෙම පාර්ශවයන් දෙක අතර දැනුමෙහි වෙනසක් පවතින බව කයි වර්ග පරීක්ෂාව යටතේ අනාවරණය කර ගැනිමට හැකි විය.

***මුඛ්‍ය පද :*** *පරිගණකය, අන්තර්ජාලය, ග්‍රාමිය, නාගරික*

[1]සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ishariubesekara@gmail.com

# ශ්‍රී ලංකාවේ රජයේ ඉඩම් සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය සහ ගැටුම් නිර්මාණය

ආර්. ඩබ්. බී. එම්. ඩී. එම්. බණ්ඩාරනායක[1], එච්. එච්. විතානගේ, ආර්. පී. ඩී. ඩී. රාජපක්ෂ,
ඒ. එම්. එස්. ජේ. පී. අබේකෝන්

**සංක්ෂේපය**

මිනිසාගේ පැවැත්මට අවශ්‍ය භෞතික සාධක අතර භූමියට හිමිවන්නේ සුවිශේෂී වැදගත්කමකි. ජනගහනය වර්ධනය වීමත් සමඟ ඉඩම් භාවිතය වැඩිවීම හේතුවෙන් සමාජය තුළ ඉඩම් සම්බන්ධ ගැටුම් දිනෙන් දින වර්ධනය වේ. විශේෂයෙන්ම රජය මගින් පුරවැසියන්ට ප්‍රදානය කල ඉඩම් සම්බන්ධයෙන් මෙම ගැටුම්කාරී තත්ත්වයන් ශ්‍රී ලංකාව තුළ දක්නට ඇත. පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වශයෙන් වර්තමානයේ රජයේ ඉඩම් කේන්ද්‍ර කරගත් ගැටුම් නිර්මාණය විමට ඉඩම් සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තිය බලපා තිබේද යන්න හඳුනාගැනීම වේ. මිශ්‍ර අධ්‍යයන ක්‍රමවේදය තුළ විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය සහ නිරීක්ෂණ ක්‍රමවේදය භාවිත කරයි. දත්ත රැස්කිරීමේ දී ද්විතීයික දත්ත මෙන්ම සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලී ක්‍රමය මගින් රැස් කළ ප්‍රාථමික දත්ත ද භාවිත කරයි. අධ්‍යයන ප්‍රදේශය වන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහවැලි මොරගහකන්ද කලාපයේ බකමූණ නේවාසික ව්‍යාපාර කොට්ඨාසයට අයත් ගශේයාය ඒකකයේ සෝමියල්ස් අංක 14 හෙවත් ගශේයාය 16, 17, 18 නමින් හඳුන්වන පැරණි ගොවිජනපදයයි. මෙම ජනපදයෙන් ඉඩම් සම්බන්ධ ගැටලුවලට මුහුණ දී ඇති පවුල් 52ක නියැදියක් තෝරා ගැනුනේ 1948 දී රජයේ ඉඩම් ලබා ගත් මෙහි ජනපදිකයින් අද වන විට පරම්පරා තුනක් පමණ එම ඉඩම්වල ජිවත්වීම තුළ ඉඩම් ගැටළුව සම්බන්ධ අවබෝධයක් පැවතීමය. පර්යේෂණයේ දී ලබා ගත් දත්ත සරල සංඛ්‍යානමය ක්‍රම ඔස්සේ විශ්ලේෂණය කරයි. ප්‍රතිචාරීන්ගේ ඉඩම් අයිතිය ලැබුණු ආකාරය අනුව 42.3%ක් අවසරපත්‍ර මඟින් ද, 32.6%ක් දීමනාපත්‍ර මඟින් ද, පසු උරුමය නම් කිරීම 1.9%ක් ද, කට වචනයෙන් ඉඩම් භූක්තිය විඳින 19.2%ක් වේ. ප්‍රතිචාරීන් මුහුණ දෙන ඉඩම් ගැටලු විග්‍රහ කිරීමේ දී සමස්තයෙන් ප්‍රතිචාරීන් 84.6%ක් ඉඩම් ගැටළු ඇති බවත්, 15.4% කට ඉඩම් ගැටළු නොමැති බවත් හඳුනාගත හැකි වේ. මෙම ඉඩම් ගැටළු නිරාකරණය කරගැනීම සඳහා රාජ්‍ය ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳව නිළධාරීන් සහ ඉඩම්ලාභීන් දැනුවත් කිරීමත් නීතිමය වශයෙන් පවතින දුර්වලතාවයන් අවම කරගැනීම සඳහා රාජ්‍ය ඉඩම් ප්‍රතිපත්තිය සම්බන්ධ නීති යාවත්කාලීන කිරීමත් කළ යුතුවේ.

***මුඛ්‍ය පදඃ*** *රජයේ ඉඩම්, රාජ්‍ය ප්‍රතිපත්ති, ජනපදිකයින්, ඉඩම් සංවර්ධන ආඥා පනත*

[1] සමාජයීය විද්‍යා පීඨ පර්යේෂණ මධ්‍යස්ථානය, කැලණිය විශ්වවිද්‍යාලය, rajagurumadusanka@gmail.com

# විශ්වවිද්‍යාල සිසුන්ගේ, දේශන සඳහා පැමිණීම අධ්‍යාපනය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ඩී. එම්. ටී. එම්. රූපසිංහ[1], බී. පී. ටී. අමරකෝන්

## සංක්ෂේපය

GPA අගය යනු සිසුවෙක් අධ්‍යාපනය ලබන කාලසීමාව තුළ හදාරණ පාඨමාලාවල ශ්‍රේණි වල සාමාන්‍ය අගය වේ. GPA අගය මනිනු ලබන්නේ විභාගයන් වල දී සිසුන් ලබා ගන්නා ලකුණු ප්‍රමාණය මතය. එනම් අධ්‍යාපනයේ විශේෂත්වය මනිනු ලබන්නේ GPA අගය මත වේ. ඒ අනුව ගැටළුව වන්නේ විශ්වවිද්‍යාල සිසුන් දේශන සඳහා පැමිණීම හා ඔවුන්ගේ GPA අගය අතර පවතින්නේ ධන සම්බන්ධයක්ද ඍණ සම්බන්දයක්ද යන්නයි. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාපීඨය, මානව ශාස්ත්‍ර පීඨය, කළමණාකරණ පීඨය, විද්‍යාපීඨය යන පීඨ හතර ගෙන එක් පීඨයකින් ගැහැණු සිසුන් 25ක්ද, පිරිමි සිසුන් 25ක්ද, එහි දී පළමු වසර, දෙවන වසර, තෙවන වසර, සිවුවන වසර යන වසර වලින් ගැහැණු සිසුන් 5 බැගින්ද, පිරිමි සිසුන් 5 බැගින්ද ලෙස ගෙන පීඨයකින් සිසුන් 50 බැගින් නියෝජනය වන ආකාරයට ස්තෘත සසම්භාවි නියදුම් ක්‍රමය යොදා ගනිමින් සිසුන් 200කින් යුත් නියදියක් ලබා ගත් අතර පසුව 2015, 2016, 2017, 2018 යන අධ්‍යන වර්ෂ හතරට අදාළව එම සිසුන්ගේ පැමිණීමේ ලේඛණ සහ එම වර්ෂයන් තුළ පැවැත්වූ විභාගයන්හි GPA අගයන් ආදී ද්විතීයික දත්ත යොදා ගනිමින් විශ්වවිද්‍යාල සිසුන්ගේ දේශන සඳහා පැමිණීම හා GPA අගය අතර ධන සම්බන්ධයක් පවතීද ඍණ සම්බන්දයක් පවතීද යන්න පිළිබඳව සහ සම්බන්ධතා සංගුණකය, සරල ප්‍රතිපායන විශ්ලේෂණය, ආදී විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම යොදා ගනිමින් අධ්‍යන අරමුණ සාක්සාත් කර ගන්නා ලදී. මුලින්ම දත්ත සන්සන්දනයේදී දැකිය හැකි වූයේ විද්‍යාපීඨ සිසුන්ගේ දිනපතා දේශන වලට පැමිණීම අනෙකුත් පීඨයන්ට සාපේක්ෂව සමස්ථයක් වශයෙන් වඩා වැඩි ප්‍රවනතාවක් දැකියහැකි වූ අතර ඒ අතරින් එම පීඨයේ ගැහැණු සිසුන්ගේ දේශන සඳහා පැමිණීම ඉතාමත් හොද මට්ටමක පැවති අතර එම සිසුන්ගේ විභාගයන්ගේ GPA අගයද අනිත් අයට සාපේක්ෂව ඉහල ගොස් තිබුණි. එබැවින් නිගමනය කළ හැක්කේ සිසුන්ගේ පැමිණීම GPA අගයට ප්‍රබල ලෙස බලපාන බවයි. එබැවින් සිසුන්ගේ දේශන සඳහා පැමිණීම තව දුරටත් වැඩි කළ යුතු අතර ඒ සඳහා විභාගයන්ට පෙනීසිටීමේ දී පැමිණීම 80% අනිවාර්යය කිරීම සිදු කළ යුතු බවත්, විභාගවල දී පැමිණීමද සළකා බලා ඒ සඳහාද නියමිත ලකුණු ප්‍රමාණයක් ලබා දෙන බව පෙන්වා දීමත්, පැමිණීම 80% අනිවාර්යය කර මහපොළ ශිෂ්‍යාධාර ලබා දෙන්නේ යැයි ප්‍රකාශයට පත් කිරීමත් තුළින් සිසුන්ගේ දේශන සඳහා පැමිණීම වර්ධනය කළ හැකි අතර එම සිසුන්ගේ විභාගයන්ගේ GPA අගයද එමඟින් ඉහළ නැංවීම කළ හැකිය.

***මුඛ්‍ය පදඃ*** *සිසුන්ගේ පැමිණීම, GPA අගය*

[1]සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, tharanganidm@gmail.com

# ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සමයේ යුද නීති හා මානව හිමිකම් උදෙසා සිදුවූ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පී. කේ. බී අයි. ප්‍රේමරත්න[1], යූ. ඒ. එම්. සඳමිණි

## සංක්ෂේපය

ශ්‍රී ලංකාව යනු දශක තුනක කාලයක් පුරා දැඩි යුද වාතාවරණයකට මුහුණපෑ රාජ්‍යයකි. 1983 වර්ෂයේ ෆැසිස්ට්වාදී මත දරමින් ආරම්භ වූ ඊලාම් ත්‍රස්තවාදී බෙදුම් වාදය ශ්‍රී ලංකාව තුළ විශාල සංහාරයක් කිරීමට සමත් විය. මෙම අවධිය තුළ ශ්‍රී ලංකාවේ සුවිශේෂි වූ ඓතිහාසික සිදුවීම් ගණනාවක් සිදුවූ බව පෙනේ. නමුත් 2009 මැයි මස 19 වන දින පැවති යුද්ධ වාතාවරණය මූලෝත්පාටනය කිරීමට එකළ  පැවති රජයට හැකි විය. කෙසේ වුවද පැවති යුද වාතාවරණය නිමාවීමත් සමඟ ජාත්‍යන්තර බලපෑම සක්‍රීය වශයෙන් යොමුවන්නට වූහ. එක්සත් ජාතීන්ගේ මහලේකම් විසින් ඉදිරිපත් කරනු ලැබූ  "දරුස්මාන් වාර්තාව" ත්‍රස්තවාදය අවසන් කිරිමේ අවසාන අවධියේදී යුද නීති හා මානව හිමිකම් ශ්‍රී ලංකා රජය සහ L.T.T.E ත්‍රස්තවාදීන් යන දෙපාර්ශවය විසින් උල්ලංඝනය කළ බව විග්‍රහ කරනු ලැබේ. පාර්ශවයන් දෙකටම අධි චෝදනා ඉදිරිපත් වුවද එහි දැඩි බලපෑමක් යොමු වුයේ ශ්‍රී ලංකාවටය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ ජාත්‍යන්තර ප්‍රජාවේ සමාජිකයෙකු වශයෙන් ශ්‍රී ලංකාවට මෙලෙස ජාත්‍යන්තර බලපෑමක් යොමු වීම සුවිශේෂ වූවකි. එමෙන්ම ජගත් යුද අපරාධ අධිකරණය විසින් ශ්‍රි ලංකාවට ජාත්‍යන්තර නීතියේ බලපෑම යොමුකිරීමද මෙහිදී වැදගත් වේ. මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණු වනුයේ, ශ්‍රී ලංකවේ පශ්චාත් යුද සමයේ යුද නීති හා මානව හිමිකම් උදෙසා සිදුවූ ජාත්‍යන්තර බලපෑම පිළිබඳව අධ්‍යනය කිරීම හා එහි සාධනීය හා නිශේධනීය තත්ත්වයන් හදුනාගැනීමයි. මෙහි පර්යේෂණ ගැටළුව වන්නේ පශ්චාත් යුද කාලය තුළ ජාත්‍යන්තර බලපෑම ශ්‍රී ලංකාවට  කෙසේ සිදුවූවා ද යන්නය. පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සංදර්භ විග්‍රහ විධික්‍රමය භාවිතයට ගන්නා ලදී. එහිදී පුස්තකාල පොත්, ලිපි හා අන්තර්ජාලය භාවිත කරන ලදී. මෙම පර්යේෂණයෙන් ලබාගත් පොදු නිගමනය වන්නේ, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර බලපෑම සීමා රහිත වූ බවත්, යුද අපරාධ මෙන්ම යුද නීති සම්බන්ධව ජාත්‍යන්තරයේ බලපෑම ඍජු චෝදනා යටතේ ඉදිරිපත් වු බවත්, මෙරට මානව හිමිකම් සහ යුද ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජාත්‍යන්තරය සාවද්‍ය වූ බලපෑමක් හා ප්‍රතිරූපයක් ගොඩනගා ඇති බවත්, රට තුළ පවතින අභ්‍යන්තර ගැටළු සඳහා ජාත්‍යන්තරය විසින් තීරණ ගැනීමට උත්සාහ දැරීමත්,  ශ්‍රී ලංකාවට මෙම ගැටළුව සමථ කිරීමට සුවිශේෂ වූ ක්‍රියා පිළිවෙතක් දැරීමට සිදුවන බවත් අධ්‍යනයන් මඟින් තහවුරු විය.

***මුඛ්‍ය පදඃ*** *ත්‍රස්තවාදය, පශ්චාත් යුද සමය, යුද නීති, මානව හිමිකම්, ජාත්‍යන්තර බලපෑම*

[1] ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, isurupremarathna100@gmail.com

# රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රදේශයේ ස්ත්‍රී දූෂණ හා මිනීමැරුම් වලට බලපාන හේතු පිළිබඳ අධ්‍යනයක්

කේ. එම්. එන්. පී කුලතුංග[1]

**සංක්ෂේපය**

අපරාධ නම් වන ප්‍රපංචය නෛතික හා සමාජ විද්‍යාත්මක පැතිකඩ ඔස්සේ හඳුනා ගනිමින් අපරාධ වර්ග පිළිබඳවත් අපරාධ විෂයෙහි දඬුවම ක්‍රියාත්මක වන ආකාරයත් පැහැදිලි කිරීම සිදු වෙයි. නීතියක් නැතිව අපරාධයක් නැත යන කතිකාව තුළින් අපරාධයත් නීතියත් අතර පවත්නා අත්‍යන්ත සම්බන්ධය විද්‍යාමාන වේ. එහෙත් මෙම නීතියත් අපරාධයත් යන ද්විත්වයම ක්‍රියාත්මක වන්නේ සමාජය කේන්ද්‍ර කර ගනිමිනි. අපරාධය සමාජයෙහි යහපැවත්ම හා සංවර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑම් කරන අතර සමාජමය වශයෙන් පුද්ගලයෙකුගේ පෞරුෂය, අනන්‍යතාවය ,තත්වය හා සමාජ ගරුත්වය තීරණය වීම කෙරෙහි ද බලපෑම් කරයි. ඒ අනුව මෙම අධ්‍යනයේ ගැටළුව වන්නේ රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රදේශයේ දිගින් දිගටම ස්ත්‍රී දූෂණ හා මිනී මැරුම් සාතන රැල්ලක් ඇති වූයේ ඇයි? ද යන්නයි. ඒ අනුව මෙහි අරමුණ වන්නේ මෙම අපරාධ ඇතිවීමට බලපාන හේතු මොනවාද යන්න සොයා බැලීමයි. ඒ සඳහා නියදිය ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යොදා ගත් අතර පසුගිය දශකයේ ස්ත්‍රී දූෂණ හා මිනී මැරුම් රැල්ලක් මෙම ප්‍රදේශයෙන් අනාවරණය වීම ඊට හේතු විය. ඒ අනුව ද්වීතියික දත්ත මූලික කරගනිමින් මෙම පරීක්ෂණය සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දී විස්තරාත්මක සංඛ්‍යානය යොදා ගන්නා ලදී. නූගත්බාවය, අධික ලිංගික ආශාව, ක්ෂණික කෝපය, පළිගැනීම, දුර්වල මානසිකත්වය වැනි හේතු මත මෙම අපරාධ සිදු කර ඇති බව සොයාගන්නා ලදී. ප්‍රමාණවත් ලිංගික අධ්‍යාපනයක්, වරදට නිසි දඬුවම් ලබා දීමේ පටිපාටියක් ලංකාව තුළ ක්‍රියාත්මක වන්නේ නම් මෙම අපරාධ වළක්වා ගත හැකි බව මෙම අධ්‍යනයෙන් පෙන්වා දිය හැකිය.

***මුඛ්‍ය පද:*** *අපරාධ, ස්ත්‍රී දූෂණ, මිනීමැරුම්*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, piyumikakulathunge@gmail.com

# වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමාන ප්‍රවණතා: රදාවඩුන්න ග්‍රාමසේවා වසම ඇසුරින්

ආර්. එම්. කේ. රත්නායක[1]

## සංක්ෂේපය

ලෝකයේ එක් එක් ප්‍රදේශයට ආවේනික වූ ප්‍රාදේශීය ආර්ථික කටයුතු දැකගත හැකි අතර ඒවා ගෝලීය, කලාපීය හා ප්‍රාදේශීය වශයෙන් විවිධ මට්ටමින් හඳුනා ගත හැකි වේ. කිසියම් ප්‍රදේශයක පවතින දේශගුණය, භූවිෂමතාව ආදී භූගෝලීය සාධක මෙන්ම වෙළෙඳපොල මානව අවශ්‍යතා ආදී මානුෂ සාධක වල ප්‍රතිපලයන් මත ප්‍රාදේශීය ආර්ථික කටයුතු බොහෝ විට ස්ථාන ගත වනු ලබයි. මෙම පර්යේෂණය මඟින් අධ්‍යනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ප්‍රාථමික ආර්ථික කටයුත්තක් ලෙස වේවැල් ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාමෙහි මෑත කාලීන ප්‍රවණතාවයයි. ඒ අනුව මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වන්නේ වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත වර්තමානයේ දැක ගත හැකි ප්‍රවණතා හඳුනා ගැනීමයි. මීට අමතරව පර්යේෂණයේ සෙසු අරමුණු ලෙස මෙම ආර්ථික කටයුත්ත ස්ථාන ගත වීමට බලපාන හේතු හඳුනා ගැනීම, මෙම ආර්ථික කටයුත්ත ආශ්‍රිතව වර්තමානයේ පවතින ගැටළු හඳුනා ගැනීම ආදිය මූලික විය. සංස්කෘතික පරිසර විද්‍යාත්මක ප්‍රවේශයකින් සිදු කරන මෙම අධ්‍යනයෙහි මුලික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත භාවිතා කරනු ලැබිණි. එම දත්ත ක්ෂේත්‍ර නිරීක්ෂණ, ව්‍යුහගත හා ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්චා, පොත්පත්, සඟරා හා අන්තර්ජාලයෙහි ප්‍රකාශිත ලිපි ලේඛන මඟින් රැස් කර ගන්නා ලදී. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී නියැදිය ලෙස තෝරා ගනු ලැබුවේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රදාවඩුන්න ග්‍රාමසේවා වසමයි. මෙම අධ්‍යයනය සඳහා මෙම ප්‍රදේශය තෝරා ගැනීමට හේතු වුයේ ශ්‍රී ලංකාවේ වේවැල් ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම පැහැදිලිවම හඳුනා ගත හැකි ප්‍රධානම කලාපයක් වීම නිසාවෙනි. අධ්‍යයනයේ දත්ත විශ්ලේෂණය කිරීමේදී කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් හා විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රම භාවිතා කළ අතර විශ්ලේෂණය කරන ලද දත්ත ප්‍රස්තාර, වගු හා සිතියම් ආදී දෘශ්‍ය ගෝචර මාධ්‍යයන්ගෙන් ඉදිරිපත්කොට ඇත. මෙම පර්යේෂණය අවසානයේ දී වේවැල් නිෂ්පාදන වෙළඳාම ආශ්‍රිත මෑත කාලීන ප්‍රවණතා රැසක් හඳුනා ගැනීමට හැකිවිය. ඒ අනුව මෙම කර්මාන්තයට නුතන දායකත්වය ඉතා මඳ බව, වර්තමානය වන විට පසුබෑමේ ස්වභාවයක් දැකගත හැකි වීම, නිෂ්පාදන විවිධාංගීකරණය වීම හා ආදේශක අමුද්‍රව්‍ය වලින් භාණ්ඩ නිෂ්පාදනය කිරීම යනාදිය ද සෙසු අරමුණු වූ මෙම කර්මාන්ත ශාලාව ස්ථාන ගත වීමට බලපෑ හේතු ලෙස පාරම්පරික නිෂ්පාදන හිමිකමක් පැවතීමත් හා භූමිය ලාභදායී වීමත්, මෙම කර්මාන්තය ආශ්‍රිතව පවතින ගැටළු ලෙස අමුද්‍රව්‍ය හිඟය හා පුහුණු ශ්‍රමය හිඟ වීම යනාදියත් පර්යේෂණය සිදු කිරීමෙන් අනතුරුව හඳුනා ගැනීමට හැකි විය.

***මුඛ්‍ය පද:*** *ප්‍රාදේශීය ආර්ථික කටයුතු, ආර්ථික භූගෝල විද්‍යාව, වේවැල් කර්මාන්තය, වේවැල් ආශ්‍රිත නිෂ්පාදන, ප්‍රාථමික ආර්ථික කටයුතු*

[1] භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, sandeeprathnayaka@gmail.com

# කැලණිය විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ බෞද්ධ අධ්‍යයන විෂයධාරාවන් තෝරාගැනීමේ ප්‍රවණතාව

එම්. ඒ. අයි. යු. විජේතිලක[1]

## සංක්ෂේපය

අධ්‍යාපනයේ මූලික පරමාර්ථයක් වන්නේ වෙනස් වන ලෝකයට යෝග්‍ය පුද්ගලයකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අත්දැකීම් ලබා දීමයි. එහි දී දැනුම, කුසලතා මෙන්ම ආකල්ප සංවර්ධනය කිරීම ද අපේක්ෂා කෙරේ. එකී පරමාර්ථ සාධනය කිරීම සඳහා බෞද්ධ අධ්‍යයන විෂය ධාරාවන්ට හැකියාව පවතී ද යන්න සැළකිය යුතු ගැටළුවක් සමාජයෙහි නිර්මාණය වී ඇත. එහෙයින් අද වන විට සමස්ථ විශ්විද්‍යාලීය පද්ධතියේ ම විද්‍යාර්ථීන් මෙම පාඨමාලාවන් තෝරා ගැනීමේ ප්‍රවණතාවයේ වෙනසක් ඇත. ඉන් කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගේ බෞද්ධ අධ්‍යයන විෂයධාරාවන් තෝරාගැනීමේ ඇති ප්‍රවණතාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අපේක්ෂාව වේ. බෞද්ධ අධ්‍යයන විශයක්ෂේත්‍රයට අයත් වනුයේ පාලි, බෞද්ධ දර්ශනය හා බෞද්ධ සංස්කෘතිය යන පාඨමාලාවන්ය. මෙම පාඨමාලාවෝ අතීත විද්‍යාලංකාර පිරිවෙන මූලික කරගනිමින් නිර්මාණය වී ඇත. මෙම විෂය වර්තමානයේ දී විශ්වවිද්‍යාල පාඨමාලාවෝ දක්වා ම සංවර්ධනය වී ඇති බව දැක ගත හැකිය. එකී අභිමානවත් ගමනේදී තවත් බොහෝ පාඨමාලාවන් විශ්වවිද්‍යාල විෂය ක්ෂේත්‍රයට එකතුවන්නට විය. මෙම අධ්‍යයන කාර්යයෙහි ලා කැලණිය විශ්වවිද්‍යාල කලා පීඨයේ විද්‍යාර්ථීන්ගෙන් අහඹු ලෙස තෝරාගත් නියදියක් භාවිත කරමින් ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස් කර විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක සංඛ්‍යාන විශ්ලේෂණ ක්‍රම හා දත්ත නිරූපණය සඳහා ප්‍රස්තාර වර්ග භාවිත කරන ලදී. රැකියාවක් නොලැබේයැයි සිතා තෝරා නොගත් පිරිස 50% පමණ වන අතර මෙම විෂයන් පිළිබඳ සමාජ ගතවී ඇති සෘණාත්මක දෘෂ්ටිකෝණය නිසා තෝරා නොගත් පිරිස 30% පමණ වේ. තෝරාගැනීමට ඇති විෂය ප්‍රමාණය පුළුල්වීම නිසා තෝරා නොගත් පිරිස 10% පමණ වන අතර බෞද්ධ අධ්‍යනයේ දී භාවිත වන පෙරදිග භාෂාමය ගැටළු නිසාවෙන් තෝරා නොගත් පිරිස 10%ක් වේ. උක්ත ප්‍රතිශතයන්ට අනුව වේගයෙන් දියුණුවන ලෝකයේ ඇති වන තරඟකාරිත්වය නිසාවෙන් රැකියාවක් ලබාගැනීමේ සම්භාවිතාවය හේතුකොට ගෙන බෞද්ධ විෂයයන් අධ්‍යයනයෙන් වැඩිපිරිසක් වැළකී ඇති බව අනාවරණය විය. එසේ අධ්‍යයනය කිරීමෙන් රැකියාවක් නොලැබී යාහැකි බවට ඔවුන් ගොඩනගාගත් අනිසි බිය සහ සමාජ රැල්ල නිසාවෙන් බෞද්ධ අධ්‍යයන විෂයයන් තෝරා නොගන්නා බව මෙහි දී හඳුනාගත හැකි විය.

***මුඛ්‍ය පද :*** *කැලණිය විශ්වවිද්‍යාලය, පාලි, බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය*

[1] පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, inderjith1995@gmail.com

# ළමා අපයෝජනය කෙරෙහි බලපානු ලබන සමාජමය හේතු පිළිබඳ අධ්‍යයනය (මාතර තොටමුණ වෙරළ ආශ්‍රිත ප්‍රදේශය ඇසුරින්)

ඒ. එන්. දිල්ෂාරි[1]

## සංක්ෂේපය

සමාජීය විසංවිධානාත්මක තත්ත්වයත් සමාජ චර්යාවන්හි ඇති වන විපර්යාසයන් හමුවේ ළමා සුරක්ෂිතතාවය ගිලිහී යයි. ළමා සුරක්ෂිතතාවය ගිලිහී යාමත් සමඟම ළමුන් දැඩි පීඩනයට ලක්වන අතර ම ළමා අපයෝජනයට ලක්වනු ඇත. ළමා වයසට නොගැලපෙන්නාවූ ගෘහ සේවය,මෙහෙකාර සේවය, මත්ද්‍රව්‍ය භාවිතය, මත්ද්‍රව්‍ය වෙළදාම ආදිය සඳහා යොදා ගැනීම ඇතුලු කාර්යයන්ට යොමු කරවා ගැනිමේ ප්‍රවණතාවයක් මතුවෙමින් ඇත. ළමා අපයෝජනයට බලපාන සමාජමය හේතු සාධක ශ්‍රි ලංකාව තුළ මුල්බැසගත් ගැටලුකාරි තත්ත්වයකි. මෙහිදි අධ්‍යයන ගැටලුව බවට පත්වූයේ වෙරළ ආශ්‍රිත ජිවත්වන දරුවන් වැඩි වශයෙන් ළමා අපයෝජනයට ලක්වන්නේ ඇයිද යන්නයි. දිර්ඝ කාලයක් මුළුල්ලේ ධීවර ක්ෂේත්‍රයන් තුළ උච්චතම තලයක පැවති ප්‍රශ්නයක් ලෙස ළමා අපයෝජනය කෙරෙහි ධීවර සමාජය තුළ උද්ගත වූ තත්ත්වයන් අධ්‍යයනයට ලක්කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. මෙම අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබුවේ මාතර තොටමුණ වෙරළ පාර ආශ්‍රිත ප්‍රදේශයයි. පවුල් දෙසීය හතළිස් නවයක් පමණ වන මෙහි ජනගහනය එක්දහස් දෙසීයක් පමණ වේ. ක්ෂේත්‍රයට ළඟාවිය හැක්කේ මාතර නූපේ හන්දියෙන් දකුණු දෙසට ඇති මාර්ගය හරහාය. එතැන් සිට කිලෝමීටර තුනක් පමණ ඉදිරියට ගියවිට අදාළ ක්ෂේත්‍රය හමුවේ. උප අරමුණු ලෙස දෙමාපියන්ගේ අඩු අධ්‍යාපන තත්ත්වය හා අඩු ආදායම් තත්ත්වය අපයෝජනයන්ට ලක්වීම අතර සබැඳියාව හා දෙමාපියන්ගෙන් දරුවන් ඈත්වීමත් නොගැලපෙන මිතුරු මිතුරියන් ඇසුර හා සම වයස් කණ්ඩායම්වල ඇසුර අධ්‍යයනය කිරිමයි. පර්යේෂණ ක්‍රමවේදය වූයේ වෙරළ පාරේ පවුල් අතරින් පවුල් විසිපහක් අහඹු ලෙස තෝරා අධ්‍යයනයට ලක් කරන ලදී. දත්ත රැස් කර ගැනිම සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත භාවිත කරන ලදී. පර්යේෂකයාගේ නිරික්ෂණත්, අවිධිමත් සම්මුඛ සාකච්ඡා මඟින් ලබා ගත් දත්තයන් හා විහාරස්ථානය හා මාතර පොලිස් ස්ථානය ඇසුරු කරමින් දත්ත ලබා ගන්නා ලදී. ද්විතියික දත්ත වශයෙන් පොලිස් වාර්තා අධ්‍යයනය කරන ලදී. තෝරා ගත් පවුල් විසිපහ අතරින් පවුල් අටක දරුවන් ළමා අපයෝජනයට ලක්ව ඇතිබවත් එයින් දරුවන් දෙදෙනෙකුගේ දෙමාපියන් වෙන්ව ජීවත්වන අතර බහුතර දරුවන් සමවයස් මිතුරන් හා කල්ලි වශයෙන් එක්ව ක්‍රියාකිරිමට යොමු ව ඇති බවත් දරුවන්ගේ දෙමාපියන් අඩු අධ්‍යාපනයක් ලැබූවන් බවත් දරුවන් ද ඉගනුමට මැළි බහුතරය දහම් පාසල් නොයන දරුවන් බවට ද හෙළිවිය. සමාජය තුළ උද්ගතවෙමින් පවතින ගැටලුවක් ලෙස ළමා අපයෝජනය අවම කරගැනියමට දැනුවත්භාවයක් ලබා ගැනිමට හා ඒ වටා ගොඩනැගුණු සමාජ වාතාවරණයන් හඳුනා ගැනිමට මෙම අධ්‍යයනය වැදගත්වනු ඇත.

***මුඛ්‍ය පද:*** *ළමා අපයෝජනයට, සමාජ; සුරක්ෂිතතාවය, දරුවන්, අධ්‍යයනය, වෙරළ*

---

[1] දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nadeeadassuriya96@gmail.com

# සමාජජාලා මාධ්‍ය, විද්‍යාර්ථයින්ගේ අධ්‍යාපනය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම

ඒ. එච්. එම්. අයි. පී. අබේරත්න[1]

**සංක්ෂේපය**

වත්මන් සමාජයේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පවතින නව්‍යකරණයත් සමගම සමාජජාලා මාධ්‍ය භාවිතා නොකරන්නෙකු සොයා ගැනීම පවා අපහසුය. ඒ අතුරින් විශ්වවිද්‍යාල සිසුවා සමාජ මාධ්‍ය භාවිතා කරන්නේද, ඒ කුමන කටයුතු අරඹයාද යන්න සොයා බැලීම මේ පර්යේෂණයේ අරමුණ විය. මෙම පර්යේෂණය කැලණිය විශ්වවිද්‍යාලය තුළ සිදු කරන ලදී. මෙහිදී කොටස් නියැදීම භාවිතා කර විද්‍යාර්ථයින් 100කගෙන් සමන්විත නියැදියක් පර්යේෂණය සඳහා යොදාගත් අතර ඔවුන්ට ප්‍රශ්නාවලියක් ලබාදීම මගින් අවශ්‍ය දත්ත රැස් කරගන්නා ලදී. මෙහිදී රැස්කරගත් දත්ත විශ්ලේෂණයට වගු හා ප්‍රස්තාර භාවිතා කරන ලදී.මෙම පර්යේෂණයේදී අනාවරණය වූ කරුණු නම් විශ්වවිද්‍යාලය සිසුන්ගෙන් 82%ක ප්‍රතිශතයක් සමාජජාලා මාධ්‍ය පරිශීලනය කරනු ලබන්නේ විනෝදාස්වාද කටයුතු සඳහා Face book,You tube, instergram යන සමාජ මාධ්‍ය විද්‍යාර්ථයින් විසින් විනෝදාස්වාදය සඳහා යොදා ගනී. විද්‍යාර්ථයින්ගෙන් 18%ක් වැනි කුඩා ප්‍රතිශතයක් පමණක් අධ්‍යාපන කටයුතු සඳහා සමාජජාලා මාධ්‍ය භාවිතා කරනු ලබන බවයි. ඔවුන්ගේ ඇගයීම් වලට අදාළ තොරතුරු, විෂයන් සඳහා අදාළ තොරතුරු ආදිය ලබා ගැනීමට මේ ආකාරයට සමාජ මාධ්‍ය භාවිතා කරනු ලබයි. මෙහිදී අනාවරණය වූ තවත් කරුණක් වන්නේ විද්‍යාර්ථයින් සමාජ මාධ්‍යවල ගත කරන කාලය වැඩි වීම හේතුවෙන් ඔවුන්ට සිය පවුලේ සමාජිකයින් සමග අඩු කාලයක් ගත කිරීමට සිදුවන බවයි. ඔවුන්ගේම මතයට අනුව ඔවුන් හුදකලා වේ. මේ අනුව සමාජජාලා මාධ්‍ය භාවිතා කිරීමේදී විනෝදාස්වාදයට පමණක් නොව එය අධ්‍යාපන කටයුතු සඳහාද යොදා ගන්නේ නම් එය අනාගත සාර්ථකත්වය උදෙසා බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

***මුඛ්‍ය පද :*** *විද්‍යාර්ථයින්, සමාජජාලා*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ahmiprarthana@gmail.com

# සමාජජාල මාධ්‍ය භාවිතය විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන කටයුතු කෙරෙහි ඇති කරනු ලබන බලපෑම (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

ජේ. ඒ. එන්. දිල්රුක්ෂි[1]

## සංක්ෂේපය

වර්තමානය වන විට සමාජජාල මාධ්‍ය භාවිතය සමාජයේ විශාල කතිකාවතක් නිර්මාණය කිරීමට සමත්ව ඇති මාතෘකාවකි. සමාජජාල මාධ්‍ය භාවිතය කෙරේ වැඩි වශයෙන් නැඹුරුව ඇත්තේ නව යොවුන් හා තරුණ ප්‍රජාවයි. සමාජජාල මාධ්‍ය භාවිතය විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන කටයුතු හා හැසිරීම් රටාව කෙරෙහි අතිමහත් බලපෑමක් ඇති කරන බව පොදු මතයයි. සමාජජාල මාධ්‍ය භාවිතය විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්ගේ අධ්‍යයන කටයුතු කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පිළිබඳ සොයා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. මේ සඳහා කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා, කළමණාකරණ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා යන පීඨයන්හි සියලුම වසර වල විද්‍යාර්ථයින්ගෙන් ස්තෘත සසම්භාවී නියැදීම යටතේ විද්‍යාර්ථයින් 100ක නියැදියක් තෝරා ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය හරහා ප්‍රාථමික දත්ත රැස්කර විශ්ලේෂණය කරන ලදී. රැස්කර ගත් දත්ත විශ්ලේෂණය සඳහා සහසම්බන්ධතාවය යොදාගත් අතර දත්ත නිරූපණයට වගු, වට ප්‍රස්තාර, තීර ප්‍රස්තාර ආදිය යොදාගෙන ඇත. විශ්ලේෂිත දත්ත අනුව නියැදියෙන් 98%ක්ම කුමන හෝ සමාජජාල මාධ්‍යයක් භාවිත කරන බවත්, ඔවුන් ඒ සඳහා දිනකට පැය 2-4ත් කාලයක් වැය කරන බවත් දත්ත විශ්ලේෂණය හරහා අනාවරණය විය. දහවල් කාලයේ හා රාත්‍රී කාලයේ සමාජජාල මාධ්‍ය භාවිතය වැඩි වශයෙන් සිදු කරන බවත් මෙහිදී තවදුරටත් අනාවරණය විය. අධික ලෙස සමාජජාල මාධ්‍ය භාවිත කිරීම හරහා අධ්‍යාපනය සඳහා පවතින උනන්දුව අඩු වී ඇත. මෙම ඇබ්බැහි තත්ත්වය අවම කිරීමට සමාජජාල වෙබ් අඩවිවලට පිවිසීම සඳහා සීමා පැනවීම යෝජනා කළ හැකිය.

***මූඛ්‍ය පදඃ*** *කැලණිය විශ්වවිද්‍යාලය, සමාජ ජාල මාධ්‍ය, විද්‍යාර්ථයින්*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nawodadilrukshi92@gmail.com

# ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ගැටළුවේ ඉතිහාසය සහ කාලීන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා ලේඛන ඇසුරෙන් කරන ලද පර්යේෂණයක්

ඩබ්. ජී. ඩී. ඩී. එන්. වීරකෝන්[1]

## සංක්ෂේපය

මත්ද්‍රව්‍ය ගැටළුව වර්තමානය වන විට ශ්‍රී ලංකාවට ප්‍රබල අභියෝගයක් වී තිබේ. 2017 වර්ෂයේ දී මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා අත්අඩංගුවට පත් මුළු පුද්ගල සංඛ්‍යාවෙන් ගංජා ආශ්‍රිත වැරදි සඳහා 63.8%ක් ද හෙරොයින් වැරදි සඳහා 36% ද වේ. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ලක් වූ පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරයක් බස්නාහිර පළාතෙන් ද (61%) දකුණු පළාතෙන් ද (9%) මධ්‍යම පළාතෙන් ද (8%)ක් ද වාර්තා වේ. අත්අඩංගුවට පත් මුළු පුද්ගල සංඛ්‍යාවෙන් කොළඹ දිස්ත්‍රික්යේ (38%)ක් ද ගම්පහ දිස්ත්‍රික්කයේ (18%) ක් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ (6%)ක් ද ලෙස වාර්තා වේ. මෙම අත්අඩංගුවට ලක් වූවන්ගෙන් වැඩි පිරිසක් වයස අවුරුදු 15ත් 64ත් වූවන් වන අතර පුද්ගලයන් ලක්ෂයකට 506 දෙනෙකි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රමවේදයේ දී ද්විතීයික දත්ත රැස්කිරීමට අදාළ අධ්‍යයන වාර්තා, පුවත්පත්, ප්‍රකාශිත පොත් සහ ලිපි භාවිත කරයි. අන්තර්ජාල වෙබ්අඩවි ද භාවිත කරන ලදී. මත්ද්‍රව්‍ය ගැටළුවේ කාලීන තත්ත්වය විමසා බැලීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ වැඩිම ව්‍යාප්තියක් සහිත මත්ද්‍රව්‍ය වර්ග පිළිබඳවත් ඒවායේ භාවිත මට්ටම් පිළිබඳවත් මෙහි දී අධ්‍යයනට ලක් කෙරේ. 2013 - 2017 අතර වසර 5ක කාලයක දී එක් එක් මත්ද්‍රව්‍ය වර්ග භාවිතය හේතුවෙන් පළාත් මට්ටමින් අත්අඩංගුවට ලක් වූ පුද්ගල සංඛ්‍යාව පිළිබඳ ව සංඛ්‍යාත්මක විශ්ලේෂණයක් සිදු කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිත ය. වත්මන් ශ්‍රී ලාංකේය මත්ද්‍රව්‍ය ගැටළුව මැඩලීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර මොනවාද යන්න විමසීමට නියමිත ය. මෑත කාලීන වසර 5ක මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීම් සම්බන්ධ සංඛ්‍යා ලේඛන තොරතුරු විමර්ශනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදුකෙරේ. ශ්‍රී ලංකාවේ ප්‍රබල වශයෙන් මත්ද්‍රව්‍ය ජාවාරම සිදුවන්නේ කොළඹ නගරයේ සහ ඒ ආශ්‍රිත ප්‍රදේශවල බව නිගමනය කළ හැකිය.

***මූඛ්‍ය පදඃ*** *අත්අඩංගුවට ලක් වූවන්, නීති විරෝධී, මත්ද්‍රව්‍ය ගැටළුව, ශ්‍රී ලංකාව*

[1] ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dananjanimeshika@gmail.com

# ත්‍රීරෝද රථ අනතුරු සිදු වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

එම්. කේ. ඉසුරු අවිශ්ක[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව ඇතුලු ආසියාතික රටවල වඩාත් ජනප්‍රිය ප්‍රවාහන මාධ්‍යයක් මෙන්ම මෙරට සේවා නියුක්ති අවස්ථාවන් බොහොමයක් නිර්මාණය කර දී ඇති සේවාවක් ලෙස ත්‍රීරෝද රථ භූමිකාව දැක්විය හැකිය. මෙරට ලියාපදිංචි වූ ත්‍රීරෝද රථ මිලියනය ඉක්මවා ඇති මොහොතක රටේ දෙවැනියට වැඩිපුර අනතුරු සිදුවී ඇත්තේ ත්‍රීරෝද රථ අනතුරුය. එසේම යතුරුපැදිවලින් සිදුවන අනතුරු මෙන් නොව මෙයින් අනතුරක් සිදුවුවහොත් සිදුවන හානිය වැඩි බව මාධ්‍ය වලින් පමණක් නොව අප විසින්ම සියැසින්ම දැක ඇත. ත්‍රීරෝද රථ අනතුරු ඉහළ යාම ඉතා ප්‍රබල ගැටලුකාරී තත්වයක් බව දැක්විය යුතුමය. රට තුළ ත්‍රීරෝද රථ අනතුරු ඉහළ යාම හා ඉහළ යාමට බලපාන හේතු අධ්‍යයනය මෙහිදී ප්‍රධාන ගැටලුව වේ. මෙම පර්යේෂණය තුළදී ත්‍රීරෝද රථ අනතුරුවලට බලපාන සාධක හා එයින් මිදීමේ තත්වයන් අධ්‍යයනය කිරීම මෙහි අරමුණු වේ. ඒ සඳහා කොළඹ නගරය තුළ ත්‍රීරෝද රථ රියදුරන් 50ක් සම්මුඛ සාකච්ඡා ක්‍රමය හරහා තොරතුරු රැස් කර ගැනීමෙන් හා ශ්‍රී ලංකා පොලිස් රථවාහන මූලස්ථානයේ ත්‍රීරෝද රථ අනතුරු වාර්තා අධ්‍යයනයත්, පුවත්පත්, සඟරා, මාධ්‍ය යන ද්විතීයික දත්ත භාවිතා කරමින් අධ්‍යයනය කරන ලදී. අධ්‍යයනය තුලින් මූලික වශයෙන් හෙළිවූයේ ත්‍රීරෝද රථ වැඩි වීම මත තරගකාරීව මුදල් ඉපැයීමට පෙළඹීමත්, ත්‍රීරෝද රථවල වේගය හා පාලනය කර ගැනීමට ඇති නොහැකියාව මූලිකවම අනතුරුවලට හේතුවන බව අනාවරණය විය. එසේම මීට අමතරව සීමාව ඉක්මවා මඟීන් රැගෙන යාම, බීමත්ව රිය ධාවනය, නීති කඩ කිරීම ත්‍රීරෝද රථ වල පවතින දෝෂ, රියදුරන් මාර්ග නීති පිළිබඳ අවධානයක් යොමු නොකිරීම ආදිය බලපෑම් කර ඇති බව හෙළිවිය. මෙය වළක්වා ගැනීම සඳහා ක්‍රමවත් ත්‍රීරෝද රථ සේවයක් නිර්මාණය කර ඒ සඳහා සියල්ල අඩංගු වන නිශ්චිත බලපත්‍රයක් ක්‍රියාත්මක කිරීම, ත්‍රීරෝද රථ රියදුරන්ගේ අවිධිමත් රිය ධාවනය සඳහා දැඩි නීතිමය පියවර ගැනීම හා ඒ සඳහා දඬුවම් පැමිණවීමේ ක්‍රමයක් පැවතීම අත්‍යවශ්‍ය බව අධ්‍යයනයේදී හෙළිවිය. මේ අනුව රටේ අනතුරුවලට දැඩිව අතවනන සේවාවක් වන ත්‍රීරෝදරථ සේවාවේ ක්‍රමවත්භාවයක් පවත්වා ගැනීමට රටකට ඉතා අත්‍යවශ්‍ය වනවා පමණක් නොව මනුෂ්‍ය වර්ගයාගේ සුබසෙතට උපකාරී වන්නේය.

***මුඛ්‍ය පදඃ*** *ත්‍රීරෝද රථ, අනතුරු, රියදුරන්*

---

1 සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, bandaraisuru418@gmail.com

# විදේශගතවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මුහුණදෙන සමාජ ආර්ථික ගැටළු

යූ.එම්.කේ.නිරෝෂා[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කරන ප්‍රධාන සාධකයක් ලෙසට විදේශ සේවා නියුක්තිය හඳුන්වාදිය හැකිය. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමග විදේශගතවන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රමාණය වර්ධනය විය. අවුරුද්දකට හෝ වැඩි කාලයක් සඳහා රැකියාවක් අපේක්ෂාවෙන් මෙරට සිට වෙනත් රටකට සංක්‍රමණය වීම මෙහිදී සිදුවන අතර වැඩි වශයෙන් මැදපෙරදිග කලාපය සුවිශේෂී වේ. මැදපෙරදිග ප්‍රදේශ ආශ්‍රිතව සිදු වූ තෙල් මිල වර්ධනය වීමත් සමඟ බිහි වූ නව රැකියා කර්මාන්තයන් හි විශාල ශ්‍රම වෙළෙඳපොළ සඳහා අප රටේ වැඩි පිරිසක් මැදපෙරදිග ආශ්‍රිත රැකියා සඳහා යොමුවීම දැකගත හැකිය. මේ සමඟ මෙරටින් විශාල වශයෙන් පුහුණු මෙන්ම නුපුහුණු ස්ත්‍රීන් සහ පුරුෂයන් ද, කාර්මික කම්කරු, රියදුරු, ගෘහ සේවා , ගෘහ පාලිකා, ජුකී මැෂින් ක්‍රියාකරන්නන් වැනි රැකියා අංශ නියෝජනය කරමින් රැකියා අවස්ථාවන් සඳහා කාන්තා පිරිමි විශාල ප්‍රමාණයක් පිටත්ව යනු ලබයි. එදා පටන් අද දක්වා ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කරන, මෙරටට විදේශ විනිමය ගෙන එන ප්‍රධාන ආදායම් මාර්ගයක් ලෙස මෙය පෙන්වාදිය හැකි ය. නමුත් මෙහි දී දැකගත හැකි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මෙයාකාරයට රැකියා සඳහා පිටත්ව යන  ශ්‍රමිකයන් විවිධ අවස්ථාවන්හීදී ගැටලු වලට මුහුණ දීමයි. මේ නිසා ශ්‍රමිකයන් වශයෙන් විදේශගතවන ශ්‍රී ලාංකිකයන්ට ඇතිවන බලපෑම පිළිබඳව අධ්‍යනය කිරීම කාලෝචිතව වැදගත් වේ. උක්ත මාතෘකාවට අදාළ පර්යේෂණ ගැටලුව ලෙස විදේශගතවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මුහුණදෙන සමාජ ආර්ථික ගැටලු මොනවාද? යන්නත්, පරමාර්ථය ලෙස විදේශගතවන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මුහුණදෙන ගැටලු අවම කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීම යන්නත් යොදා ගත්තේය.  මේ සඳහා සිද්ධි අධ්‍යන ක්‍රමවේදය භාවිත කළ අතර නිස්සම්භාවී ක්‍රමයේ සාරත නියදිය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විදේශගතව සිට මෙරටට පැමිණ සිටින පුදගලයින්ගෙන් පිරිමි සහ ගැහැණු  50 දෙනෙකුගේ නියදියක් මේ සඳහා පදනම් කරගත්තේය. එමෙන්ම ප්‍රශ්නාවලි සහ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත දත්තද රැස් කළේ ය. spss පරිගණක මෘදුකාංගය මගින් විශ්ලේෂණය කළ දත්තවලට අනුව නියදියෙන් 42 හෙවත් 84% විවිධ ගැටලුවලට මුහුණපා ඇතිබව නිගමනය කළ හැකි ය. එමෙන්ම මෙමගින් වැඩිලෙස කාන්තාවන් ගැටලුවලට මුහුණපා ඇති බවද දැකගත හැකි වේ. මෙවන් තත්වයක් ඇතිවීම සඳහා සාක්ෂරතාවය නොමැතිවිම , පුහුණුව සහ පලපුරුද්ද නොමැතිකම, භාෂාව හැසිරවීමට ඇති නොහැකියාව යනාදිය බලපා තිබේ. මෙනිසා මෙම ගැටලුවලට පිළියම් ලෙස සේවකයන් බඳවා ගැනීමේ වැඩසටයන  ක්‍රමවත් කිරීම, රැකියා සුරක්ෂිතතාවය ඇති කිරීම, පුහුණු කාලාසීමාවකට පුද්ගලයින් යොමුකිරීම, වැනි ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමුකිරීම සිදුකළ යුතු ය.

***මුඛ්‍ය පදඃ** විදේශගතවන, ශ්‍රමිකයන්, ශ්‍රී ලාංකික*

[1] සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, kamaninirosha1994@gmail.com

# *TOURISM*

# *AND*

# *TRADE*

# A survey on "Satisfaction of International Tourists towards Railway Tourism in Sri Lanka" (With reference to Colombo- Badulla railway.)

D. S. Abeysingha[1], S. W. Ariyarathna, B. G. T. D. Bandara, M. K. I. A. Bandara , G. G. I. D. Basnayaka, D. H. Bopitiya

## ABSTRACT

Tourism is obviously a large income earner in Sri Lanka. Railway tourism is one of the main categories of tourism where people can use train as a transportation method. In Sri Lanka main railway line (Colombo fort – Badulla) is possibly the largest tourists travelling railway line due to its scenic surrounding. Therefore the research is based on the satisfaction of international tourists towards railway tourism in Sri Lanka. The research problem is "Are the international tourists satisfied with railway tourism in Sri Lanka?" The main objective of the research is to find the overall satisfaction of international tourists towards railway tourism in Sri Lanka. The other objectives of the research are to find the impact of "Age, Gender and Region" on the overall satisfaction of international tourists towards railway tourism in Sri Lanka and to find the concurrence between factors of satisfaction towards the preference of railway tourism to other modes of tourism transport. The target population of the research is all the international tourists who travel by train in Sri Lanka and the sample is 120 out of all the international tourists travel by main line. Convenience sampling method used to select the sample. Primary data was collected using questionnaires from international tourists. Data is analyzed using SPSS and MS Excel software through Chi- Square tests, Kendall test and Descriptive statistics methods. Research reveals that European tourists use train to travel in Sri Lanka mostly, the tourists of age category 20 to 35 years are willing railway tourism the most, natural beauty is one of the main reasons that international tourists choose main railway line to travel by train, sanitary facilities, water arrangements and entertaining facilities must be developed and international tourists use the night mail train the least as a transportation method on their journeys. The Chi-square test proves that, there is a considerable impact of "Age, Gender and Region" on the overall satisfaction of international tourists towards railway tourism in Sri Lanka and, Kendall test proves that, there is a concurrence between factors of satisfaction towards the preference of railway tourism to other modes of tourism transport. Therefore it can be concluded that, the overall satisfaction of tourists is "Moderate".

***Key words:*** *Railway tourism, International tourists, Satisfaction*

[1] Department of Social Statistics, University of Kelaniya, inusha1991sewwandi@gmail.com

# Nexus of Tourism and Economi Fluctuations In Srilanka

J. A. M. B. Jayakody[1]

## ABSTRACT

This is study of exploring the nexus between tourism and economic growth in Sri Lanka. Using the annually statics of central bank report. Tourism industry has become the reason for rapid growth in every economy. "A tourist is as an individual who for leisure or other purposes, temporarily leaves the place of residence for being hosted in a destination, activating successive economic effects that are worth investigating," The objective of this is to explore two main elements of Sri Lankan economy. Those are Tourism and Economic growth in Sri Lanka during the period of 1977 - 2018. The is study obtained the relationship between economic growth and tourism earning during 1977-2018. These two variable have long term relationship. As a result of that which is causality between economic growth and tourism earning. Where economic growth only causes to tourism earnings not the other way around. Economic growth hypothesis in the phase of development since the priority of the tourism earnings had been understood only a few years ago. Due to the domestic war situation in the last years until 2009. Sri Lankan economy had become the upper economic growth rate in last years because of the Tourism industry. Easter day attack was the current affect to the economy. That is the affect for the economic growth of Sri Lanka. Obtain of this study of Sri Lankan Economic development that tourism should guide to economic growth in the future. The relationship measured by secondary data. Descriptive statistics were used to analyze the data and it revealed that there was a significant impact of tourism earnings on economic growth in Sri Lanka.

***Key Words:*** *Economic Growth, Sri Lanka, Tourism*

[1] Department of Economics, University of Kelaniya, madhushajayakody@gmail.com

# ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දේශීය ආර්ථිකය වර්ධනය කෙරෙහි දක්වන දායකත්වය පිළිබඳ විමසීමක් කලුතර ප්‍රදේශය ඇසුරින්

ටී. එම්. පෙරේරා[1]

**සංක්ෂේපය**

සංචරණය යනු විශ්‍රාන්තිය, විවේකය හා ආගමික, කුටුම්භ හෝ ව්‍යාපාරික අවශ්‍යතා සඳහා සීමාසහිත කාල පරාසයක් තුළ චාරිකාවේ යෙදීමයි. ලෝක සංචාරක සංවිධානයට අනුව 2018 වසරේ දී ජාත්‍යන්තර සංචාරකයන් බිලියන 1.4ක් සංචාරය කර ඇත. සංචාරක ව්‍යාපාරය ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තුන්වන ස්ථානය හිමි කරගෙන ඇති අතර ගෝලීය සංචාරක ව්‍යාපාරය 4% සිට 5% දක්වා වේගයකින් වර්ධනය වීමක් දක්නට ලැබේ. ආර්ථික වර්ධනය සඳහා විදේශ විනිමය උත්පාදනය, සේවා නියුක්තිය, ප්‍රාදේශීය සංවර්ධනය, රජයේ ආදායම් වැඩිවීම සහ ආර්ථික උත්තේජනය ඇති වීම මගින් දායකත්වය සපයනු ඇත. මේ අනුව මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාව සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත විදේශ විනිමය ඉපයීම 2.6%ක වැනි ඉහළ අගයක් ලබාගෙන ඇත. කලුතර ප්‍රදේශය වර්තමානය වන විට ආගමික, ත්‍රාසජනක, ආයුර්වේද, ස්වභාවික, සංස්කෘතික ආදී විවිධ වූ සංචරණ අත්දැකීම් ලැබීමට රුචිකත්වයක් දක්වන සංචාරකයන්ට ඒ සඳහා අපූර්ව ගමනාන්තයකි. වර්තමානය වන විට මෙම ප්‍රදේශය තුළ අධි සුඛෝපභෝගී හෝටල් රැසක් ඇතුලු නවාතැන් පහසුකම්, සංචාරක නියෝජිත ආයතන රාශියක් ආරම්භ වී ඇත. එසේම අප්‍රකටව පැවති ස්ථාන රැසක් සංචාරක ගමනාන්ත බවට පත් වී ඇත. විරැකියාවෙන් පෙළෙමින් සිටි ප්‍රජාවට රැකියා අවස්ථාවන් මෙන්ම ප්‍රාදේශීය සංවර්ධනයක් සහ යටිතල පහසුකම් වර්ධනය වීමක් ද දැකගත හැක. තවද අනන්තරා, අවානී, තුර්යා වැනි හෝටල් වෙත පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය වර්ධනය වීම ආදී කරුණු තුළින් දේශීය ආර්ථිකය වර්ධනය වීම සඳහා මෙම ප්‍රදේශය තුළ සිදුවන සංචාරක ව්‍යාපාරය තුළින් දායකත්වයක් හිමි වන බව පැහැදිලි වේ. 2020 වන විට සංචාරකයන් මිලියන 4ක සංඛ්‍යාවක් මෙරටට ගෙන්වා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. එහිදී දේශීය ආර්ථිකය වර්ධනය සඳහා කලුතර ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය තවදුරටත් වර්ධනය කිරීම තුළින් එම ඉලක්ක සපුරා ගැනීමට හැකි වේ. මෙම පර්යේෂණය සඳහා විස්තරාත්මක විශ්ලේෂණය භාවිතයට ගත් අතර ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ඇසුරින් ද ද්විතීයික මූලාශ්‍ර ලෙස පොත්පත් සඟරා ඇසුරින් දත්ත ලබා ගන්නා ලදී. මෙම පර්යේෂණය තුළින් කළ නිගමන වශයෙන් සුන්දර මුහුදු තීරයක් සතු බැවින් වෙරළ සංචරණය, ත්‍රාසජනක සංචරණය වැනි සංචරණයන් දියුණු කළ යුතු වේ. තවද ආයුර්වේද සංචරණය සඳහා රුචිකත්වය දක්වන සංචාරකයන්ට ඒ සඳහා සිද්ධාලේප ආයුර්වේද හෝටලය ආදී හෝටල් රැසක් සහ ස්පා ආයතන රැසක් මෙම ප්‍රදේශයේ පවත්වාගෙන යන බැවින් දේශීය සංචාරකයන් ද මෙම සංචාරක නිෂ්පාදන කෙරෙහි ආකර්ෂණය කිරීමට කටයුතු කිරීම හරහා ද ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය තුළින් දේශීය ආර්ථිකය වර්ධනය කර ගැනීම සඳහා මෙම ගමනාන්තයේ දායකත්වය ලබා ගැනීමට අවස්ථාව උදා වේ.

***මුඛ්‍ය පද:*** *ආර්ථිකය, සංචාරක ව්‍යාපාරය, ශ්‍රී ලංකාව, කලුතර, හෝටල්*

[1] පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, tharakaperera9400@gmail.com

# ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ ප්‍රවණතා සහ අභියෝග

ඩී. එස්. අබේසිංහ[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව ඈත අතීතයේ පටන්ම දේශීය මෙන්ම විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණයට ලක් වූ කුඩා සුන්දර දිවයිනකි. වර්තමානයේ ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තය ආර්ථිකයේ විශාලතම අංශ වලින් එකක් මෙන්ම වේගයෙන් වර්ධනය වන ආර්ථික අංශයක් බවට පත් වී ඇති අතර ඇඟලුම් අපනයන හා විදේශ සේවා නියුක්තිකයින්ගේ ආදායමට පසු ශ්‍රී ලංකාවේ තෙවන විශාලතම විදේශ විනිමය උපයන අංශය වී ඇත්තේ සංචාරක කර්මාන්තයයි. මේ හේතුව නිසා මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ වර්තමාන ප්‍රවණතාවන් හා අභියෝග පිළිබඳ අවධානය යොමු කර ඇත. 2008 සිට 2018 දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව හා සංචාරක අධිකාරිය මගින් ප්‍රකාශිත වාර්ෂික වාර්තා සහ පුවත්පත්, අන්තර්ජාල ලිපි මගින් ලබා ගත් දත්ත හා තොරතුරු මෙම අධ්‍යයනය සඳහා ද්විතීයික දත්ත ලෙස යොදා ගත් අතර විස්තරාත්මක සංඛ්‍යානය ශිල්ප ක්‍රම එම දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලදී. 2008 වසරේ 438475 ක් වූ ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් ප්‍රමාණය 2018 වසරේ 2333796 දක්වා වර්ධනය වී ඇත. සංචාරක ඉපැයීම් ද 2008 වසරේ එ.ජ. ඩොලර් මිලියන 342 සිට 2018 වසරේ එ.ජ. ඩොලර් මිලියන 4381 දක්වා විශාල ලෙස ඉහළ ගොස් ඇත. කලාපීය වශයෙන් ගත්විට 2008 වසරේ මෙරට සංචාරය සඳහා වැඩි වශයෙන් සංචාරකයින් පැමිණ ඇත්තේ යුරෝපා කලාපයෙනි. නමුත් වර්තමානයේ මෙරට සංචාරය සඳහා වැඩි වශයෙන් පැමිණෙන්නේ ආසියානු සංචාරකයින් වන අතර 2008 ට සාපේක්ෂව අනෙකුත් කලාප වලින්ද මෙරට සංචාරය සඳහා පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය වර්ධනය වී ඇත. එමෙන්ම 2008 වසරේ පැමිණීම් අරමුණු අනුව විනෝදාස්වාදය සඳහා සංචාරකයින් 73.22% මෙරටට පැමිණ ඇති අතර 2017 එම ප්‍රමාණය 83.94% කි. ඉහත තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය වර්ධනය වීමේ ප්‍රවණතාවක් පවතින බව හඳුනාගත හැකිය. එමෙන්ම ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝග ලෙස සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම, පුහුණු සේවකයින්ගේ අවශ්‍යතාව සහ ශ්‍රම සංක්‍රමණය, ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම සහ කොළඹ හෝටල් සඳහා පනවා ඇති අවම කාමර ගාස්තුව, සංචාරක ව්‍යාපාරයේ උපායමාර්ගික අවධානය ඉහළ, මැද සහ පහළ පෙළ සංචාරකයින් වෙත යොමු කිරීම ආදිය දැක්විය හැකිය. සංචාරක කර්මාන්තය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා ජාතික උරුමයන් සහ පරිසරය ආරක්ෂා කර ගනිමින් ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කළ යුතු වන අතර, ඊට අමතරව යටිතල පහසුකම් සංවර්ධනය මගින් ඒ සඳහා විශාල සහයක් ලබාදිය යුතුව ඇත.

***මුඛ්‍ය පදඃ*** *සංචාරක කර්මාන්තය, ප්‍රවණතා, අභියෝග*

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dinusha1991sewwandi@gmail.com

# සංචාරක කර්මාන්තය, දේශීය කුඩා ව්‍යාපාරිකයින්ගේ පවුල් පරිසරයට බලපෑම් කරන අන්දම පිළිබඳ අධ්‍යයනයක්

යූ. ඩී. එන්. ආරියරත්න[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාව යනු දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත් පාරාදීසයකි. මෙරට ආර්ථිකයේ වර්ධනයට, කුඩා ව්‍යාපාර සංවර්ධනයට මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනයට ද සංචාරක කර්මාන්තය උපකාරී වේ. සංචාරක කර්මාන්තය, දේශීය කුඩා ව්‍යාපාරිකයින්ගේ පවුල් පරිසරයට බලපෑම් කරන අන්දම පිළිබඳ අධ්‍යයනයක් නැමති මෙම පර්යේෂණ නිබන්ධය හික්කඩුව සංචාරක කලාපයේ වවුලගොඩ - බටහිර ග්‍රාම නිලධාරී වසම ආශ්‍රයෙන් සිදුකරනු ලැබූවකි. දේශීය කුඩා ව්‍යාපාරිකයින්ගේ පවුල් පරිසරයට සංචාරක කර්මාන්තය කරනු ලබන බලපෑම් කෙබඳු ද යන පර්යේෂණ ගැටළුව මුල් කරගත් මෙහි ප්‍රධාන අරමුණ වූයේ සංචාරක කර්මාන්තය දේශීය කුඩා ව්‍යාපාරිකයින්ගේ පවුල් පරිසරයට කවර ආකාරයක බලපෑමක් එල්ල කරන්නේ ද යන්න හඳුනාගැනීමයි. සංචාරක කර්මාන්තය කේන්ද්‍ර කොට ගත් කුඩා ව්‍යාපාරිකයින්ගේ පවුල්වල සබඳතා අහිමි වීම හා ඔවුන් පවුලෙන් දුරස් වීම පිළිබඳව අධ්‍යයනය කිරීම, එම කුඩා ව්‍යාපාරවලට පවුලෙන් ලැබෙන සහයෝගය කෙබඳු ද යන්න හඳුනා ගැනීම සහ සංචාරක කර්මාන්තය නිසා දේශීය කුඩා ව්‍යාපාරිකයින්ගේ සාම්ප්‍රදායික පවුල් රටාව වෙනස් වීමකට ලක්වී තිබේ ද යන්න හඳුනා ගැනීම අධ්‍යයනයේ අනු අරමුණු ලෙස ක්‍රියාත්මක විය. දේශීය කුඩා ව්‍යාපාරිකයින් විසිපස් දෙනෙකු අධ්‍යයනයට බඳුන් කරන ලදී. ප්‍රාථමික දත්ත ලබාගැනීමට ප්‍රශ්නාවලි භාවිත කළ අතර ග්‍රන්ථ, සඟරා සහ අන්තර්ජාලය හරහා ද්විතීයික දත්ත එක්රැස් කිරීම සිදු කරන ලදී. ලබාගත් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම SPSS මෘදුකාංගය භාවිතයෙන් සිදුකළ අතර එහිදී හඳුනාගත් ප්‍රධාන නිගමනය වූයේ සංචාරක කර්මාන්තය හේතුවෙන් දේශීය කුඩා ව්‍යාපාරිකයින්ට, ඔවුන්ගේ පවුල් සබඳතා දුරස් වී ගොස් හෝ අහිමි වී ගොස් ඇති බවයි. තවද සංචාරක කර්මාන්තය නිසා සාම්ප්‍රදායික පවුල් රටාව වෙනසකට ලක් වී ඇති බව හඳුනාගත හැකි විය. මේ අනුව දේශීය කුඩා ව්‍යාපාරිකයින්ගේ පවුල් පරිසරයට සංචාරක කර්මාන්තයෙන් එල්ල වී ඇති ප්‍රධානතම බලපෑම වූයේ පවුල තුළ සාම්ප්‍රදායිකව ගොඩනැගී තිබූ පවුලේ සාමූහිකත්වය දෙදරා ගොස් පවුල අනාරක්ෂිත තත්ත්වයකට ලක්වීම බව පැහැදිලි විණි. එබැවින් කුඩා ව්‍යාපාරිකයින්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුරක්ෂිතභාවය හා පැවැත්ම තහවුරුවන අයුරින් විධිමත් රාජ්‍ය ප්‍රතිපත්තියක අවශ්‍යතාවය වැදගත් බව යෝජනා කරන ලදි. තවද කුඩා ව්‍යාපාරිකයින් සිය පවුලෙන් දුරස් වීම වැළැක්වීම සඳහා ඔවුන්ගේ තාවකාලික සේවා ස්ථාන වෙනුවට තම පවුලේ සාමාජිකයින් සමඟම එකට හිඳිමින් තම ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට අවශ්‍ය පහසුකම් ඔවුන් වෙනුවෙන් ලබා දීම සඳහා රාජ්‍ය මැදිහත්වීමක් ද අවශ්‍ය වනු ඇත.

***මූඛ්‍ය පද :*** *පවුල් පරිසරය, සංචාරක කර්මාන්තය, කුඩා ව්‍යාපාරික ප්‍රජාව*

[1] සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, daraniariyarathne@gmail.com